

අළු බදාදා - මාර්තු 05
(එදින එක්වරු ශීලය රැකීම සහ ගොඩමස් වැළකීමේ දිනයකි)



අගරදගුරු පදවි ළමා දිනය මාර්තු 01 සෙනසුරාදා
තේවත්ත ලංකා අප ස්වාමිදූ ජාතික බැසිලිකා භූමියේදී

## ● දේශපාලනයේ හා සමාජයේ සෘජු ස්ථාවරත්වයට ධාර්මික එකමුතුභාවයක් එළිදැක්වේ

**කතෝලික සභාවේ කුමාරවරුන් යැයි දුරාතීතයේ සිට නම් ලද කාදිනල් හිමිපාණන් 18 නමකට හිස් වැසුම් හා නිල මුදු පිරිනමමින් කාදිනල්වර ප්‍රදාන මහෝත්සවයක් වතිකාන සාන්ත පීතර බැසිලිකාවේදී පෙබරවාරි 22 සෙනසුරාදා පැවැත්විණ.**

අති උත්තම ප්‍රැන්සිස් වත්මන් ශුද්ධෝත්තම පියතුමා විශ්‍රාමික අති උතුම් සොළොස්වන බෙනඩික් හිමිපාණන් සමඟ මෙහෙය පැවැත්විය. 98 හැවිරිදි සඟසුව දිනූ අති උතුම් විසිතුන්වන ජුවාම් සසුන් පියාගේ ලේකම් අති උතුම් ලෝරිස් ප්‍රැන්සිස්කෝ කැබෝවිල්ලා හිමි මේ අවස්ථාවට සහභාගි නොවූ අතර උතුරු ඉතාලියේ එතුමන්ගේ නවාතැනේදී අදාළ කටයුතු සිදු කැරේ.

15 පිටුවට »



කාදිනල්වර අභිෂේක මෙහෙයට පැමිණි විශ්‍රාමික අති උත්තම දහසයවන බෙනඩික් සසුන් පියතුමන්ව ආදරයෙන් පිළිගත් මෙහොතේදී...

## පූජක පුතකු වන්නට ඇරියුම්

කොළඹ අගරදගුරු පදවියේ පූජක පුතකු ලෙස සේවය කිරීමට ඔබටත් ආරාධනා. 2015 වසරේදී බොරැල්ල සාන්ත ඇලෝසියස් දෙව්සත්හලට ඇතුළත් වීමට කැමති 08 ශ්‍රේණියේ සහ ඉන් ඉහළ දරුවන් හට මීසම් සේවක පියතුමා මඟින් මාර්තු 03 දා සිට අයදුම්පත් නිකුත් කැරේ. අප්‍රේල් 08 දින අයදුම්පත් භාර ගැනීම අවසාන වේ. **(ගරු අදියුරු පියතුමා)**

## ප්‍රදීප ලේඛක සහෘදයා නික්ම යයි



විශ්‍රාමික මහාධිකරණ විනිසුරු ප්‍රකට කිතුනු ලේඛකයකු වූ ඩබ්. ටී. ජේ. ලෙස්ලි ප්‍රනාන්දු මහතා පෙබ. 23 දා අවසන් හුස්ම හෙළීය.

පෙබ. 25 දා මීගමුව වැල්ලවීදිය සා. සෙබස්තියන් දේවස්ථානයේ දී ඔහුගේ අවසන් කටයුතු සිදුවූ අතර ඔහුට සදා සාමය ලැබේවායි අපි ප්‍රාර්ථනා කරමු.

## කතෝලික වෛද්‍ය, නීතිඥ සුහද හමුව

**කොළඹ අගරදගුරු පදවියේ සියලුම කතෝලික වෛද්‍යවරුන් සහ නීතිඥයින් සඳහා සුහද හමුවක් 2014 මාර්තු 07 වන සිකුරාදා ප.ව. 7.00 ට කොළඹ අගරදගුරු නිවසේ දී අගරදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ. එයට සහභාගි වන ලෙස ගෞරවයෙන් ඇරියුම් කරමු.**
**විමසීම් - ගරු ඇන්ටන් දිනේෂ් පියතුමා 011 2695471-3**

## මහා මරිය දහම් ප්‍රදර්ශනය

**"මහා මරිය දහම් ප්‍රදර්ශනය" 2014 මාර්තු 16 ඉරිදා උදේ 7.30 සිට සවස 7.30 දක්වා වත්තල සා. ආනා දෙව්මැඳුරු පරිශ්‍රයේ දී පැවැත්වේ.**

# පාසල් නොමැතිව කතෝලික දරුවන් රැසක් අතරමං

## ● පාසල් සංවර්ධන සමිතිවල අත්තනෝමතික ක්‍රියාවලියන් මෙයට මුල් වෙලා

2014 වර්ෂය සඳහා නව පාසල් වාරයන් ආරම්භ වී මාසයකටත් වැඩි කාලයක් ගෙවී ගොස් ඇතත් කතෝලික දරුවන් විශාල පිරිසක් පළමු වසරට ඇතුළත් වීමට පාසලක් නොලැබීම හේතුවෙන් නිවෙස්වල රස්තියාදු වෙමින් සිටිති යි ඥානාර්ථ ප්‍රදීපයට වාර්තා වෙමින් තිබේ.

පෞද්ගලික කතෝලික පාසල්, ජාතික පාසල් හා රජයේ පාසල්වල දොරටු වැසී යාම නිසා තම දූ දරුවන්ට තවමත් පාසලක් ලැබී නැති බවට දෙමාපියෝ මැසිවිලි නගති. මේ අතර ඇතැම් කතෝලික පාසල්වල දොරටු කතෝලික දූ දරුවන්ට වැසී ඇතත් අන්‍යාගමිකයන්ට විවෘත වීම නිසා ඒවායේ අන්‍යාගමික ප්‍රතිශතය 20% සිට 30% දක්වා ඉහළ ගොස් ඇති බව ද කියැවේ. විවිධ හේතු දක්වමින් කතෝලික දූ දරුවන් ඇතුළත් කර ගැනීමට කතෝලික යැයි කියාගන්නා පාසල් මැලි වන අතර මෙරට ජාතික පාසල් කතෝලික දූ දරුවන් ඇතුළත් කර ගැනීම දැඩි ලෙස සීමා කර ඇති නිසා

15 පිටුවට »

## සසුන් පිය ලාංකික හමුව රූපවාහිනියේ

**වතිකානයේ සා. පීතර බැසිලිකාවේ දී කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැති දිව්‍ය පූජාවත්, ඉන් අනතුරුව අති උත්තම ප්‍රැන්සිස් සසුන් පියාගේ ශ්‍රී ලාංකික හමුවත් රැගත් විශේෂ වැඩසටහනක් මාර්තු 02 ඉරිදා (අද) ප.ව. 3.00 ජාතික රූපවාහිනියෙන් විකාශය කැරේ.**

## නායකකන්ද කොඩි දිනය

**නායකකන්ද සා. යුප්‍රේසියා නිවාසයේ කොඩිදිනය මාර්තු 05 බැවින් ඒ සඳහා සැදැහැවත් ඔබ සැමගේ සහයෝගය ඉල්ලා සිටිමු.**

**"හෙට දවස ගැන සිතා කරදර නොවන්න" (මතේව් 6:24-34)**

පදවියට

# පවුකාර ජීවිතයට පොළඹවන දේ වලින් අප බැහැරවීමට හිතට ගත යුතුයි

## රත්නපුර රදගුරු හිමිපාණෝ ප්‍රකාශ කරති

**අපගේ ස්වාමීන් වහන්සේ අපට කියනවා පවුකාර ජීවිතයට අපව පොළඹවන යමක් ඇත්ද එය අපතුළින් බැහැරකර යහපත් ජීවිතයක් ගතකිරීමට කිතුනුවන් වශයෙන් අප අදිටන් කර ගත යුතුයි කියා. බුලත්කොහුපිටිය සා. සෙබස්තියන් මුනිඳුන්ගේ දේවස්ථානයේ වාර්ෂික මංගලෝත්සවයේදී රත්නපුර රදගුරු අතිඋතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා (සා.බෙ.නි) හිමිපාණෝ පැවසූහ.**

තවදුරටත් අදහස් දැක්වූ රදගුරු හිමි අපගේ ජීවිත යහපතට පොලඹවන දේවලට වඩා අයහපතට යොමුකරන දේවල් අද වැඩිවී තිබෙනවා. ඒවාට අප සමහර වෙලාවට ගොදුරු බවට පත්වෙනවා. අප නොදැනුවත්වම ඒවාට ඇදී යනවා. අලසකම, අල්ලස් ගැනීම. ප්‍රචණ්ඩත්වය, හොරමැරකම් කිරීම ආදී දේවල්. සමහරවිට හැමදෙනකුම වාගේ මේවාට යොමුවෙනවා. හැමදෙනාම කරනවානම් මම කරපුවහම මොකද කියා හිතනවා. කෙනෙක් හොරකම් කරලා හොඳින් ජීවත් වෙනවා. අපි තමයි මෝඩයෝ. මමත් ඒ වගේ දේවල් කරන්නට ඕනෑ කියා ඒ පාපිෂ්ට වැඩවලට යොමුවෙනවා. එම නිසා පාපිෂ්ට දේවලින් අප ඈත් විය යුතු වෙනවා යැයි පැවසිය.



ජේ. ඇන්තනි

## කංජුක්කුලිය මීසමේ නවෝදයක්!

කංජුක්කුලිය සා. බෙනඩික් දෙව්මැඳුරේ ඉරුදින පූජා යාගයේ කියවීම් සඳහා පැමිණීමේදී ගිහියන් සුදු ඇඳුමින් සැරසී පැමිණීම සුවිශේෂී ලක්ෂණයකි.

මීසම් සේවක ගරු ජූඩ් ඩයස් පියතුමාගේ මඟපෙන්වීම හා අනුශාසකත්වය මත ඉරිදා පූජා යාගයට ඉතා විශාල සැදැහැවතුන් පිරිසක් පැමිණෙති.

ඇම්. ඩබ්. අනුර ශාන්ත පීරිස්

# දෙව්මවුන්සේ දේව කැමැත්තට අවනත වෙමු



දේව විශ්වාසය තුළ ර දෙමින් අපගේ ජීවිත යහ මඟට යොමු කරවීම කිතුනු අපගේ වගකීමයි. පවුලක් ලෙස මීසමක් ලෙස එකමුතු වෙමින් එතුමිය නිරතුරුවම ඉල්ලා සිටින ජපමාලය උච්චාරණය කිරීමෙන්, අපට කළ හැකි උතුම් ගෞරවය එතුමියට පුද කරමු. යැයි අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණෝ පැවසූහ.

එතුමා එසේ පැවසුවේ, කළුතර දිසා ලූර්දු දේව මාතාවන්ගේ 105 වැනි වාර්ෂික මංගල සන්ධ්‍යා මෙහෙයේදීය. මංගල දිව්‍ය පූජා යාගය කොළඹ අගරදගුරු පදවි නැගෙනහිර කලාපයේ දමිල අපෝස්තලික සේවා බාර ගරු කලන පීරිස් පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලදි. කළුතර මීසම් සේවක ගරු සුරාත් අත්තිඩිය පියතුමා ඇතුළු මීසම් ධර්ම සේවා කමිටුව, කළුතර දිසානායක ගරු ජුලියස් තිසේරා පියතුමා ඇතුළු දිසාවේ පියවරුන්ගේ සංවිධානයෙන් මෙම මංගල උලෙළ උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණ.

ඩී. ඇන්සලම් ප්‍රනාන්දු

# ගම්පහ දිස්ත්‍රික් කතෝලික අපේක්ෂක හමුවක් වත්තලදී



මෙවර බස්නාහිර පළාත් සභා මැතිවරණයේදී ගම්පහ දිස්ත්‍රික්කයෙන් තරග කරන කතෝලික අපේක්ෂකයින් පිරිසකගේ සුහද හමුවක් වත්තල සා. ආනා දෙව්මැඳුරු ශාලාවේදී පැවැත්වින. ජාඇල කලාපීය නාහිමි අතිගරු ශාන්තිකුමාර් වැලිවිට පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති මේ හමුවට එක්සත් ජනතා නිදහස් සන්ධානය, එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ සහ ලංකා ප්‍රජාතන්ත්‍රවාදි පක්ෂය නියෝජනය කරන කතෝලික අපේක්ෂකයෝ 18 දෙනෙක්ද කතෝලික පූජක තුමන් 13 දෙනෙක්ද සහභාගි වූහ.

පසුගිය බස්නාහිර පළාත් සභාවේ වගකිව යුතු අමාත්‍ය ධූරයක් ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන කතෝලික මන්ත්‍රිවරයකුට ලැබීම ගැන තමන් සතුටටත් ආඩම්බරයටත් පත්වන බවද මෙවර මැතිවරණයේදී එම අමාත්‍ය ධූරයද ලබාගනිමින් කතෝලික මන්ත්‍රිවරුන්ගේ සංඛ්‍යාවද තවත් වැඩිකර ගැනීමට උත්සහ කළයුතු බවද අපේක්ෂකයෝ සඳහන් කළහ.

එකිනෙකා ඇණකොටා ගන්නේ නැතිව මැතිවරණ නීති කඩන්නේ නැතිව සාමකාමීව හා සාධාරණව තම මැතිවරණ ව්‍යාපාරයේ නිරතවෙමින් අනෙකුත් අපේක්ෂකයින්ට ආදර්ශයක් දෙන අන්දමින් කටයුතු කිරීමට සෑම කතෝලික අපේක්ෂකයකුම අදිටන් කරගත යුතු බවත් තමන් අයත්වන දේශපාලන පක්ෂයට වඩා කතෝලික කමට මුල්තැන දීමට ඔවුන් උනන්දු විය යුතු බවත් මෙහිදී පූජක තුමෝ පෙන්වා දුන්හ.

මෙම සුහද හමුවේ සම්බන්ධීකාරකවරයා වශයෙන් කටයුතු කල බස්නාහිර පළාත් සභාවේ හිටපු අමාත්‍යවරයකුවූ ලෝරන්ස් මාදිවල මහතා ස්තුති කතාව පැවැත්විය.

නිමල් පෙරේරා

## කිතු යාත්‍රා සඳහා නිර්මාණ එවන්න

කිතු යාත්‍රා නව ලේඛක සංසදයේ ප්‍රකාශනයක් වන 'මරණයේ අඳුර බිඳ ජීවිතයට එතෙර වීම' තේමා කරගත් කිතු යාත්‍රා පාස්කු වාර්ෂිකයේ 8 වෙනි කලාපය මෙවරත් එළිදැක්වේ.

ඒ සඳහා පාස්කුව හා සබැඳි කාලීන මාතෘකා ඔස්සේ ඔබ ලියූ ගද්‍ය, පද්‍ය (සඳැස්/නිසඳැස්) චිත්‍ර ආදි නිර්මාණ මාර්තු 15 දිනට ප්‍රථම ඇන්ටන් ජයසූරිය සම සංස්කාරක කිතු යාත්‍රා පාස්කු වාර්ෂිකය නො. 255/B සාම මාවත බෝපිටිය, පමුණුගම යන ලිපිනයට යොමු කරන්න.



ලුණුපොකුණ නව මීසම් සේවක ගරු සුදත් ජයලාල් සිල්වා පියතුමා දහම් පාසල් දරුවන් දෙදෙනෙකු පිළිගත් අවස්ථාවයි මේ. හිටපු මීසම් සේවක ගරු රාජ් සිල්වා පියතුමා ද මෙම අවස්ථාවට සහභාගි විය.

කමල් සිල්වා

# ගෝනවිල මීසම අධ්‍යාත්මික නවෝදයකට සැරසෙයි

දංකොටුව ගෝනවිල ශුද්ධ වූ ජුසේ මුනිඳුන්ගේ දෙව්මැඳුරේ 143 වන සංවත්සරය වෙනුවෙන් ධර්ම විවේකයක් සූදානම් කර ඇත. එම වැඩසටහන පෙබරවාරි 18 දින සිට මාර්තු 09 දින දක්වා පැවැත්වේ.

හලාවත රදගුරු අතිඋතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ගේ උපදෙස් හා මඟපෙන්වීම මත ගෝනවිල මීසම් සේවක හා බෝලවත්ත දිසානායක ගරු සිල්වෙස්ටර් විජයකුලසූරිය පියතුමන් විසින් සේවක මණ්ඩලයේ සහයෝග යෙන් ආරම්භකර ඇති මෙම වැඩසටහන වෙන්නප්පුව නාසරෙත්හි නිමලමරිය නිකායික ගරු පියතුමන් විසින් මෙහෙයවනු ලබයි. මීසමේ සෑම නිවසක් බැහැදැකීම සහ කොට්ඨාස මට්ටමින් දිව්‍ය පූජා සිදුකිරීමටද කටයුතු කර ඇත.

ඩබ්. ඇන්ටන් ජෙරාඩ් ප්‍රනාන්දු

# සැබෑ එතෙරවීමකට සූදානම් වෙති

හංවැල්ල මීසමේ අළු බදාදා සිට චතාරිකයට සූදානම් වීම සඳහා දින හතලිහ පුරාවටම එක් දිනයකට මීසමේ දේවස්ථාන සතරක දිව්‍ය පූජාවන් එක බැගින් පැවැත්වීමට කටයුතු පිළියල කර ඇත්තේ සෑම අයකුටම සහභාගි වීමට හැකි වන පරිදෙනි.

මෙහි අරමුණ අර්ථවත්වූ පාස්කු මංගල්‍යයකට ජනතාව සූදානම් කිරීම බව එහි නියමු හංවැල්ල මීසම් සේවක ගරු ගියොම් නෝනිස් පියතුමා සහ සහයක ගරු රෝෂාන් චමින්ද යන පියවරු පවසති.

ඇන්තනි හෙට්ටිආරච්චි



තේවත්ත ලංකා අප ස්වාමිදු වාර්ෂික මංගල්‍යය අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. එහිදී තේවත්ත සිද්ධස්ථාන වෙබ් අඩවිය සහයක රදගුරු හිමි ආරම්භ කළ අයුරු.

එච්. ඒ. කල්දේරා



ප්‍රංශයේ පැරිස් කිතුනු සංසය 66 වෙනි නිදහස් උලෙළ පැරිස් නුවරදී පැවැත්විය. පැරිස් කිතුනු සංසයේ උපාධ්‍ය ගරු රෝයි ක්ලැරන්ස් පියතුමා ශ්‍රී ලංකා තානාපති කරුණාරත්න හඟවත්ත මහතා සහ කිසා ගෝතමී සරත්චන්ද්‍ර මැතිණියද ආරාධිත අමුත්තන් ලෙස සහභාගි වූ එම උත්සවයේදී කිතුනු සංසයේ ලේකම් බෙනට් සමරකෝන් මහතා පොල්තෙල් පහන දැල්වූ මොහොත.

ප්‍රියංගා රාමනායක



ජාතික කතෝලික ලේඛක හවුලේ වාර්ෂික සාහිත්‍ය දින උලෙළේදී ඇතුගල්පුර රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන්ගේ විශේෂ සම්මානය කුරුණෑගල බී. කේ. ටී. රෙජිනෝල්ඩ් මාධ්‍යවේදියාට ජනසංනිවේදන ජාතික අධ්‍යක්ෂ ගරු බෙනඩික් ජෝශප් පියතුමා පිරිනැමූ අයුරු. සභාපති පීටර් කැනියුට් හා ලේකම් මැක්ෂිමස් රෝයි මහත්වරුද මෙහි වෙති.

## ආදි සිසු හමුවක්

හලාවත සා. මරියා මහා විද්‍යාලයේ ආදි සිසුන්ගේ 81 වන වාර්ෂික මහා සභාව විදුහල්පති ගරු සදලාල් සහෝදරතුමාගේ ප්‍රධානත්වයෙන් හලාවත සා. මරියා මහා විද්‍යාල ශ්‍රවනාගාරයේ 2014 මාර්තු මස 1 වන සෙනසුරාදා සවස 5.00 ට පැවැත්වේ.

පර්සි ප්‍රනාන්දු

ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586

ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.com

ක්‍රිස්තු වර්ෂ 2014 මාර්තු 02 ඉරිදා

# පාසල් නොමැතිව කතෝලික දරුවන් ගෙදර ඉන්නේ ඇයි?

2014 වසරට පාසල් වලට තම දරුවන් ඇතුලත් කිරීමට නිසි අයුරින් ඉල්ලුම් කළත් තම අපේක්ෂාවන් අනුව පාසල් නොලැබී තවමත් තම දරුවන් ගෙදර අතරමංව සිටිනා බව දක්වමින් ඥානාර්ථ ප්‍රදීපය පුවත්පතට චෝදනාත්මක ස්වරූපයෙන් දෙමාපියන්ගෙන් ලැබෙන ලිපි වල ප්‍රමාණය ඉහළ යමින් පවතී. මේ පිළිබඳව අද මුල් පිටුවේ විශේෂ ප්‍රවෘත්තියක් පළවේ. මෙය ඇත්තෙන්ම විමසිය යුතු කරුණකි. පෞද්ගලික පාසල් යාන්ත්‍රණය තුළ මෙන්ම ජාතික පාසල් යාන්ත්‍රණය තුළද පවත්නා අධිකතර ඉල්ලුම් සැපයුම් ක්‍රියාවලිය මත නිසි පරිදි එය කළමනාකරණය කිරීමේ ක්‍රමවේදය විධිමත් කිරීමේ අසීරුතාව ගැන නම් අමුතුවෙන් කිව යුතු නැත. පංති කාමරයක සීමිත සිසුන් සංඛ්‍යාවක් පමණක් සිටිය යුතුයැ යි පවසන රජයේ නිර්දේශ හමුවේද, වසරින් වසර එක් එක් පාසල් සඳහා සීමිත ඉල්ලුම්පත් වල සංඛ්‍යාව ඉහළ යාම හේතුකොට ගෙන ද විදුහල්පතිවරුන් මුහුණ දෙන ගැටලුව ගැන හොඳ අවබෝධයක් කා තුළත් පවතී. නමුත් තරගකාරී වාතාවරණයකට හා මුදල් මත යැපෙන ක්‍රමවේදයකට අද අධ්‍යාපනය වැටී ඇති නිසා දෙමව්පියන් කල්පනා කරන අයුරින් ක්‍රියාත්මක වීම පිළිබඳව ඔවුන්ගේ පැත්තෙන් සාධාරණීකරණය කරන කරුණු කාරණාවලත් සත්‍යතාවක් ගැබ්ව පවතී. නමුත් දැනට පවත්නා පෞද්ගලික හා ජාතික පාසල් මෙන්ම රජයේ අනෙක් පාසල් සඳහා සිසුන් ඇතුලත් වීමට ඉල්ලුම් කළත් සැම වසරකම සැලකිය යුතු සිසුන් සංඛ්‍යාවක් සඳහා පාසල් නොමැතිව එම සිසුන් පළමු පාසල් වාරයක් නිකරුණේ ගෙදරම ගත කරන තත්ත්වයක් උද්ගතවී ඇත. එහිදී කතෝලික පාසල් ගණනාවක් තිබුනත් ඒ පරිසරය තුළම පාසලක් නොමැතිව කතෝලික දරුවෙක් නිකම්ම ගෙදර සිටී නම් තත්ත්වය බැරෑරුම්ය. එලෙසම එම දරුවන්ගේ දෙමව්පියන් දේවස්ථානයේ හා මීසමේ ක්‍රියාකාරී ක්‍රියාධරයන් වී ඔවුන්ගේ සම්පූර්ණ සේවා දැක්ම දහම වෙනුවෙන් කැපකර තිබියදීත් තම දරුවන්ට පාසලක් නොමැතිව කළකිරී වේදනාබරිතව සිටී නම් තත්ත්වය සැබවින්ම ශෝකාකූලයි. ඛේදනීයයි.

කතෝලික දරුවෙක් හට පිළිගත් අන්‍යාගමික පාසලකට ඇතුලත් වීමට වඩා ඔටුවෙකුට ඉදිකටු මලකින් රිංගා යෑම පහසුය. කතෝලික විශ්වාසය නිසා රජයේ සියළුම ආධාර ලබන විශාල යයි සම්මත පිළිගත් විදුහල්වලට ඒ කිසිම දරුවකුව ඇතුළත් කර නොගනී. ප්‍රතිශතයේ මොන ප්‍රමිතිකරණයක් තිබුනත් ඒ සියල්ල අහෝසි කරමින් කිසිම කතෝලික දරුවෙකුට ඒ පාසල් වලට ඇතුළු වීමට තිබෙන සියළු ඉඩකඩ අහුරා ඇත. තත්ත්වය එසේ තිබියදී කතෝලික පාසල් වල පවා දොරගුළු කතෝලික දරුවන් වෙනුවෙන් වැසීයාමේ ඛේදවාචකය සැබවින්ම කතිකාවකට මුල් විය යුතුයි. අපේ කතෝලික පාසල් වල අන්‍යාගමික ප්‍රතිශතය දැන් සියයට 25 සිට 30 දක්වා ඉහළ ගොස් ඇති බවට යම් යම් සාක්ෂි ද ඇත. දේශපාලන බල අධිකාරීන්ගේ විවිධ බලපෑම් හමුවේද වසරින් වසර කතෝලික පාසල් වල අන්‍යාගමික ප්‍රතිශතය ඉහළ යමින් පවතී. ඒ අතර කතෝලික පරිසරයේම හැදී වැඩී ආගම දහම නිසාම අන් පාසල් වල දොර'ගුළු වැසී තිබෙන තත්ත්වය මත මෙන්ම කතෝලික පාසල් වල විදුහල්පතිවරුන්ගේ සිතා බැලීමේ අවකාශයද මන්දගාමී වීමේ ප්‍රතිඵල මතද මේ කතෝලික දරුවන් වැටී ඇති තත්ත්වය ගැන නැවතත් සිතා බැලිය යුතු බව දැඩිව අවධාරණය කරමු.

පියතුමන් හෝ පැවිදි සොයුරු සොයුරියන් එම දරුවන් සඳහා බොහෝ විට මැදිහත් වන්නේ එම පවුල් වල පසුබිම් ද, දෙමාපියන්ගේ කැපවීම් ද, ආගම දහමට ඇති පක්ෂපාතිත්වය ද සලකා සැබවින්ම එහිලා ප්‍රතිඋපකාර හැටියට හෝ ඇගයීමක් තුළින් එම දරුවන්ට ආධාර වීමටයි. උපකාර කිරීමටයි. නමුත් එම ඇගයීම් පවා අද කතෝලික පාසල් වල විදුහල්පතිවරුන්ගේ අවධානයට යොමු නොවී ඇත්තේ මන්ද යන්න නම් විමතියකි. තවත් කරුණු කාරණා එහි පසුබිම් වල තිබිය හැකි මුත් ඒවා සොයා විමර්ශනය කිරීම මෙහිදී අරමුණ නොවේ.

නමුත් කතෝලික පාසල් වල මූලිකම අපේක්ෂාව අධ්‍යාපනය තුළින් කතෝලික අධ්‍යාත්මය පුබුදුවා ලීමේ ක්‍රියාමාර්ගය පමණක් නම් අන් සියල්ලම ඊට දෙවෙනි වන්නේ නැද්ද? පාසල් වල සංවර්ධන කමිටු වල ඉන්න අතලොස්සක් දෙමාපිය ක්‍රියාධරයන්ට මෙය පහදා දිය යුතුයි. මුදල නොව ආගමේ ඇති වටිනාකම මේ සියළු දෙනා වටහා ගන්නේ නම්, ආගමික අධ්‍යාපනයේ අභිලාෂය අවබෝධකර ගන්නේ නම් කතෝලික පෞද්ගලික, ජාතික හා රජයේ පාසල් වල අපේ කතෝලික විදුහල්පති කාරකාදීන් මීට වඩා සැලකිලිමත් වී පාසල් නොමැතිව තවමත් ගෙදර ඉන්නා ඒ කතෝලික දරුවන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීමට තවමත් ප්‍රමාද නැති බව මතක් කරන්නෙමු.

# මුහුණු පොත ජීවිත අවලස්සන කරයි ද?

මාස තුනක් ඇතුළත ශ්‍රී ලංකාවේ කාන්තාවක් හා සිසුවියන් දෙදෙනෙක් මුහුණු පොත (ෆේස් බුක්) කරණකොට ගෙන දිවි නසා ගත්හ. අසල්වැසි ඉන්දියාවේ ඇමැති බිරියක හෝටල් කාමරයකදී සිය දිවි හානි කර ගත්තාය. ලෝකයේ විවිධ රටවලින් මෙවැනි සිදුවීම් පිළිබඳව වාර්තා වන විට එතෙර රටක මවක බඩගිනිවී හඬා වැටුනු දරු සිඟිත්තා මරා දැමුයේ ඇය මුහුණු පොතේ සැරිසරන අතරතුර සිඟිත්තා ඇයට වදයක් වූ නිසාය. තවත් අවස්ථාවක සැමියා සිය බිරිය මරා දැම්මේ ඇය සිය මුහුණු පොතේ ඇති ගිණුමේ අවිවාහක යැයි දක්වා තුබූ නිසාවෙනි. එක්සත් රාජධානියේ 2000 වසරේ සිදුකළ පර්යේෂණයකින් අනාවරණය වූයේ එරට දික්කසාද වලින් 20% ක් මුහුණු පොත නිසා සිදුවන බවයි.

අන්තර්ජාලය විකාශනය වීමත් සමඟ සමාජ ජාල වෙබ් අඩවි ප්‍රචලිතවන්නට වූ අතර ෆේස්බුක්, ටුවිටර්, යූ ටියුබ් ඒ අතර මුල්තැන් ගනී. හාවඩ් විශ්ව විද්‍යාලයේ මාක් සුකර්බර්ග් විවිධ අභියෝග මැද ඇරඹූ මුහුණු පොත සමාජ ජාල වෙබ් අඩවි අතර මේ වනවිට ඉහළම ජනප්‍රියත්වය දිනා ඇත. 2012 සැප්තැම්බරයේදී මුහුණුපොත හා බද්ධ වූ ක්‍රියාකාරී සාමාජික පිරිස බිලියනය ඉක්මවා ගිය අතර මේ වන විට ලෝකයේ ජනගහනයෙන් තෙවන ස්ථානය දිනා ගැනීමට මුහුණු පොත සමත්වී ඇත. එක් දිනයකදී ඡායාරූප මිලියන 300 ක් මුහුණු පොත ඔස්සේ සංසරණය වන අතර බිලියනයකට අධික සාමාජිකයන් අතර බිලියන 100 කට වඩා වැඩි මිතුරු දම් ගොඩ නැගී ඇත. එක් සාමාජිකයකුට දළවශයෙන් මිතුරු මිතුරියන් 140 දෙනකු හා සම්බන්ධතා පවත්වාගෙන යැමේ සාමාන්‍යයක් පවතින අතර බිලියනයක් වන ක්‍රියාකාරී සාමාජිකයන්ගෙන් හරි අඩක් දිනපතා මුහුණුපොත කරා සේන්දු වෙති. සාමාජිකයන් දිනකට පැයක සාමාන්‍ය කාලයක් මුහුණු පොතේ රැඳී සිටින අතර ඊට වඩා වැඩි කාලයක් රැඳී සිටින පිරිස් බොහෝ වෙති.

මුහුණු පොත සතු සුවිශේෂී වාසි මෙසේ වර්ගීකරණය කළ හැකිය. තොරතුරු බෙදා හදා ගැනීම, චැටින් හෙවත් ක්‍රියාකාරී ලෙස කතා බස් කිරීම, අදහස් හුවමාරු කර ගැනීම, ජංගම දුරකථනයෙන් පවා මුහුණුපොතට පිවිසීමේ පහසුව නිසා ඕනෑම තැනකදී එය හා කටයුතු කිරීමට හැකිවීම, අතීතයේ පාසල් වියේ යහළු යෙහෙළියන් වසර ගණනාවකට පසු යළි හමුවීම, සබඳතා පවත්වාගෙන යෑම, ව්‍යපාර ප්‍රවර්ධනයට සහය ලබාගැනීම, විනෝදය. පාසල් නිවාඩු කාලවලදී දරුවන්ටත්, විශ්‍රාම සමයේ වැඩිහිටියන්ටත් කාන්සිය දුරලීමේ මගක්වීම ආදී වශයෙන් මේ ලැයිස්තුව මේ ලිපිය අවසානය දක්වා රැගෙන යා හැකිය.

මුහුණු පොත හා බැඳි අවාසි ගැනද අවධානය යොමු කරමු. මුහුණු පොත හා සබැඳීම දුම්පානයට ඇබ්බැහිවීමටත් වඩා බරපතල ඇබ්බැහිවීමකට මඟ පාදන්නකි. කාලය ගෙවී යනවා නොදැනෙන අතර ඒ නිසාම සීමිත ජීවිත කාලයේ ඉතාමත් වටිනා සම්පතවූ කාලය ඔබටත් නොදැනීම ගෙවී ගොස් වටිනා දිවිය නාස්ති වීමට මඟ පෑදිය හැකිය.තොරතුරු හුවමාරු කරගැනීමේ මහගු මගක් වුවද කිසිදු පාලනයකින්, විශ්වාසනීය භාවයකින්, සහතික කිරීමකින් තොරව ගලාඑන තොරතුරු අතර මුසාවාද - වැරැදි දත්ත හා සංඛ්‍යා ලේඛන බොහෝ තිබිය හැකිය. අලුත්ම සොයා ගැනීම් අතර සමස්ත සාමාජිකයන් අතරින් මිලියන 83 ක ගේ (8.7%) ගිණුම් සාවද්‍ය වන අතර වැරැදි තොරතුරු කූට ව්‍යාපාරික වැයම්, සදාචාරාත්මක නොවන කටයුතු, මානව හිතවාදී නොවන පටු අරමුණු සඳහා යොදා ගැනීම් ආදිය සඳහා සාවද්‍ය ගිණුම් පවත්වාගෙන යන බව අනාවරණය වීමත් සමඟ කොටස් වෙළෙඳ පොළේ මුහුණු පොත සමාග මේ කොටස් මිළ ඩොලර් 20කට වඩා අඩු මිලක් දක්වා පහත වැටුණේය. මේ නිසාම මුහුණු පොත තුළ අඩංගු තොරතුරු - දත්ත - සංඛ්‍යාලේඛන පමණක් නොව පුද්ගල ගිණුම්ද සාවද්‍ය විය හැකි බැවින් කල්පනාකාරී විය යුතුය. මුහුණු පොත තුළ පවත්වාගෙන යන මිතුරු සමාජ පිටු, විවිධකංඩායම් ඇතැම් විටෙක විප්ලවකාරී බවක් මතුකරන්නට සම්මතයට පිටුපා සදාචාර විරෝධී, අසම්මත ආගම්, ජාති, මානව විරෝධී කටයුතු වලට පොළඹවා ගැනීමට වැයම් කරයි. විශේෂයෙන් මුහුණු පොතට සිය නම්, ලිපින, ඡායාරූප යෙදීමේදී දෙවරක් සිතා බලන්නට සිදුවී ඇත්තේත්, අන්‍යයන්ගේ ගිණුම් වල තොරතුරු ගැන දෙවරක් සිතා බලන්නට සිදුවී ඇත්තේත් ඒවා කොතෙක් දුරට නිරවද්‍යදැයි සොයා බලන්නට මගක් නැති බැවිනි. විශේෂයෙන් අවංකව ඔබ යොදා ඇති සියලු තොරතුරු ඔබේම අවාසියට හේතුවිය හැකි නිසා තොරතුරු හා විශේෂයෙන් ඡායාරූප ඔබේ පිටුවට එක්කරද්දී සිහි නුවණින් කටයුතු කළ යුතුය. ඔබේ පෞද්ගලික තොරතුරු අනුන් සොරා ගැනීම යහපත් දෙයක් නොවේ.

මුහුණු පොත සිසු සිසුවියන්ගේ මනස වල්මත් කරන, ඔවුන්ගේ කාලය නිකරුණේ කා දමන්නක් යැයි විශේෂඥයෝ කියති. ඇතැම් රටවල් වල කාර්යාල සේවකයන්ට මුහුණු පොතට පිවිසීම තහනම් කර ඇත්තේද මේ නිසාවෙනි. විශේෂයෙන් පාසල් වියේදී නව අත්දැකීම් සොයා යැමට දක්වන සහජ ලැදියාව නිසා වැඩි වැඩියෙන් මිතුරු මිතුරියන් ගොඩනගා ගැනීමට දක්වන ආසාව ඇතැම් විටෙක 'පිස්සුවක්' ලෙස වර්ධනය වීමේ අනතුරක් ද තිබේ.

බ්‍රිතාන්‍යයේ පාසලක පැවැත්වූ සමීක්ෂණයකදී අනාවරණය වූයේ ගුරුවරුන් උගන්වන දෙයට වඩා මුහුණු පොත ගැන මහත්වූ කුතුහලයකින් හා ආසාවකින් ඊට යොමුවීම නිසා අධ්‍යාපන කටයුතු වලින් දුර්වල වී ඇති බවයි. විශේෂයෙන් මුහුණු පොත තුළ අඩංගු සමකාලීන උණුසුම් තොරතුරු දේවත්වයෙන් අදහන්නට ඔවුන් පෙළී සිටි අතර ගුරුවර ගුරුවරියන් යල් පැන ගිය චමින්දලා ලෙස සලකන ප්‍රවනතාවයක්ද පෙන්නුම් කැරිණ. අධ්‍යාපන හා අධ්‍යයන කටයුතු වල දුබලතා මතුවීමක් පෙන්නුම් කර ඇත.

සමාජ ජාල වෙබ් අඩවි වලට සිසු සිසුවියන් පිවිසීමේදී එක්තරා මගපෙන්වීමක් පවත්වාගෙන යැම වැදගත් යැයි සමීක්ෂකයෝ පෙන්නා දෙති.


මුහුණු පොත පරිහරණයේදී වඩාත් ආරක්ෂාකාරී හා අනාගත ගැටලු වලින් මිදීම සඳහා උපදෙස් මාලාවන්ද සැකසීමට දැනටමත් ඇතැම් රටවල් යුහුසුළු වී ඇත. සිරියාව, චීනය, ඉරානය සහ වියට්නාමය මුහුණු පොතට පිවිසීම මුළුමනින් තහනම් කර තිබේ. පරිගණකය කෙරේ අධික ලෙස ඇබ්බැහි වීමෙන් මානසික හා කායික රෝග වලට ගොදුරු වන බව දැන් සොයාගෙන තිබේ. පෞරුෂය බිඳ වැටීම, බොහෝ කරුණු නිසා වල්මත් වීම, නිසි කලට වේලාවට ආහාර පාන, ව්‍යායාම, නින්ද ලබා නොගැනීමෙන් විෂාදය වැනි මානසික රෝගත්, අධික තරබාරුව, අධික රුධිර පීඩනය වැනි කායික රෝගත් වැළඳීමේ අවස්ථා බහුල විය හැකිය.

සමාජය සමඟ සබඳතා රැසක්, ඇතැයි මනසින් මවාගෙන සිටිය ද ඒවා හුදෙක් 'මුහුණු පොත' ඔස්සේ ගොඩනැගුණු සබඳතා පමණකි. මේ නිසාම සමාජ ඇසුර අහිමිව එක්තරා තනිවීමකට ලක්වේ. 14 වියැති හන්නා ස්මිත් ලැට්වියාන දැරියක වන අතර මුහුණු පොත ඔස්සේ විකල්ප මතවාදයන්ට නිරතුරු එක්වූවාය. ස්ත්‍රී දූෂණයේ වැදගත්කම, අපචාරයන්හි අවශ්‍යතාව, ලිංගික නිදහස ඇතුලු ළමා මනසට ඔරොත්තු නොදෙන ඈ ඔස්සේ දිගින් දිගටම සාකච්ඡා, සංවාද හා වාද විවාද කිරීම නිසා ඇතිවූ කම්පනයෙන් මරණය සිදුවී ඇතැයි වෛද්‍ය වාර්තා වලින් කියැවිණි.

මුහුණු පොත ඔස්සේ ශ්‍රී ලංකාවේද මරණ සිදුවන තරමට තත්ත්වය බරපතල වෙමින් තිබේ. මෙහිදී සිදුවිය යුතුව ඇත්තේ මනා පාලනයකින් සියලු දෑ පරිහරණය කිරීමට අවශ්‍ය ඇනුම්වත් භාවය ලබාදීමය. ෆේස්බුක් බිත්ති වල සටහන් වන සියලු දෑ පරම සත්‍යය නොවේ. ඒ ඒ අයගේ විවිධ සිතුවිලි මෙන්ම විවිධ සංකල්පනා - තොරතුරු විය හැකිය. පුද්ගල ගිණුම් හි ඇති ඡායාරූප ඔහුගේ හෝ ඇයගේ දැයි හරියටම කිව නොහැකිය. එසේම ඒවායේ ඇති රූමත් බව සැබෑ දිවියේ දී දැකීමට හැකි දැයි සැක සිතෙන්නේ ඇතැම් විටෙක නූතන තාක්‍ෂණයේ පිහිටෙන් ඡායාරූප පවා වෙනස් කළ හැකි නිසාවෙනි. මේ සියල්ල ගැන හොඳ අවබෝධයකින් හා අවධානයකින් යුතුව මුහුණු පොත පරිහරණය කළ යුතුවන්නේ ජීවිත ජය ගැනීමට මිස ජීවිතය වෙනුවට මරණය වැළඳ ගැනීමට නම් නොවේ.

**ශිරාන් මෛත්‍රී**

## කැමිලස්ගේ — නිත්ත ඇත්ත



# මරිය මාතාවන්ගේ මාතෘක ආදරය නූතන ලෝකයට කදිම ආදර්ශයක්!

**එදා මරියෝත්තමාවන්ගේ කුසේ ජේසු බබා පිළිසිඳ ගන්නා බව දේව දූතයා පැවසූ විට ඇය බියට පත්වූවත් දේව හඬට අවනත වෙමින් ජේසු තුමා කුරුස ගසට පත්ව උකුත් වන අවස්ථාව දක්වා ලඟින් සිටිමුත් අද දරුවාට මවුපියන්ගේ ආදරය, නිසි රැකවරණය නොලැබීමත් නිසා ළමා සහ තරුණ පරපුර විනාශකාරී ලෝකය කරා යොමුවන බැවින් ඔවුන් මුදවා ගැනීම දෙමව්පියන්ගේ යුතුකමකැයි කුරුණෑගල මිල්ලව කනිටු දෙව්සත්හලේ දේව කැඳවීම් අධ්‍යක්ෂ කුරුණෑගල සා. ආනා විදුහලේ ආචාර්ය ගරු හර්මන් සරත්චන්ද්‍ර පියතුමා පැවසිය.**

කුරුණෑගල රදගුරු පදවියේ මැල්සිටිපුර මීසමට අයත් දිද්දෙනිය ලූර්දු දේව මාතාවන්ගේ දෙව්මැඳුරේ වාර්ෂික මංගල පූජාවේදී එතුමා එසේ පැවසීය.

ජේසු තුමන් තුළ විශ්වාසයෙන් දිවි ගෙවන්නට අපව මෙහෙයවන කුමරි මරියාවන් පාථය අර්ථවත් කරමින් මැල්සිරිපුර මීසම් සේවක ගරු මයිකල් කෝස්තා සහ සහයක ගරු ගෝමි දිවාකර පියතුමන් සහ දොමිනිකාන පැවිදි සොයුරියන් සහ මීසම් සංඝය මංගල කටයුතු සංවිධානය කර තිබුනි.

**නිමල් ඒ. අල්මේද**



බටගම ශු. අන්තෝනි මුනිඳුන්ගේ දේවස්ථානයට පාදුවාහි ශු. අන්තෝනි මුනිඳුන්ගේ ධාතුවක් වැඩම කරවීම කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් අතින් සිදුකෙරිනි. මෙම අවස්ථාවට මීසම් සේවක ගරු බර්නාඩ් නිශාන් විලත්ගමුව හා සහයක පියතුමන්ද පැවිදි සොයුරියන් සමග සැදැහැවත් ජනතාවද එක්වූහ.

**නිශාන්ත රෝසා**

## ගලේවෙල තරුණ සමිතිය ඉදිරියට

ගලේවෙල සා. ජූඩ් දෙව්මැඳුරේ තරුණ සමිතිය මිට වසර 3 කට පෙර අරඹන ලදී. වර්තමානයේ සමාජික සංඛ්‍යාව විසි පස් දෙනෙකි.


**දිමුතු විජේරත්න**

## සැබෑ ක්‍රිස්තු අනුගාමිකයා එතුමා අනුව දිවිගෙවිය යුතුයි

අප ස්වාමිනි. ස්වාමිනි කියමින් යාච්ඤා කළාට, වන්දනා ගමන් ගියාට, සුව මෙහෙයයන්ට ගියාට පමණක් ක්‍රිස්තු අනුගාමිකයකු නොවන බවත්, සැබෑ ක්‍රිස්තු අනුගාමිකයකු වීමට නම් උන්වහන්සේ අපට කියාදුන් විදියට ජීවත්වීම අත්‍යවශ්‍ය බවත් සැලේසියාන ප්‍රාදේශියාධිපති අතිගරු නිහාල් ලියනගේ පියතුමා පැවසීය.

එතුමා එසේ පැවසුවේ සැලේසියානු නිකායේ නිර්මාතෘ සාන්ත දොන් බොස්කෝ තුමාගේ මංගල්‍ය දින දුන්ගාල්පිටිය දොන් බොස්කෝ ආයතනයේදී පවත්වන ලද මංගල්‍ය දිව්‍ය පූජාවේදීය. මෙම දිව්‍ය පූජා යාගය පැවැත්වීම සඳහා කැපුන්ගොඩ මීසම් සේවක ගරු ක්ලෝඩ් වනසිංහ දුන්ගාල්පිටිය දොන් බොස්කෝ ආයතනයේ පරිපාලක ගරු චලන කලංග පියතුමන්ද සහය වූහ.

**මොරිස් නානායක්කාර**



වාසළකෝට්ටේ සා. අන්තෝනි මහා විද්‍යාලයේ ශිල්ප සතර ලබාදුන් ගුරු මහත්ම මහත්මීන්ට උපහාර පිදීමක් පසුගියදා සිදුකෙරිනි. 1980 දශකයේ සිට මේ දක්වා සේවය කළ ගුරු මෑණිවරුන්ට පියවරුන්ට මෙම ඇගයීමේ උත්සවය සූදානම් කැරිණ. වාසලකෝට්ටේ සිද්ධස්ථාන පාලක ගරු යෝවාන් සවරිමුත්තු පියතුමන් ඇතුළු ගුරු මහත්ම මහත්මීන් හා ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන් උත්සවයෙන් පසු ඡායාරූපයකට පෙනී සිටි අයුරු.

**පෝල් ඒකනායක**



කැළණිය සාන්ත වින්සෙන්ති පාවුලා සමිතිය මගින් පොලිතින් වලින් පරිසරයට සිදුවන හානිය ගැන දැනුම්වත් කරමින් පත්‍රිකාවක් සමග පරිසර හිතකාමී බෑගයක් හඳුන්වා දී ඇත. පළමු බැගය කැළණිය හිටපු මීසම් සේවක ගරු ගිහාන් රිඩ්ලි පියතුමාට පිරිනමන අයුරු.

**ජූඩ් පෙරේරා**

## පාලකුඩාව දේවස්ථානයේ දී අක්ෂි සායනයක්

තලවිල මීසම් සේවක ගරු නිහාල් පයස් පියතුමාගේ ආරාධනයෙන් දුම්මලදෙනිය සිංහ සමාජය විසින් පාලකුඩාව සා. පේදුරු පාවුළු දේවස්ථානයේ දී අක්ෂි සායනයක් පවත්වන ලදී.

"ඇස් කණ්නාඩි ලබාගෙන දෙවිඳුන්ට ස්තෝත්‍ර කියන්න, එකිනෙකාට ප්‍රේම කරන්න, උදව් කරන්න, යහපත් දේ කරන්න මේ පෙනීම යොදා ගන්නැ"යි ගරු නිහාල් පයස් පියතුමා අක්ෂි සායනය ආසිරි ගන්වමින් ප්‍රකාශ කළේය.

තලවිල මීසමේ දේවස්ථාන 7 කින් පැමිණි 250 දෙනෙක් පමණ අක්ෂි සායනයේ සේවය ලැබූහ. ඇසේ සුද ඇති රෝගීන්ට කාච ලබාදීමට ද මෙහිදී කටයුතු කෙරිණ. ඇස් පරීක්ෂා කිරීමත් වර්ගීකරණය කරන ලද ඇස් කණ්නාඩි ප්‍රදානයක් නොමිලේ සිදුකිරීමත් මෙහි විශේෂ ලක්ෂණයකි.

**ප්‍රැන්සිස් ෂෙල්ටන් ප්‍රනාන්දු**

## හංවැල්ල මීසමේ දේව කැඳවීමේ දිනයක්



හංවැල්ල මීසමෙන් බිහිවූ ගරු පූජක පුතුන් සහ පැවිදි සොයුරියන්ගේ ප්‍රධානත්වයෙන් සතරවන වරටත් දේව කැඳවීමේ දිනයක් කළුඅග්ගල දේවස්ථානයේ දී අතිඋතුම් මැක්ස්වල් ග්‍රැන්විල් සිල්වා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුනි.

මෙයට පස්වන ශ්‍රේණියේ සිට එකොළොස් වන ශ්‍රේණිය දක්වා වූ දරුවන් සහභාගි වූ අතර, ඔවුන්ට කැපවුන දිවියක වටිනාකම් පැහැදිලි කළේ ගරු පියවරුන් සහ පැවිදි සොයුරියන්ය. හංවැල්ල මීසම් සේවක ගරු ගියොම් නෝනිස් සහයක ගරු රෝෂාන් චමින්ද යන පියවරු මෙය සංවිධානය කළහ.

**ඇන්තනි හෙට්ටිආරච්චි**



මොරටුව කඩලාන සා. අන්තෝනි විදුහලේ පළමු ශ්‍රේණියට 2014 වසරේ ළමුන් ඇතුලත් කිරීම පසුගියදා මීසම් සේවක දිසානායක ගරු ලලිත් පෙරේරා පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුවිණි. වැසියාමේ තර්ජනයට මුහුණ දුන් පාසලක් වශයෙන් නම් කරන ලද මෙම පාසල නව විදුහල්පති රවීන්ද්‍ර ජයලත් මහතාගේ මනා කළමණාකාරිත්වයෙන් ගොඩනැඟීමේ කාර්යයේදී දෙමාපියෝ 2014 වසරට ළමුන් 42 ක් මෙම පාසලට ඇතුළු කිරීමට උනන්දු වූහ. එම කාර්යයේදී ගරු ලලිත් පෙරේරා පියතුමා මහත් සහයෝග යක් ලබාදුනි. මොරටුව පුරපති ආදි ශිෂ්‍ය සමන්ලාල් ප්‍රනාන්දු මහතා ජයලත් අප ස්වාමිදු විදුහල්පතිනි ගරු සුජීවා නෝනිස් පැවිදි සොයුරිය නාගරිකමන්ත්‍රී ප්‍රියනාත් මෙන්දිස් මහතා කුඩාමල කන්‍යාරාමයේ ගරු පැවිදි සොහොයුරියන් හා 1 වැනි ශ්‍රේණියේ දරුවන් සියලුම දෙනා හට පාසල් උපකරණ හා සියලුම පොත් පත් සඳහා මුදල් යෙදවූ කඩලාන බොස්කො සමිතියේ නිලමඬුල්ලද මෙම අවස්ථාවට සහභාගි වූහ.

**සුරන් ද සිල්වා**

## කන්ද උඩරට කඩියන්ලෙන වාස් බැතියෙන් නැඟැවේ

මහනුවර රදගුරු අතිඋතුම් ජෝසප් වියානි ප්‍රනාන්දු හිමිපාණන් ආසිරි ගැන්වූ කඩියන්ලෙන ජෝසප්වාස් දෙව්මැඳුරේ දෙවන වාර්ෂික මංගල්‍යය සමරණ ලදි. අවට වතුකරයේ මෙන්ම නාවලපිටිය මීසමේ බහුතරයක් බැතිමතුන් එක්විය.

සන්ධ්‍යා මෙහෙය අනුනායක අතිගරු මිල්රෝයි ෆොන්සේකා පියතුමාගේ ප්‍රධානත්වයෙන් ද දිව්‍ය පූජාව ගරු මෙරියස් ලෙනාඩ් පියතුමාගේ ප්‍රධානත්වයෙන් ද පිදිණ. මීසම් සේවක ගරු නිලංක හර්ෂ ඩයස් පියතුමා මංගල්‍ය කටයුතු ඉතා මැනවින් අර්ථ සම්පන්නව සිදු කළේය.

**මිකී ප්‍රනාන්දු**

## ප්‍රාදේශීයාධිපතිනියට උපන් ගමෙන් හරසර

යහපත් එඬේරා නිකායේ ශ්‍රී ලංකා / පාකිස්ථාන ප්‍රාදේශීය නායිකා ගරු මේරි ෆ්‍රැන්සින් මුතුගල පැවිදි සොයුරිය තම උපන් ගම වන වැලිවිටදි පිළිගැනීමේ දිව්‍ය පූජා යාගයක් උත්පත්ති දේවමාතා දෙව්මැඳුරේදී පැවැත්විණි.

දිව්‍ය යාගය පුදකිරීමට ගරු ගාමිණී සිල්වා (නි.ම.නි) ගම්පියසේ පූජක පුතුන් වන ගරු සුදත් සිල්වා හා ගරු කමල් නිරෝෂණ මීසම් සේවක ගරු අර්නස්ට් ද මැල් පියතුමන් ඇතුළු ගම්පියසේ පැවිදි සොයුරියන් කිහිප දෙනෙක් ද සහභාගි වූහ.

**සුසිල් හැරිසන්**



හලාවත පදවියෙන් පූජකවරම් ලබා හලාවත පදවියේ මීසම් සහයක ලෙස වසරක් සේවය කළ පූජක පුතුන් 9 දෙනකු සමුගැනීමේ විශේෂ දිව්‍ය පූජාවක් හලාවත කාර්මෙල් දේවමාතා ආසන දෙව්මැඳුරේදී මීසම් සේවක ගරු ලින්ටන් නිහාල් ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය. මෙහෙය අවසානයේ පූජකවරු ඡායාරූපයකට පෙනී සිටි අයුරු.

**පර්සි ප්‍රනාන්දු**

## මරිය වසර අරුත්බරව ආරම්භ කරයි

මරිය වසර පල්ලන්සේන මීසමේ ආරම්භ කළේ දේව මාතා ප්‍රතිමාවන් කිතුනු ඒකක 61 ක් තුළ ගෙයින් ගෙට සංචාරය කිරීම ආරම්භ කරමිනි. සෑම බදාදා දිනකම ඊළඟ නිවසට ගෙනයනු සේ සතියක් නිවස තුළ තැන්පත් කර එම නිවසේ සතිය පුරා ජපමාලය දේව මාතා ප්‍රාර්ථනාව රට වෙනුවෙන් හා මරිය වසර නියමිත යාච්ඤාව උච්චාරණය කිරීමෙන් පසුවය. ශුද්ධවූ සුවිශේෂයේ මරිය තුමිගේ ප්‍රකාශනයන් ජපමාලයේදී භාවනා කරන අතර ගීතිකාද පංතියෙන් පංතියට ගායනා කෙරේ. මේ අනුව මුළු වසර පුරා සති 52ක් තුළ මෙම අභ්‍යාසය ක්‍රියාත්මක කෙරේ.

මීසම් සේවක ගරු ජයන්ත නිමල් හා සහයක ගරු ගයාන් ප්‍රසන්න පියතුමන් මෙම අභ්‍යාසය කිතුනු ඒකක නායකයින් සමග සංවිධානය කර ඇත.

**මෙල්වින් ද කොස්තා**


## දේවමාතා මංගල්ල මරිය හමුදාව සංවිධානය කරයි

පමුණුගම ඒකාබද්ධ මරිය හමුදා කණ්ඩායම මරිය වසරට කෙසේ සංවිධානය විය යුතු ද යන්න පිළිබඳව සහයක මීසම් සේවක රසික ලෝරන්ස් ගරු පියතුමා සමග කළ සාකච්ඡාව අනුව මෙම වසරේ පැවැත්වෙන සෑම දේව මාතා මංගල්‍යයක්ම මරිය හමුදාව සිදුකිරීමටත් එකී සෑම මංගල්‍යයකට පෙරාතුව දින තුනක් සූදානම් වීමේ නොවාන පැවැත්වීමටත් සැලසුම් කැරේ.


මීසම් සේවක ආනන්ද විතාන ගරු පියතුමා සෑම කිතුනු ඒකකයක් දැනුම්වත් කරමින් සතියේ සිකුරාදා හෝ තමන්ට පහසු දිනක සවස 6 1/2 ට ජපමාලය උච්චාරණය කිරීමටද නියමිතය.

**බෙනි ජයමාන්න**

# මරිය උදාන ගීතයෙන් විහිදෙන කිතුරැස්



**මරිය තුමියගේ නිර්මල පාරිශුද්ධ භාවය, එතුමියගේ නිහතමානි බැහැපත්, කීකරුකම, දේව කැමැත්තට අවනත වීම ආදි නිමල මරිය ගුණ සුවඳ නිසා අපේ දේව අම්මා යන විරුදාවලියෙන් සමස්ත මානව සංහතියම එතුමියට නමස්කාර කරන්නෝ ය.**



එමෙන්ම වඩා වැදගත් උත්තරීතර සිද්ධිය වනුයේ එතුමිය ආත්ම ශරීර පිටින් ස්වර්ග රාජ්‍යයේ වැඩ වසන රාජිණිය වන බව ශුද්ධාසනය විසින් විශ්වයටම ප්‍රකාශ කිරීමය. එසේම එතුමිය බොහෝ වාරයක් විශ්වයේ නොයෙක් තරාතිරමවල අයට දර්ශනය වී දේව කැමැත්ත ඉටු කරන ලෙස කරන ආයාචනයන් ය.

මරිය තුමිය ගැන උදම් අනන එතුමියගේ වන්දනා ස්ථානවල කැඟසන අයගෙන් බොහෝ දෙනෙකු එතුමියගේ බැහැපත් නිර්මල පාරිශුද්ධ දිවි පෙවෙත අනුව තම පවුල තම දරුවන් මෙහෙයවනු දකින්නේ කලාතුරකිනි. අද අපගේ කිතුනු පවුල්වල පවතින විෂම ගති පැවතුම් දෙස බලන විට මරිය තුමියගේ වන්දනා ස්ථානවල වත්පිළිවෙත් මත වැළපෙන හඬ නඟන සැදැහැවතුන්ගේ හඬ හිස් ඝෝෂාකාරයක් පමණි.

මරිය උදාන ගීතයෙන් විශ්වයටම එතුමිය කතා කළේ දෙවියන් වහන්සේ දේව රාජ්‍යයට කැඳවන්නේ කවුරුන්ද යන්න බව පැහැදිලි වන්නේ ය. ධනවතුන්, බලවතුන්, දිළින්ඳන් පහත් කරමින් ඔවුන්ට හිංසා පීඩා කරමින් හෙළා දකිමින් උඩඟු මානයෙන් වැජඹුනත් දෙවියන් වහන්සේ දේව රාජ්‍යයේ උරුමයෙන් ඔවුන් විසුරුවා හරින බව එතුමිය ප්‍රකාශ කරන්නීය.

"සිය බාහුවෙන් එතුමාණෝ විකුම් පා උඩඟු සිත් ඇත්තන් විසුරුවා හැර මහා නර පතීන් සිය සිහසුන් වලින් පහත හෙළා දීනයන් උසස් කළ සේක. සාගිනි වූවන් යහපත් දෙයින් සතප්වා ධනවතුන් හිස් අතින් හරවා යැවූ සේක." (ශු. ලූක් - මරිය උදාන ගීය 1:51-52).

මරිය තුමිය, මරිය උදාන ගීතයෙන් ප්‍රකාශ කළ ශ්‍රී වාක්‍යයම ජේසු සමිඳුන් ධර්ම ශාලාවේදී පළමු දේශනයෙන් ප්‍රකාශ කළේ මෙසේ ය.

"උන්වහන්සේ තමන් ඇති දැඩි වූ නාසරෙත් නුවරට පැමිණ සිරිත් පරිදි සබත් දවසේ දී ධර්ම ශාලාවට වැඩම කර කියවීම පිණිස නැගිට සිටි සේක. එවිට දිවැසිවර යෙසායාගේ ග්‍රන්ථය උන්වහන්සේට දෙන ලද්දේ ය. උන්වහන්සේ ග්‍රන්ථය දිග හැර මෙසේ ලියා ඇති තැන සොයාගත් සේක. ස්වාමින් වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත. මක්නිසාද දිළින්ඳන් හට සුභාරංචිය දේශනා කරනු වස් උන්වහන්සේ මා අලේප කළ සේක. වහලුන්ට මිදීම ද අන්ධයන්ට පෙනීම ද ලැබෙන බව දන්වන්නටත්, පීඩිත වූවන් මුදන්නටත් ස්වාමින් වහන්සේගේ ප්‍රසාදලත් වසර ප්‍රකාශ කරන්නටත් මා එවා වදාළ සේක." (ශු. ලූක් 4:10 - 19).

මරිය තුමියට රත්තරන් ඔටුනු කොපමණ පළඳවා මුතු මැණික් ආලේප කළත් එතුමිය පීඩා විඳින දිළින්ඳන් අතරේ මිස මහා බලවතුනගේ බලපරාක්‍රම මාළිගාවල රත්තරන් ආකරවල නැත. මරිය තුමියට ගෞරව කරන සියල්ලෝ දිළින්ඳන්, පීඩිතයන්, නැති බැරි අසරණයන් ගොඩගන්න ඔවුන්ගේ කඳුළු පිස දමන්න සිය ධනය, වස්තුව පරිත්‍යාග නොකරන්නේ නම් මරිය තුමිය ප්‍රකාශ කළ පරිදි "සාගිනි වූවන් යහපත් දෙයින් සතප්වා ධනවතුන් හිස් අතින් හරවා යවන සේක." කිතු දහම ලෙස වත් පිළිවෙත් වන්දනා මාන කරන සියල්ලෝ හිස් අතින් ආපසු යවන බවට ප්‍රකාශිත මරිය උදාන අභියෝගය දැන්වත් සියළු කිතුනුවන් අවබෝධ කර ගනිත්වා

✍ **ජෝ. සංඝපාලආරච්චි**
පමුණුගම

# "මම ස්වාමින් වහන්සේගේ දාසිය වෙමි, ඔබ පැවසූ ලෙස මට ඉටු වේවා."

**එදා මරියා නම් වූ බැහැපත් ස්ත්‍රිය දෙවියන් වහන්සේට යාච්ඤා කරමින් සිටින විට ගාබ්‍රියෙල් නම් වූ දේවදූතයෙක් පැමිණ මරියාණන් හට දේව පණිවුඩයක් ප්‍රකාශ කළේය.**

එහි ගැබ් වී තිබුණේ අප ලොව ගැලවුම්කාරයාණන්ගේ මව වීමේ භාග්‍යය එතුමියට හිමි වූ බවයි. යොවුන් සමයේ තාරුණ්‍යයට පා තබා සිටි මරිය තුමී මෙලෙස තමන්ට පැමිණි කැඳවීම මහත් විශ්වාසයකින් යුතුව භාර ගත් සේක. අවිවාහකව සිටි තමන්ට මෙවැනි සිදුවීමකට මුහුණ දීමට වෙතැයි ඈය කිසිවිට නොසිතන්නට ඇත. එහෙත් මරියතුමිය කෙරෙහි තිබූ දැඩි දේව භක්තිය හා බැහැපත්කම නිසා ස්වාමින් වහන්සේගේ දාසිය වන්නට පවා එතුමිය නිහතමානී වූවාය.

එහෙත් සිතන්න, වෙන ස්ත්‍රියකට මෙවැනි දෙයක් සිදුවුවහොත් කෙසේ ක්‍රියා කරයි ද? එදා සමාජයේ පැවති නීතිවලට අනුව අවිවාහකව සිටින විට දරු උපතක් සිදුවූයේ නම් ගල් ගසා මරනු ලැබීය. ඒ සියල්ලක්ම දැන සිටි මරියාණන් ඒ සැම දෙයකටම විශ්වාසයෙන් යුතුව මුහුණ දීමට ඉදිරිපත් විය. "මේ මම ස්වාමින් වහන්සේගේ දාසිය වෙමි. ඔබ පැවසූ ලෙස මට ඉටුවේවා" කියා නිහතමානීව බැහැපත්ව දේව වචනයට අවනත විය.

මඳක් ඔබේ ජීවිතය දෙස හැරී බලන්න. මෙලෙස ඔබ බැහැපත් වී තිබේ ද? ඔබේ මුළු ජීවිත කාලය පුරාවටම. ඇතැම් විට අපි අපගේ හෘද සාක්ෂියට පිටුපා ක්‍රියා කරන්නෙමු. හෘදය සාක්ෂිය යනු දෙවියන් වහන්සේ ය. එනම් අප හෘදය සාක්ෂියට විරුද්ධ වේ නම් දෙවියන් වහන්සේට ද විරුද්ධ වනු ඇත. අප ක්‍රියා කරන්නේ අපට රිසි ලෙසටය. නමුත් විය යුත්තේ එය නොවේ. කිතුනුවන් වන අප සැම දෙනා ජීවත් විය යුත්තේ අපගේ එකම දෙවියන් වහන්සේගේ අණ පරිදිය. එය පිළිපදින්නට නම් අප තුළ නිහතමානිත්වය, බැහැපත්කම තිබිය යුතුමය. නමුත් ඇතැමුන් ක්‍රියා කරනුයේ තමන්ට වඩා කිසිවකු නැති ගානටය. අපි වැනි පුංචි මිනිසුන් එසේ සිතනවානම් එදා මරියාණන්ට කිනම් ආකාරයට සිතන්නට ඉඩ තිබුණේ ද නමුත් ඈය එසේ නොවීය. ඈය කළ එකම ක්‍රියාව වන්නේ දෙවියන් වහන්සේට අවනත වීම පමණි.

බැහැපත්කමේ, නිහතමානීකමේ උල්පත වන මරිය මාතාවගේ ජීවිතය ආදර්ශයට ගනිමින් සැම මොහොතකම එතුමියගේ දෑතට අපගේ දෑත් දිගු කරන්නට උත්සාහ දරමු. පාපි වූ ක්‍රියාවලින් මිදී යහපත් මං පෙතක් කරා යන්නට එතුමියගේ සළුවේ එල්ලෙමු. මරියෝත්තමාවන්ගේ ආදරය මැද කිමිදී අපි සියලු දෙනාම සමිඳාණන් වෙතට යාමට එතුමියගේ දෑතේ රැඳෙන්නට සිතට ගනිමු. මේ මරිය වසර එයට කදිම තොතැන්නක් කරගනිමු.



✍ **කේ. ඒ. නිම්නාදි රුද්‍රිගෝ**
සිරිකුරුස විදුහල - ගම්පහ

# දේව මවුන් වන මරියෝත්තමාවන්ගේ දිව්‍ය මාතෘත්වය

**ගරු විල්ප්‍රඩ් පින්තු පියතුමා**



**පසුගිය සතිය හා සබැඳේ**

**එපේසිය සම්මන්ත්‍රණය**

නෙස්ටෝරියස් ගේ ඉගැන්වීම නිසා හට ගත් වේද භේදය ප්‍රධාන වශයෙන්ම ක්‍රිස්තු ධර්ම වේදීය වේද භේදයකි. එහෙත් එහි ප්‍රතිඵල මරිය දහම කෙරෙහිද අහිතකර ලෙස බලපායි. නෙස්ටෝරියස්ට විරුද්ධව මරිය තුමියගේ දිව්‍ය මාතෘත්වය පිළිබඳ විශ්වාසය ආරක්ෂා කර ගැනීමට ඉදිරිපත් වූ අය අතරින් ප්‍රථම ස්ථානය ගන්නේ ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල් තුමා ය. මරිය තුමිය දේව මාතාවන් වන්නේ කෙසේ දැයි විස්තර කරමින් එතුමා ඉදිරිපත් කළ දෙවැනි ලේඛනයේ අන්තර්ගතය ක්‍රි.ව. 431 දී රැස්වූ එපේසීය සම්මන්ත්‍රණය තම නිල ඉගැන්වීම සඳහා පාදක කරගන්නේ ය. එම ලේඛනයට අනුව:

1. මරිය තුමිය උපත දුන්නේ පසුකාලීනව වාක්‍යාණන් තමන් පිට බැස වදාළ සාමාන්‍ය මිනිසකු හට නොවේ.
2. "තෙයොටොකොස්" යන්නෙන් ජේසුස් වහන්සේ තම දේවීකත්වය මරිය තුමිය වෙතින් ලබා ගත් බවක් අදහස් නොවේ.
3. මරිය තුමියගේ කුස පිළිසිඳගෙන මෙලොව බිහිවූයේ මාංශගත වූ වාක්‍යාණන්ය.

පසුකාලීනව රැස්වූ විවිධ මන්ත්‍රණ සභාවන් එපේසීය මන්ත්‍රණ සභාවේ මෙම ඉගැන්වීම අනුමත කර ඇති බව පෙනේ. උදා: කැල්සොඩොන් සම්මන්ත්‍රණය ක්‍රි.ව. 450 දෙවන වතිකාන සම්මන්ත්‍රණයේ ජාතීන්ගේ ආලෝකය වේද ධර්ම ව්‍යවස්ථාවේ අංක 53 මරිය තුමිය සැබැවින් ම දේව මාතාවන් වන බව උගන්වයි.

☛ ලබන සතියට

# අදරැති මරි මවුනි



සුර රැජිණිය අප රැජිණිය ඔබය
මරි මවේ
අප සැම වෙත පිහිට වන්න
දයාබර මවේ
සාමෙ ගෙනා ලක් දෙරණට මහිමෙ
ඔබම වේ
ජපමාලය රැගෙන යදිමි ඔබට
සැම දිනේ

**බෝපිටිය තුඩුව - ටයිටස් සපරමාදු**

# ජපමාලය

චිත්‍ර - මර්සලීන් හීන්කෙන්ද
කතාව - පිලිසියන් කල්දේරා

**09 කොටස**



# වත ඉරාගෙන, සිත ඉරාගෙන
# දෙවි සමිඳුන් වෙත හැරෙමු

**චතාරික සමය අළු බදාදායින් ඇරඹෙයි. දේව කැමැත්තට පිටු පෑ ආදි මව්පියන්ට සමිඳාණන් වදාළ වචන වූ "දූවිල්ලෙන් සෑදුනු ඔබ නැවත දූවිල්ලටම හැරෙන්නේය" යන්න සිහිගන්වමින් පූජාප්‍රසාදිතුමා නළලේ අළු තවරනුයේ ජීවිතයේ අස්ථිර බව තහවුරු කරමිනි.**

ශරීරය මරණයත් සමඟ පසට මුසු වුනත් සමිඳු පහස සොයන්නා වූ අමරණීය වූ ආත්මයේ සදාතනික වූ පිපාසය ගැන මොහොතකටවත් අප අවදි වෙනවා ද? මෙලොව ජීවිතය සඳහා සූදානම් වීමට ඇති මහඟු අවස්ථාවක් මෙය බව අවබෝධ කරගැනීමට මේ සුදුසු කාලයයි. අපගේ දුබල හා පාපිෂ්ඨ බව පිළිගෙන උපවාසයෙන් සහ පසුතැවිල්ලෙන් ද මුළු සිතින් ද හැරී එන්නට සභා මාතා තොමෝ අප සැමට ආරාධනා කරන්නීය. ක්‍රිස්තුන් වහන්සේ දින හතළිහක් පාළුකරයේ හුදෙකලාව යාච්ඤාවේ හා උපවාසයේ ගැඹුරුම අත්දැකීමකට ඇතුල් වෙමින් තමන් පිළිබඳව වූ දේව සැලැස්ම අනාවරණය කරගත් සේක.

පාපය නොදත් දේව පුත්‍රයාණන් පිළිබඳව දේව කැමැත්ත වූයේ මනුෂ්‍ය සංහතියේම පාපයේ විපාකය වූ කුරුසියේ මරණය කරට ගෙන දේව ශුද්ධත්වය ඉදිරියේ පෙනී සිටීමයි. අභියෝගාත්මක හා අති අසීරු වූ මෙම කර්තව්‍යයට මුළු සිතින්, අවනත වීමට අවැසි වූ බල මහිමයෙන් පූර්ණ වීමට ද "පාළුකරය" ක්‍රිස්තුන් වහන්සේට වරප්‍රසාදිත කාලයක් විය.



යාච්ඤාව, උපවාසය හා පුණ්‍ය ක්‍රියා පිළිබඳව ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීම තුළින් ද අවධාරණය කරනුයේ අන්‍යයන්ට ප්‍රදර්ශනය කරමින් මිනිසුන්ගේ ගෞරවයට සහ අවධානයට ලක්වීම කිසිසේත් දේව කැමැත්තට අනුකූල නොවන බවයි. දකුණතේ ක්‍රියාව වමතටත් පවා නොදැනෙන ලෙස රහසිගතව සිදුවුනොත් සමිඳාණෝ ඒ ගැන ඉතා ප්‍රසන්නව ඊට ප්‍රතිවිපාක දෙන සේක. ලෞකිකත්වය තුළ ඇලී ගැලී සිටින අපට ද මිනිස් පුත්‍රභාවයේ දේව පුත්‍රභාවය කරා එතෙර වීමට මේ අනගි අවස්ථාවකි. ශු. පාවුළු තමා පවසන පරිදි හරි මාර්ගයට හැරී මනස්ථාපනය වන්නේ නම් අප සැමට ද චතාරිකය ප්‍රසාදජනක කාලයක් වනු ඇත.

මෙම චතාරික සමය තුළ, උපවාසයෙන්, පසුතැවීමෙන් හා මනස්ථාපනයෙන් යුතුව සමගිවීමේ ප්‍රසාද නිධානය ලබාගැනීම මඟින් දිව්‍ය සත්ප්‍රසාදීය සමිඳුන් ලබා ගනිමු. පුද්ගලික යැදුමින් ශු. ජපමාලයට මුල් තැන දෙමින් දෙවි සමිඳුන්ගේ දුක්විඳීම, මරණය හා උත්ථානය මෙනෙහි කරමින් යාච්ඤාවෙන් යුතුව ගත කරමු.

"වත ඉරාගෙන නොව සිත ඉරාගෙන නුඹේ දෙවි සමිඳුන් වෙත හැරී එන්න" යනුවෙන් අළු බදාදා දින අපට මතක් කර දුන් පරිදි අපගේ උපවාසය වත ඉරා ගැනීමකට එනම් බාහිර ක්‍රියාවන්ට පමණක් සීමා වූවක් ද? එසේ නොමැති නම් දෙවිඳුන් වෙත හැරී එන්නට සැබවින්ම එය මාර්ගයක් වන්නේ ද? කියා සිතා බලමු.

✍ **ටී. එච්. අජිත් ශාන්ත**
බොරලැස්ස

---

# සාන්තුවර බැතිය

**කතෝලික අප සාන්තුවර බැතිය මඟින් ප්‍රතිමා වන්දනාවේ යෙදෙන පිරිසක් ලෙස පෙන්වා දීමට උත්සාහ කරන මූලධර්මවාදීන්, එය සනාථ කිරීම සඳහා විවිධ ශුද්ධ ලියවිලි පාඨ උපුටා දක්වති.**

අප පළමුවෙන්ම අවධාරණය කළ යුත්තේ කතෝලික අප වන්දනා කරන්නේ එකම දෙවියන් වහන්සේට පමණක් බවත්, දේව මාතා භක්තිය හා සාන්තුවර බැතිය තුළින් කිසි විටෙකත් දෙවියන් වහන්සේට දිය යුතු වන්දනාව හා ගෞරවය වෙන කිසිදු කෙනෙකු වෙත ලබා නොදෙන බවත් හා අප කිසිම ප්‍රතිමාවකට දේවත්වය ආරූඪ කර ඒවාය වන්දනාමාන නොකරන බවත් ය. පළමුව අප දේවමාතා භක්තිය වෙත අවධානය යොමු කළ හොත්, එතුමියට කතෝලික විශ්වාසය හා පිළිවෙත් තුළ හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. එය එසේ විය යුතු බව ශුද්ධ ලියවිල්ලේම මෙලෙස සඳහන් වෙයි.

"හැම පරපුරක්ම මෙතැන් සිට භාග්‍යවන්තී යයි මට කියනු ඇත." (ලූක් 1:4) එසේම දේව දූතයා ඇය ආමන්ත්‍රණය කළේ "විපුල ප්‍රසාද ලත් උත්තමිය ඔබට මංගල වේ...." කියාය. එසේ නම් ඇයට සෙසු අයට වඩා විශේෂ තැනක් අපගේ විශ්වාසය හා පිළිවෙත් තුළ හිමිවිය යුතුමය.

කතෝලික සභා ධර්මෝපදේශයේ සාන්තුවරයන් හඳුන්වනු ලබන්නේ ක්‍රිස්තියානි ශුද්ධවන්තකමේ ආදර්ශයන් හා යාච්ඤාවේ සහකරුවන් ලෙසය. එම නිසා සාන්තුවරයන් කතෝලික අපට දෙවියන් නොව අනුගමනය කළ යුතු, අනුගමනය කළ හැකි පුද්ගලයින් ය. අපගේ ජීවිත තුළ අන් හැමටම වඩා ප්‍රබල ලෙස අනුගමනය කළ යුත්තේ ක්‍රිස්තුන් වහන්සේව මෙන්ම, අපව යහපත හා ක්‍රිස්තුන් වහන්සේ කරා යොමු කරවන සාන්තුවරයින්වද අනුගමනය කළ යුතු වෙමු.

ශුද්ධවූ පාවුළු තුමා පිලිප්පිවරුනට ලියන ලද ලිපියේ, "ඔබ හැම දෙනම මා අනුගමනය කිරීමට එකඟ වන්න. අපි ඔබට ආදර්ශයක් වී සිටිමු"යි සඳහන් කරමින් (3:17) කිතුනු ජීවිතය තුළ තමාව අනුගමනය කරන්න කියා ද (1 තෙසලෝනික 1:6-7), තමන්ව ජීවිත ආදර්ශයක් කොට ගන්නැයි කියා ද (2 තෙසලෝනික 3:7) පාවුළු තුමා ජනතාව ගෙන් ඉල්ලා සිටියේ ය.

එදා පාවුළු තුමා තමාව අනුගමනය කරන්නැයි ජනතාවගෙන් ඉල්ලා සිටි සේම, අප සභාව සාන්තුවරයින් අනුගමනය කරන්නැයි අපගෙන් ඉල්ලා සිටී. සාන්තුවර බැතිය හැම විටම අපව යොමු කළ යුත්තේ ක්‍රිස්තුන් වහන්සේ වෙතටයි. සාන්තුවරයින් අප හා ක්‍රිස්තුස් වහන්සේ ඒකාබද්ධ කරනවා වෙනුවට අප සාන්තුවරයින් ළඟ පමණක් නැවතුනහොත් එය වරදකි. කිසිවිටෙකත් අප ක්‍රිස්තුන් වහන්සේ වෙත යන ගමනට සාන්තුවරයින් බාධාවක් නොවිය යුතුය. මෙය පැහැදිලි කරන පාවුළු තුමා : "මරණයටවත්, ජීවිතයටවත්, දේව දූතයින්ටවත්, භූතාධිපතින්ටවත්, බලධාරීන්ටවත්, දැන් තිබෙන කිසිවකටවත්, මතු පැමිණෙන කිසිවකටවත්, අති උසටවත්, මහා ගැඹුරටවත්, මුළු විශ්වයේ අන් කිසි බලතාවයකවත් අපගේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළ ඇති දේව ප්‍රේමයෙන් අප වෙන් කළ නොහැකි බව ඒකාන්තයෙන් ම දනිමි" (රෝම 8:38-39). සාන්තුවර බැතිය ගැන අපට පහර ගසන අයට දිය හැකි හොඳම පිළිතුර නම් ශු. පාවුළු තුමා දුන් ඉහත සඳහන් පිළිතුරමයි.

---

**ගරු හෙන්රි සිල්වා පියතුමා**

# අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත



**පසුගිය සතිය හා සබැඳේ**

### අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත රචිත අරමුණ

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත සම්පාදනය කිරීමේ අරමුණ පිළිබඳව විවිධ මතිමතාන්තර විශාරදයන් අතර පවතී. විමසුම් නෙතින් බලන්නෙකුට බොහෝ ගති ලක්ෂණ විස්තරයෙහි අන්තර්ගත බව දැකිය හැකිය. ප්‍රථමයෙන්ම, එය ඓතිහාසික දැක්මක් සහිත ය. ශුද්ධාත්ම ආගමනයෙන් අනතුරුව, අපෝස්තුළුවරුන් මෙන්ම ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් ද සුපුවත දේශනා කිරීම ආරම්භ කළ අයුරු ක්‍රියා පොත පැහැදිලිව විස්තර කරනුයේ, ඒ ආශ්‍රිත පුද්ගලයන් ස්ථාන හා සිදුවීම් ද සඳහන් කරමිනි. එමනිසාම, අද ලෝකයේ වචනාර්ථයෙන් එය ඓතිහාසික විස්තරයක් ලෙස සැලකීම අපට කළ නොහැකිය. සැබැවින්ම එය, ධාර්මිකව අර්ථකථනය කරන ලද ඉතිහාසයකි. ඉතිහාසයේ දේව ධර්මයක් ලෙස එය හැඳින්වීම වඩා නිවැරදි ය. හේතුව වනුයේ, අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත, සුබාරංචිය දේශනා කිරීම සම්බන්ධ මුල් කාලීන සභාවේ දූත මෙහෙවර, හුදෙක් අනු පිළිවෙලින් ඉදිරිපත් කර ගැනීම පමණක් තම අරමුණ කර නො ගැනීම ය. එලෙස එය, දෙවන වැදගත් ගති ලක්ෂණය විමසා බැලීම වෙත අප යොමු කරයි.

මුල් කිතුනු සභාව සතු වූ ධර්මෝපදේශීය අංශයක් ද, අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙහි දක්නට ලැබේ. ධර්ම දේශනා, සුබවදන දේශනා කිරීම ආශ්‍රිත උපදේශයන්ගෙන් එය පිරී පවතී. ජුදා ජනතාව මෙන්ම අන්‍ය ජාතිකයන් ද (ජෙන්තීල) අතර දහම් දූත සේවාවේ දී භාවිතකළ ක්‍රම සහ විධි පිළිබඳව අපෝස්තුළුවරුන් ලත් අත්දැකීම් සම්භාරයක් ද එහි හොවා දැක්වේ.

එමගින් මෙම දූත සේවාවේ සංකීර්ණත්වය ආශ්‍රිතව මඟපෙන්වීම් මෙන්ම අනතුරු ඇඟවීම් ද සැපයීමට එය සමත් වෙයි. ඒ අනුව ගත් කල, එය විශේෂයෙන් සභාවේ සාංඝික ජීවිතය, දහම් දෙසීම හා බෙදා හදාගැනීම ඇසුරෙන් ඉදිරිපත් කරන, මාහැඟි ආකෘතියකි. කරුණු එසේ නම්, අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත, සභාවේ ප්‍රථම ධර්මෝපදේශ ග්‍රන්ථය ලෙස හැඳින්විය නොහැකිද?

☛ ලබන සතියට

---

**පූජා සතිය**
**පෙබරවාරි 23 - මාර්තු 02 දක්වා**

| | |
|---|---|
| 02 ඉරිදා | **සාමාන්‍ය සමයේ අටවන ඉරුදින**<br>(කොළ) යෙසායා 49:14-15<br>ගීතාවලිය 62:1,2, 5-8 1 කොරින්ති 4:1-5<br>මතෙව් 6:24-34 |
| 03 සඳුදා | (කොළ) 1 පේදුරු 1:3-9<br>ගීතාවලිය 111:1-2,5,6,9-10 මාක් 10:17-27 |
| 04 අඟහරුවාදා | **සා. කැෂ්මියර් මුනි අනුස්මරණය**<br>(කොළ/සුදු) 1 පේදුරු 1:10-16<br>ගීතාවලිය 98:1-4 මාක් 10:28-31 |
| 05 බදාදා | **චතාරික සමය - අළු බදාදා**<br>**(එක්වරු ශීලය රැකීම හා ගොඩ මස් වැළකීම)**<br>(දම්) ජෝවෙල් 2:12-18<br>ගීතාවලිය 51:1-4,10-13,15<br>2 කොරින්ති 5:20-6:2 මතෙව් 6:1-6,16-18 |
| 06 බ්‍රහස්පතින්දා | (දම්) ද්.නී. සංග්‍රහය 30:15-20<br>ගීතාවලිය 1:1-4,6 ලූක් 9:22-25 |
| 07 සිකුරාදා | (දම්) යෙසායා 58:1-9<br>ගීතාවලිය 51:1-4,16,17 මතෙව් 9:14-15 |
| 08 සෙනසුරාදා | (දම්) යෙසායා 58:9-14<br>ගීතාවලිය 86:1-6 ලූක් 5:27-32 |
| 09 ඉරිදා | **චතාරික සමයේ පළමුවන ඉරුදින**<br>(දම්) උත්පත්ති 2:7-9,3:1-7<br>ගීතාවලිය 51:1-4,10-12,15<br>රෝම 5: 12-19 මතෙව් 4:1-11 |

---

# "මාවත් දරුවාවත් බේරා ගන්න කියා ජපමාලය උච්චාරණය කළා"



අත්දුටිම්

මට ඉතා තද බල ලෙස අධික රුධිර පීඩනයත් තවද මගේ බෙල්ලේ ඇතුළතින් වායු ගෙඩියක් තිබී එය ද ශල්‍ය කර්මයකට භාජනය වුණා අවු. 20 පමණ. එම ශල්‍යකර්මය හේතුවෙන් දරු උපතකදී අනවශ්‍ය හේතු වලට මුහුණ පාන්න සිදුවෙන බව කලින් වෛද්‍යවරයා කියා තිබුණා. මුළු ශරීරයටම අවශ්‍ය අයිඩින් ප්‍රමාණය මගේ බෙල්ලේ එක් තැන්කර ගෙඩියක් වෙලා එය විශාල වෙන්න පටන් ගත්තා. අවු. 4 දී පමණ මට මෙය පෙන්නුම් කර නිතරම ක්ලාන්ත වන්නට පටන් ගත්තා.

කොළඹ මහ රෝහලේ ඊ.එන්.ටී. සායනයට මගේ අම්මා මාව ගෙන ගියා. කලින් පිළිකා රෝහලේ දී පරීක්ෂණ කරලා දැලි පිහිය කිට්ටු කරන්නවත් එපා කියලා විශේෂඥ වෛද්‍යවරයා අප හට පැවසුවේ ශල්‍යකර්මයක් කිරීම භයානක බවයි. වෛද්‍ය පරීක්ෂණ වලින් පසුව වැලිගම සුව සහනයේ දෙව්මැඳුරට බාර වුනා ජේසු සමිඳුන්ගේ ශ්‍රී හස්තයෙන් මේ ශල්‍යකර්මය කරන්න කියලා. ශල්‍යකර්මයට දින පා පසු රෝහලට ඇතුළත් වුණා. මාව හොඳටම ගැහුනා බයට. ජේසුටම තමයි මම යාච්ඤා කළේ මගේ අම්මයි අක්කයි කොළඹ කොටුවෙ සා. පිලිප්නේරි දෙව්මැඳුරේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරියෙහි ශු. පැය කළා ඒ මොහොතේ දී. ඒ භයානක ශල්‍යකර්මය ඉතාම සාර්ථකව කරලා මට සනීප වුනා. මා නිරෝගි වුණා. ජේසු සමිඳුන් තමයි මට සුවය දුන්නේ. ඒ 1996 වර්ෂයේයි.

මා 2006 විවාහ වූවා 2008 වසරේදී මා කුස දරුවකු පිළිසිඳ ගත්තා. අධික රුධිර පීඩනය නිසා කලින් කළ ශල්‍යකර්මය හේතුවෙන් මගේ කුසෙහි දරුවා ආබාධිත මළ දරු උපතක් වී එය නැති වුණා.

☛ 15 පිටුවට

---

# සතියේ මුනිවරයා

**ගරු ප්‍රැන්සිස් නිකලස් සේනානායක පියතුමා විසිනි**



**සා. කැෂ්මියර් මුනිතුමා - මංගල්‍යය මාර්තු 04**

**සා. කැෂ්මියර් මුනිතුමා** පෝලන්තයේ හතරවැනි කැෂ්මියර් රජතුමාගේ හා ඔස්ට්‍රියාවේ එළිසබෙත් රැජිණගේ පුත්‍රයා හා පෝලන්තයේ ඔටුන්න හිමි කුමාරයා ය. මෙම රජ කුමාරයා කුඩා කාලයේ දීම තමන්ගේ ජීවිතය හිමි තම පියාගේ රජකමට වඩා උසස් මෙලොව නොව එලොව රාජ්‍යයකට බව හොඳින් අවබෝධ කරගෙන සිටියේ ය. සියළු රාජ්‍ය සම්පත් භුක්ති විඳීමට හැම හැකියාවක්ම තිබියදී, කැෂ්මියර් කුමරා, රාත්‍රියේ දුෂ්කර කාලගුණය පවා නොතකා අසළ දේවස්ථානවලට ගොස් රෑ පහන් වනතුරුම යාච්ඤා කිරීමට පුරුදුව සිටියේ ය. එලෙසම, රාජ භෝජන වැළඳීම වෙනුවට දිනපතා එක්වරු ශීලය රැකීය. රාජකීය වස්ත්‍රාභරණ පැත්තකට දමා ලොම් වස්ත්‍රයක් ඇඳ ගත්තේ ය. නිදගත්තේ බිම එළාගත් පැදුරු කැබැල්ලකය. මුළු වටපිටාවම එතුමාව හාස්‍යයට ලක් කරද්දි එඩිතරව තමන්ගේ ඒ සරළ ජීවිතය ගත කළේය.

තම පුතාගේ මේ හැසිරීම් රටාවන් කිසිසේත් අනුමත නොකළ පිය රජතුමා රාජ්‍ය කටයුතු සඳහා ඔහුව සහභාගි කරවා ගැනීමේ අදහසින්, හංගේරියාව ආක්‍රමණය කරන යුද්ධය මෙහෙයවීම බාර දුන්නේ ය. කැෂ්මියර් මුනිතුමා කෙසේ වත් මෙම කාර්ය අනුමත නොකළත්, පියාට කීකරුවීමක් හැටියට යුද්ධ පිටියට පිටත් විය. නමුත් ඔහු හමුදවට හිතාමතාම නිසි නායකත්වය නොදීමෙන් සෙබළුන් එකිනෙකා යුද්ධ පිටිය හැර යද්දී ඉතා සතුටින් සතුරා ඉදිරියේ පසුබැස්සේය. මේ ගැන බලවත් සේ කිපුණ පිය රජතුමා කැෂ්මියර් කුමරාව රාජමාලිගයෙන් පිටුවහල් කොට වෙනත් ස්ථානයක නිවාස අඩස්සියේ තැබීය. නමුත් මේ කිසිවකින් කැෂ්මියර් මුනිතුමාගේ අධිෂ්ඨාන ශක්තිය හීන නොවී, පෙරටත් වඩා දැහැමි, කටුක ජීවිතයක් ගත කරමින්, සියළු සැප සම්පත් පරිත්‍යාග කරමින් දෙවියන් වහන්සේ උදෙසා පමණක් ජීවත් වීම එකම අරමුණ කරගෙන ජීවත් විය. රජ පවුලකින් ආ විවාහ යෝජනාව ද ප්‍රතික්ෂේප කලේ ය. වයස අවු. 23 දී එතුමා මිය යන තෙක්ම යාච්ඤවෙන් හා භාවනාවෙන් ද දිළිඳුන්ට උදව් වෙමින් ද, දේව මෑණියන් කෙරෙහි භක්තියකින් ද ජීවත් විය.එ තුමාගේ මරණින් වසර 122 කට පසුව කැනීම් වලදී දේහය කිසිසේත්ම නොදිරා තිබිණ. අද සමාජය තුළ බලය, ධනය පසුපස යන්නට උත්සාහ කරන තරුණ පරපුරට මේ සාන්තුවරයා ඉදිරිපත් කරන්නේ ඉතා වැදගත් පාඩමකි. එසේම නූතන දේශපාලනඥයින්ට එතුමා කදිම අභියෝග යකි. නැතිවී යන ලෞකිකත්වය පසෙක ලා සදා පවතින ආධ්‍යාත්මිකත්වයට මුල් තැන දීමේ වැදගත්කම අද සමාජය ඉදිරියේ මේ සාන්තුවරයා තබන මූලික පාඩමයි.

# මරිය වසරේ අත රැඳිය යුත්තේ ජපමාලය ද?, දුරකථනය ද?

හඬ

කතුතුමනි,

2014 වසර මරියතුමියට, ගෞරවය, භක්තිය වැඩිකිරීමට, ජනතාව තව තවත් යොමු කිරීමට, අතිඋතුම් සුදතුම් පියාණන් මරිය වසර ප්‍රකාශයට පත් කළේය. ඒ නිසාම දේවමාතාවන්ට නොයෙක් ආකාරයේ වැඩ සටහන් නොයෙක් පදවිවල දියත් කරනු දක්නට ලැබේ. එය දෙව්මව් භක්තිය දනවන සැමට සතුටට කරුණකි.

පසුගිය ජනවාරි මස 20 වන දින, මොරටුව සා. සෙබස්තියන් දෙව්මැඳුරේ 139 වන වසර පිරුණු වාර්ෂික මංගල්ලයට මමද සහභාගි වූයෙමි. ඇත්තවශයෙන්ම සෑම වසරකම එම මංගල්ලයට මා සහභාගි වන්නේ බදුල්ල වැනි පදවියක එවන් මංගල්ලයක් දකින්නට නොමැති නිසයි. මොරටු පුරවරයේ කතෝලික ජනතාව විශාල පිරිසක් සිටින බැවින් මෙම මංගල්ලය ඉතාමත් සාර්ථකව පවත්වන්නේ ඔවුන්ගේ දැඩි කැපවීම නිසයි. ඔවුන් ශු. සෙබස්තියන් මුනිඳුන්ගේ මැදහත්කමින් ලැබුන වරප්‍රසාදවලට දෙවිපියාණන් මහිමයට පත් කිරීමට ප්‍රසිද්ධියේ කරන ගෞරවය ඉමහත් ප්‍රීතියකි. ඇත්තෙන්ම ශු. සෙබස්තියන් මුනිඳුන් මොරටු පුරයෙන් ලබන්නාවූ පුද සත්කාර ඇකගැනීමට ලැබීමත් භාග්‍යයකි.

ගරු පියතුමන්ලා ශබ්ද විකාශන යන්ත්‍රවලින් ජනතාව ඇනුම්වත් කරමින් පැවසුවේ, යාච්ඤාවලට සහභාගිවෙමින්. ගීතිකා ගයමින්. වීදි සංචාරයේ යෙදෙන විට (ශු. සෙබස්තියන් මුනි ප්‍රතිමාව රැගෙන) අන් අයට ආදර්ශවන ලෙසටයි. සිදුවූයේ කුමක්ද? තරුණ අය අත මෙන්ම සමහර වැඩිහිටි අය අත ජපමාලය වෙනුවට රැඳී තිබුනේ බාල, මහළු, තරුණ, වැඩිහිටි අයගේ පමණක් නොව මග තොටේ සිටිනා යාචකයාගේ පවා අත රැඳි සෙල්ෆෝන් එකයි. දෙව්මැඳුරු තුළ බෝඩ් ගසා තිබෙන්නේ දුරකථන පාවිච්චියෙන් වළකින ලෙසටයි. ගරු පියතුමන්ලා ශබ්ද විකාශන යන්ත්‍රයෙන් ජපමාලය කියද්දී ඇතැමුන් දුරකථන සංවාදවල යෙදෙමින් පෙරහරේ ගමන් කළේ යාච්ඤාවෙන්, භක්තියෙන් ගමන් ගත් ජනතාවටද බාධා කරමිනි.

තරුණ විලාසිතා ගැන කතා කිරීමෙන් පලක් නැත. කුඩා දරුවන්ට පවා එම විලාසිතා පළඳවාගෙන පෙරහරේ ගෙන ගියේ චාම් ඇඳුමින් සැරසී පැමිණෙන ලෙස පැවසූ ගරු පියතුමන්ලාගේ අවවාදද නොසලකමිනි. මේ මරිය වසරේවත්, දෙව්මව්ට දක්වන ගෞරවය වචනයට පමණක් සීමා නොකර ක්‍රියාවෙන් පෙන්වුවහොත් යහපත් නේද? දිනයේ පැය 24 ම දුරකථන පාවිච්චි කරන අයට ආගමික කටයුතුවලදීවත්, මෙය ක්‍රියාවිරහිත කර, මරිය වසරේවත් ජපමාලය අතට ගත නොහැකිද?

මොරටුව සා. සෙබස්තියන් දෙව්මැඳුරේ ගායන කණ්ඩායම ගැන වචනයක් නොකීවොත් එය ඔවුන්ට කරනා නොසැලකීමකි. දේව මෙහෙයන් සියල්ලටම ඔබලාගේ දක්‍ෂතා දක්වමින්, දෙවිඳුන් දුන් තලෙන්තු උන්වහන්සේට තුති පිදීමට යොදාගත් ඔබලාගේ ඒ සුමිහිරි ගායනය, දේව මෙහෙයන්වලට සහභාගිවූ සැමගේ දෙසවන් පිනවූවාට කිසිම සැකයක් නැත. උත්සව කටයුතු සාර්ථකව සිදුකළ ගරු පියතුමන්ලාට අපගේ භක්ති ප්‍රණාමය.

**ශ්‍රී කාන්ති ගුණවර්ධන**
බදුල්ල

# පොල්තෙල් පහනේ කුකුළා වෙනුවට පරෙවියා යොදමු

කතුතුමනි,

ජාතික උත්සව අවස්ථාවන්හිදී පොල්තෙල් පහන දැල්වීම චිරාගත සම්ප්‍රදායයකි. පොල්තෙල් පහනෙහි හිස කුකුළා සළකුණෙන් පිළිබිඹුවේ.

වලි කුකුළා ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා ලෙස නම් කිරීමටත් පෙර සිට පොල්තෙල් පහනේ හිස කුකුළාගෙන් අලංකාරවී යැයි මගේ මතකයයි. කෙසේ වුවත් කිතුනු දෙව්මැඳුරු තුළ භාවිතවන පොල්තෙල් පහන කිතුනු සංස්කෘතික විලාසිතයකින් නිමැවුවහොත් උචිතයැයි හඟිමි.

පොල්තෙල් පහනින් කතෝලික අනන්‍යතාව පිළිබිඹු කිරීම සඳහා දෙව්මැඳුරු භාවිතයට ගැනෙන පොල්තෙල් පහනේ හිසට පරෙවි සළකුණ ආදේශ කිරීම උචිතයැයි මගේ හැඟීමයි. එවන් පොල්තෙල් පහනක් වග මීසමේ ජපමාල මෑණියන්ගේ දෙව්මැඳුරේ දැනට වසර හැටකට පමණ ඉහතදී පැවැති බවද සඳහන් කරනු කැමැත්තෙමි.

**එම්. ඩී. බෙන්ජමින්**
හොරණ

# පමුණුගම තලාහේන පේරුව එක්කර නව ප්‍රාදේශිය ලේකම් සහ ප්‍රාදේශිය සභාවක් ලබාදෙන්න

කතුතුමනි,

පමුණුගම ගම් ප්‍රදේශය මෙයට පෙර ගම් කාර්ය සහා බල ප්‍රදේශයක්ව තිබුණි. පසුව වත්තල ප්‍රාදේශීය සභාවට අයත් විය. තලාහේන පේරුවද මෙයට පෙර ගම් කාර්ය සභා බල ප්‍රදේශයක්ව තිබුණි. පසුව එම ප්‍රදේශයද වත්තල ප්‍රාදේශිය සභාවට අයත් විය. මෑතකදී තලාහේන පේරුව මීගමුව මහ නගර සභාවට සම්බන්ධ කරන ලදී.

පමුණුගම සහ තලාහේන පේරුව මුහුද, කලපුව සහ මුතුරාජ වෙලට මායිම්ව පිහිටි ගම් පියසකි. මෙහි පරම්පරාගත කතෝලික ජනතාවක් සිටින ගම් ප්‍රදේශයක් වන අතර සුළුතරයක් වන බෞද්ධයින් සමගද එකමුතුවෙන් ජීවත්වේ. ධීවර කර්මාන්තය. කෘෂිකර්මාන්තය. රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල මෙන්ම ස්වයං රැකියාවල සහ නොයෙකුත් ව්‍යාපාරවල නිරතවූවන් මෙමම ප්‍රදේශ දෙකේම ජීවත්වේ. පමුණුගම ප්‍රදේශයේ පර්යන්ත ඒකක රෝහලක්, පොලිස් ස්ථානයක්, කෘෂිසේවා මධ්‍යස්ථානයක්, ප්‍රධාන තැපැල් කාර්යාලයක් සහ ප්‍රධාන විදුහල් කීපයක්ද පිහිටුවා ඇත. කතෝලික දෙව්මැඳුරු මෙමම ප්‍රදේශ දෙකේම පිහිටා ඇත. බෝපිටිය, පමුණුගම නගරය වශයෙන් දියුණුවෙමින් පවති. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ බැංකු කීපයක්ද පිහිටා ඇත. කොළඹ මීගමුව යා කරන ප්‍රධාන බස් මාර්ගය හැමිල්ටන් ඇලට සමාන්තරව මෙමම ගම් ප්‍රදේශ දෙක හරහා වැටී ඇත.

මෙමම ගම් ප්‍රදේශ දෙකේ විවාහ කටයුතු, ආගමික කටයුතු සහ අධ්‍යාපන කටයුතු සඳහා එකමුතුකමක් පුරාණයේ සිටම දක්නට ඇත. මෙමම ප්‍රදේශ දෙකෙන්ම නියෝජ්‍ය අමාත්‍යවරු, පාර්ලිමේන්තු මංත්‍රිවරු, නගරාධිපතිවරු, ප්‍රදේශීය සභා උපසභාපතිවරු. නාගරික සහ ප්‍රදේශීය සභා මංත්‍රිවරු රැසක් බිහිවී ඇත. රාජ්‍ය දෙපාර්තමේන්තු, ආයතන ප්‍රධානින්, රදගුරු හිමිවරුන්, සභාවේ නොයෙකුත් නිලතල දරන පියවරුන් බිහිවී ඇත. මෙමම ප්‍රදේශ දෙක නියෝජනය කළ වත්තල හා මීගමුව පාර්ලිමේන්තු. පළාත්සභා, ප්‍රාදේශිය සභා නගර සභා මංත්‍රිවරුන් විශාල සේවයක් පසුගිය කාලය පුරා ඉටුකර ඇත.

පමුණුගම වත්තල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් පාලනය කරන අතර තලාහේන පේරුව මීගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් පාලනය කරමින් රජයේ අවශ්‍යතාවයන් සහ ප්‍රදේශයේ අවශ්‍යතා සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදුකෙරේ. පමුණුගම ඡන්ද දායකයින් 20,000 කට ද තලාහේන පේරුවේ 20,000 කට ද ආසන්න වූ ප්‍රදේශ දෙකෙ ජනගහනය ලක්‍ෂයකට වැඩියි. ඉහත කරුණු සහ රජයේ නිර්නායක පිළිබඳව අවධානය යොමුකර පමුණුගම - තලාහේන යනුවෙන් වෙනම ප්‍රාදේශිය සභාවක් නිර්මාණය කර පිහිටුවීමට කටයුතු කරන ලෙස වගකිව යුතු අයගේ අවධානය යොමු කරවමි.

**මොරිස් නානායක්කාර**
පමුණුගම

# දේශපාලනය පරම්පරා බූදලයක්ද ?

කතුතුමනි,

ශ්‍රී ලාංකීය දේශපාලන පරිසරය දෙස විමසුම් නුවණින් බලන විට අනෙකුත් රටවලට වඩා සුවිශේෂි වූ සිදුවීම් මෙරට දේශපාලනයේ දක්නට ලැබීම කැපී පෙනෙයි. ඒ අතර අති විශාල දේශපාලන පක්‍ෂ ගණනාවක් ලියා පදිංචි වී තිබීම, අති විශාල මැතිවරණ ගණනාවක් නිතර නිතර පවත්වමින් විශාල මුදල් ප්‍රමාණයක් කාබාසිනියා කිරීම, අති විශාල නියෝජිත ප්‍රමාණයක් ඉහල සිට පහලට නඩත්තු කිරීම, තාප්ප බිත්ති නාවමින් අති විශාල මුදල් ප්‍රමාණයක් වැයකරමින් පෝස්ටර් යුද්ධ පැවැත්වීම. එකම පක්‍ෂයේ නියෝජිතයෝ මනාප පොරයට ගොස් එකිනෙකා මරා ගැනීම සුවිශේෂි සිදුවීම් අතරින් කිහිපයකි.

මෙරට දේශපාලන සංස්කෘතියේ තවත් එවැනිම සුවිශේෂ වූ සිදුවීමක් දේශපාලනය පවුලේ බූදලයක් කර ගැනීම, සෑම මැතිවරණයකදීම පියවරු, ඔවුන්ගෙන් පසු පුත්තු, දූවරු, සහෝදරයින් දේශපාලනයට පිවිසීම ඉහල සිට පහලටම කැපී පෙනෙන ලක්‍ෂණයකි. ප්‍රජාතන්ත්‍රවාදි ජන සමාජයක සාර්ථකත්වයට ඕනෑම කෙනෙකුට දේශපාලනය කිරීමේ දේශපාලන නිදහස පැවතීම අගේ කරමු. නමුත් දේශපාලන පොර පිටියට පිවිසීමට ඕනෑම කෙනෙකුට අයිතියක් ඇති බවද සිහියේ තබා ගත යුතුය.

වර්තමානයේ මැතිවරණ පොර පිටියේ තරග කරන අපේක්ෂකයින් දෙස බලන විට ඔවුන් දේශපාලන වශයෙන් සම්බන්ධ පවුල් සංස්ථා පසුබිමකට සම්බන්ධ වීම කැපී පෙනෙයි. මෙමම තත්ත්වය ස්වාධීන පුද්ගලයකුගේ දේශපාලනය කිරීමේ අයිතිය කප්පාදුවී යාමක් ලෙසද තර්ක කළ හැකිය. වර්තමානයේ පියවරුන්ගේ දේශපාලන ජනප්‍රියතාවය පදනම් කරගෙන පුත්තු, දූවරු, සහෝදරවරු, ඥාතීන් දේශපාලන කරලියට පැමිණීම වේගවත් වී ඇත. මෙමම තත්ත්වය මෙරට ප්‍රධාන දේශපාලන පක්‍ෂ දෙක අතර කැපී පෙනෙයි. මෙවැනි දෑ දිනෙන් දින වැඩි වශයෙන් සිදුවීමේදී බොහෝ අය තේරුම් ගන්නේ දේශපාලනය පවුලේ බූදලයක් හා සමානය කියාය.

මේ තත්ත්වය ප්‍රජාතන්ත්‍රවාදි රටක අශෝභන සිදුවීමක් සේ අප සලකමු. එබැවින් දේශපාලනයට පිවිසීමට ඇති අයිතිය සෑම කෙනෙකුටම සමානව බෙදී යාමට සලස්වා මැතිවරණ වලදී මෙය පවුලේ බූදලයක් බවට පත් කරනොගෙන කටයුතු කරන්නේ නම් එය මෙරට දේශපාලනයෙහි සුන්දර දසුනක් වනු ඇත.

**අජිත් කමල්ප්‍රිය ජයලත්**
බොල්ලත

# කාන්තාවනි ! පඬුරු පෙරහරටවත් සංවර ඇඳුමක් අඳින්න

කතුතුමනි,

සුන්දර කාන්තා රුව වඩාත් ඔප් නැංවෙන්නේ සංවර ඇඳුමක් තුළින් බව සැබෑ සත්‍යයකි. එහෙත් අද කාන්තා පරපුර එන්න එන්නම ඇඳුමෙන් අසංවර වී ඇති බව සැමගේ පිළිග ැනීමයි. විවිධ තැන්වලට මෙන් දේවස්ථානයටද අප්‍රියජනක අසංවර ඇඳුම් ඇඳීම ඉතාමත් කණගාටුදායකය.

විශේෂයෙන් පඬුරු පෙරහරටද මෙමම අසංවර ඇඳුම් අවතීර්ණ වී ඇත. මේ මෑතදී පඬුරු පෙරහරේ පූප සහ මිදිරස රැගෙන ගිය යුවලගේ කාන්තාව අතිඋතුම් දිව්‍ය සත්ප්‍රසාදය ඇති මංජුසාව ගෙන ගියේ උඩුකයට හිරවූ කොට උඩ ඇඳුමකින් සහ ඉස්සරහ සහ පස්ස ඉලිප්පී කැපී පෙනෙන ඇඟටම හිරවූ කලිසමකින් සැරසීගෙනය. ඇයගේ හිසට වේල් එකක්වත් තිබුනේ නැත. ඇය දකින අපට දැනුනේ ඇය නිරුවතින් යනවාසේය. එසේම එය දකින අපට සිතුනේ ඇගේ සැමියාට ඇස් නැතිද යන්නයි.

කතෝලිකයන් වන අප මෙවැනි ආගමික ස්ථානයකදී කරන උතුම් කාර්යයේදී විශේෂයෙන් කාන්තාවන් ඉතාමත් සංවර ඇඳුම් ඇඳිය යුතු බව මගේ හැඟීමයි.



විශේෂයෙන් දෙමාපියන් හා සැමියන් මේ ගැන තම දියණීවරුන් මෙන්ම බිරින්දෑවරුන්වද දැනුම්වත් කිරීම අත්‍යවශ්‍යම වේ. එසේම මේ ගැන ඒකක නායක නායිකාවන්ද ඒ අය දැනුම්වත් කිරීම යුතුකමකි. ඒවගේම ගරු පූජකතුමන්ලා ඇතුළු වගකිව යුතු අයද මේ ගැන දැනුවත් කරන්නේ නම් ඉතාමත් අගනේය. එසේ නැතිනම් කතෝලික දහමේ භක්තිය ගෞරවය හා උතුම් පූජනීය බව මෙසේ කෙලෙසී ගොස් අනාගතයේදී ඉතිරිවන දෙයක් නැතිවේ.

දේවස්ථානයට සංවර ඇඳුම් ඇඳීම කාන්තාවන්ට අනිවාර්ය කළයුතු බව මගේ හැඟීම යි. මේ ගැන කීවොත් සමහර අය දිව්‍ය පූජාවට නොපැමිණීමට ඉඩ ඇත. එහෙත් බැහැපත් යහපත්සංවර ගෞරවනීය ජනතාවක් මිස විසිතුරු විලාසිතාවලට වහල්වූ කතෝලිකකමෙන් වැඩක් නැත. මේ ඇඟටම හිරවූ හිරිකිත කලිසම් ඇඳීම දේවස්ථානයට තහනම් කර අපේ උතුම් වූ කතෝලික දහම එහි ගෞරවය හා භක්තිය මතු පරපුර තුළ ජනිත කරවීම සඳහා පියවරක් ගන්නා මෙන් වගකිව යුතු සැමට ආයාචනා කරමි.

**අයිරාංගනී ලියනගේ**
පමුණුගම

# කතෝලික ජනතාව සමිඳුන් සමගය

කතුතුමනි,

2014 ජනවාරි 19 දින ප්‍රදීපය පුවත්පතේ ජනතා හඬ තීරයෙන් බෙලිහුල්ඔය පැට්‍රික් ආර්. ප්‍රනාන්දු මහතා විසින් කතෝලික ජනතාව කොයි බටද? යනුවෙන් වූ ලිපිය ගැන මුලින්ම සඳහන් කළ යුත්තේ ඒ ලිපිය මුළු මහත් කිතුනු සභාවට වගකිව යුතු සහ ඉමහත් අවමාන ගෙන දෙන ප්‍රකාශයක් බවය.

ඒ මහතා අපට ඉදිරිපත් කළ කරුණු සියල්ලම, මැණික් ගරන්නකු මැණිකක් සොයා ඉල්ලම් පස සෝදනවා සේ කතෝලික ජනතව කොයි බටද යනුවෙන් වූ ලිපිය තුළ සැඟැවුන පිළිතුර සොයා බොහෝ වෙහෙසුනෙමු. එහිදී අපට දැකගන්නට ලැබුනේ අසාධාරණ ලෙස මුදල් උපයන කුහක මිනිසුන්ගේ ගණයට කිතුනුවාද සමකර ඇති සැටියකි. තවද, එම තත්ත්වය හේතුකොට අන්‍ය ලබ්ධිකයන් විසින් කිතුනුවා නොපිලිග න්නා තත්ත්වයක් උදාවී ඇති බවත් සඳහන් කර ඇත. ඒ තත්ත්වය හමුවේ කිතුනුවා දෙවියන්වහන්සේ ඉදිරියේ වග උත්තර කරුවන් කර ඇත. එතැනින් නොනැවතුන ලියුම් කරු කිතුනුවා මෙලොව සියළුම සැප සම්පත් පවුලේ අඹු දරුවන් සහ මළවුන් අතර බෙදා ගන්නවා මිස අන් අය ගැන තැකීමක් නොකරන බවට අස්ථාන චෝදනා කරන්නේ හුදෙක් සමස්ත කිතුනුවා කෙරෙහි දැවෙන ක්‍රෝධ සිතකින් බව අපට එක එල්ලේ ප්‍රකාශ කළ හැක. කිතුනුවා කොයි බටද යනු ඒ ලිපියෙන් අපට උගන්වන යුක්තියේ සාධාරණත්වය, සමානත්වය සහ එඩිතර කැපවීම තුළින් කිතුනු ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ කාලය යළි උදාවී ඇතැයි පැවසීමෙන් ගම්‍ය වන්නේ කිතුනුවා තරම් දුර්ගුණැති ජනකොටසක් අනිකුත් දහම් අතර නැති බවය.

අවසන් වශයෙන් අපට කිවහැක්කේ මුළු ලෝකය තුළ අන්‍යලබ්ධිකයන්ගේ හිරිහැර තාඩන පීඩන සහ කිතු දහම ඇදහීම හේතුකොට දෙවියන් වහන්සේ වෙනුවෙන් ජීවිතය පූජාකරන්නට සිදුවෙන එමෙන්ම සතුරන්ට ප්‍රේමකරන ජන කොටසක් ඇත්නම් ඒ කිතුනුවන් මිස වෙන කවුරුද? එසේ නම් පැට්‍රික් මහතා සොයන කතෝලික ජනතාව, සියළු තැන්හී සමිඳුන් සමග බව, පෙන්වා දිය හැක.

**පී. වී. ඩී. ලුවී මයිකල්**
කපුවාගාර

# සහභාගිශීලි සභාවක් හා කුඩා කිතුනු සංඝ



අප දැන් පසු කරමින් සිටින්නේ "විශ්වාසයේ දස වසරයි" මෙමෙ වසර වචනයට පමණක් සීමා නොවිය යුතුය. කිතුනු ජනතාව විශ්වාසයෙන් සන්නද්ධ වී දේව රාජ්‍යය ගොඩනඟන්නට යථාර්ථයෙන් සභාව තුළ ක්‍රියාකාරී විය යුතුය. නිද්‍රාශීලි භාවයෙන් අපි මිදිය යුතු වෙමු. විශ්වාසයේ වසර අරුත් ගැන්වෙන්නේ එවිටය.

1990 දූත සේවා පිළිබඳ දෙවන ජුවාම් පාවුළු සුදොතුම් පියාණන්ගේ නියමයන්ට අනුව "සහභාගශීලි සභාවක්" තුළින් දේව රාජ්‍යය ගොඩනැංවීමෙ අරමුණින් ක්‍රිස්තු කේන්ද්‍රිය ජනතාවක් ලෙස කුඩා කිතුනු සංඝ (අසිපා) බිහි කිරීමට අඩිතාලම දැමුනි. එලෙස අවුරුදු 20 ක පමණ කාලයක සිට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන මෙමෙ කුඩා කිතුනු සංඝ ක්‍රියාදාමය සම්බන්ධයෙන් අප කතෝලික ජනතාව දක්වන ආකල්ප හා ඊට ලැබෙන ප්‍රතිචාර පිළිබඳවද විමසා බැලීම වටී.

කුඩා කිතුනු සංඝයක් යනු පවුල් 12 කින් 15 කින් පමණ සමන්විත කුඩා කණ්ඩායමකි. සත් පියවරකින් යුත් මෙමෙ ක්‍රියාදාමය සතියකින් නැතහොත් දෙසතියකින් හමුවී ක්‍රිස්තුන් වහන්සේ මැදිකරගෙන (ශු. බයිබලයට මූලිකත්වය දෙමින්) දේව වචනය කියවා, මෙනෙහිකර, එකිනෙකා අතර තම ජීවිත අත්දැකීම් ඊට අදාළව බෙදාගෙන අර්ථවත් ජීවිත ක්‍රමයකට ප්‍රවේශ වීමය. දේව වචනය පවුල තුළ, සමාජය තුළ ජීවත් කරවීමය. පුද්ගලයෙක්, සංඝයක් හා මීසමක් වශයෙන් ජනතාව ආධ්‍යාත්මිකව ගොඩනැංවීම උසස් ක්‍රියාදාමයකි.

සහභාගශීලි සභාවක් කරා යන ගමනේ දී එය වචනයට පමණක් සීමා නොවී අර්ථාන්විතව ක්‍රියාවට නංවන්නේ නම් ක්‍රිස්තුන් වහන්සේ තුළ විශ්වාසයේ හා ප්‍රේමයේ ජනතාවක් වශයෙන් ඵල දරනු ඇත. පසුගිය වසරේදී අපි "දේව වචනයේ වසර" ලෙස අත්දැක්කෙමු. එය අදාළ කාලයට පමණක් සීමා වූවාද නැතහොත් අප ජීවිත වලට යථාර්ථයක් වූවාදැයි මොහොතක් හැරී බලමු. කුඩා කිතුනු සංඝ මාර්ගයෙන් දේව වචනය ජනතා හදවත් වලට දැනෙන ආකාරයෙන් ජීවිත තුළට ළං කර ගැනීමට වෙහෙස වූවාද යන්න ප්‍රමාද වී හෝ ආවර්ජනය කර බැලීම කාලෝචිතය. දේව වචනයෙන් ජනතාව පොහොණි කිරීමට පියවර ගත්තද යන්නත් බැලීම සුදුසුය.

මීසම් ගොඩනැඟීමේ දී කුඩා කිතුනු සංඝ මහත් පිටිවහලක් වෙනවා ඇත. මීසමේ පියතුමාට පමණක් මෙය තනිව කළ නොහැකිය. මීසම් ජනතාව පියතුමා සමඟ අත්වැල් බැඳගැනීම අවශ්‍යය. සහභාගශීලි ජනතාවක්, කිතුනු සංඝ එකමුතුවකින් ගොඩනැඟුන මීසමක්, ක්‍රිස්තුන් වහන්සේට සාක්ෂි දරණ ජනතාවක් ගොඩනැඟෙන්නේ එවිටය. අපට දී තිබෙන තලෙන්තු වලින් අපි මුහුන් විය යුතු වෙමු. සෑම ඉරුදින මෙන් බොහෝ විවිධ අවස්ථාවන්හිදී අපි දේව වචනය කියමු. අසමු. මෙනෙහි කරමු. ඒ තුළින් ජීවිත වෙනසකට උත්සාහකර තිබේ ද කියා සිතා බැලිය යුතු අතර, සෑහෙන කාලයක සිට මෙරට ක්‍රියාත්මක වන කුඩා කිතුනු සංඝ ක්‍රම වේදය කෙරෙහි ජනතාව පෙළ ගස්වා අවබෝධයක් ලබා දී ජනතාව සවිමත් කර හදවත් ග්‍රහණය කර ආධ්‍යාත්මික පෝෂණයකට මං සැලසීම වටී.

මීසම් වශයෙන් ගත් කල, මීසම් 200 කට නොඅඩු ප්‍රමාණයක් තිබෙන විශාලතම පදවිය වන කොළඹ අගරදගුරු පදවිය තුළ කුඩා කිතුනු සංඝ කෙතරම් දුරට ව්‍යාප්ත වී තිබේ ද යන්න ප්‍රශ්නයකි. තවද ලංකාවේ කතෝලික ජනගහනයෙන් 50% ක් පමණ සිටින්නේ ද කොළඹ පදවියේ බව දත්ත සටහන් කරයි. කිතුනු සංඝ ව්‍යාප්තිය දෙස බැලුවහොත් දෑතේ ඇඟිලි ප්‍රමාණයටවත් තිබේදැයි වටහා ගත නොහැකිය. හොඳින් ක්‍රියාත්මක වන මීසම් ඉතා සුළු ප්‍රමාණයක් තිබෙන අතර ඒවායේ ක්‍රියාකාරිත්වය ගැන පැසසිය යුතුය. අදාළ පියතුමන්ගෙන් ලැබෙන දායකත්වය අගේ කළ යුතු වෙමු.

කුඩා කිතුනු සංඝ හයවන ආසියානු සම්මේලනය පසුගිය වසරේ ඔක්තෝබර් මාසයේ දී ලංකාවේ දී පවත්වන්නට යෙදුන අතර, එයට වැඩි ජනතාවක් හලාවත, මන්නාරම, යාපනය පදවි වලින් සහභාගි වීම විශේෂත්වයකි. එම තේවත්තේ අවසාන රැළියේදී, අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් පවසා සිටියේ කාලීනව මෙමෙ උතුම් සේවාව, දේව රාජ්‍යය ගොඩනැඟීමෙහි ලා අතිශය වැදගත් වන බවත්, එය ශ්‍රී ලංකාව පුරා කිතුනු ජනතාව වෙත ගෙනයාම ගිහි පැවිදි සැමගේ යුතුකම බවත් ය. අප නව සසුනිසුරාණන් වන අති උතුම් ප්‍රැන්සිස් සුදොතුම් පියාණන් ද, ගතානුගතිකත්වයෙන් මිදී ජනතාව වෙත වඩාත් ළං වෙමින්, සරල දිවි පැවැත්මක් තුළින් දේව රාජ්‍යය ගොඩනැංවීමෙලා ක්‍රියාවෙන්ම, ආදර්ශවත් වීම විශ්වීය මුළු මහත් කිතුනු ජනතාවට මහත් අස්වැසිල්ලකි. එතුමාණන් අනුව යමින් අපිදු එක හිතින් දේව වචනය මත ජීවිත පරිවර්තනයකට කැපවීමෙන්, වැයවීමෙන් ක්‍රිස්තුන් වහන්සේ තුළ සාක්ෂි දැරීමට උත්සාහ ගනිමු. ජනතාවට මුහුන් වීමට අධිෂ්ඨාන කරගනිමු.

**ජ්. ටී. මයිකල් සිල්වා**
හපුගොඩ

# අද මීසම් වලින් බැහැරව ඇති

දශක හත අටකට පෙර මෙරට කතෝලික ජනතාවට ආගමික අවශ්‍යතාවන් සඳහා ගරු පියවරුන්ගේ සේවය ලබා ගැනීම අද තරම් පහසු නොවීය. එදා කතෝලික ජනතාවට අවැසි ආගමික සේවාව සඳහා බොහෝ දුරට කැපවූවෝ විදේශ වලින් පැමිණි සුදු ජාතික ගරු පියවරු බව නොදන්නෙක් ද සිටිය හැකිය.

ජාති, කුලමල, ආගම් භේද, තරාතිරම් කිසිත් නොබලා රජයේ රෝහල් රාශියක සාත්තු සේවයේ යෙදුනේ ද විදේශ වලින් පැමිණි සුදු ජාතික පැවිදි සොයුරියෝ යැයි කීම නිවැරදිය. එම සොහොයුරියෝ තම දිවි පරදුවට තබා සමාජයෙන් වෙන් කර තබන ලාදුරු, වණ, පිළිකා, වසූරිය, කොළරා වැනි බෝවන රෝගවලින් පෙළෙනන්ට සාත්තු සප්පායම් කළ ආකාරය අද තත්ත්වය අනුව ඇසින් නුදුටු කෙනෙකුට විශ්වාස කළ නොහැකි තරමය.

## දුටු සිදුවීමක්

1943 දිනක කොළඹ මහ රෝහලට රාජකාරියක් වෙනුවෙන් රෝගියෙක් රෝහල් ගත කිරීමට මා යා යුතු විය. එය සඳහා රාජකාරි ලියවිලි සමඟ රෝගියා රැගෙන නියමිත වාට්ටුවට ගියෙමි. එවෙලේ එතැන සාත්තු සේවය බාර රාජකාරියේ නියැලී සිටියේ සුදු ජාතික පැවිදි සොහොයුරියකි. මා රැගෙන ගිය රෝගියා තම බාරයට ගත් එතුමිය ලෙඩාව ට්‍රොලියෙන් බස්වා නියමිත ඇඳෙහි තැබීමට යත්ම රෝගියා වමනය දැමීමට ලැස්ති විය. වහා ක්‍රියාත්මක වූ පැවිදි සොයුරිය වමනය දැමීමට තම සුදෝ සුදු දෝත අල්ලමින් ළඟ සිටි සේවකයාට නියමිත භාජනය රැගෙන එන ලෙස අණ කරත්ම ලෙඩා දෝතට වමනය දැමීය. සේවකයා රැගෙන ආ භාජනයට දෝතෙහි වූ වමනය හෙලූ එතුමිය එතැනෙහි තිබූ ජල නලයෙන් දෝත සෝදාගෙන කිසි අමුත්තක් නැතිව යළි සේවයේ නියැලුණේ මා සමඟ රාජකාරියට පැමිණි අකතෝලික සොහොයුරු නිලදරුවාද විමතියෙන් බලා සිටියදී ය.

## එදා ගරු පියවරු හා පූජා ධ්‍යානය

එම යුගයෙහි මීසම්වල සේවය කළ ගරු පියවරු ද තම මීසමේ විශ්වාසික ජනතාවගේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ඉතා ඥානාන්විත විධි විධාන ක්‍රියාත්මක කළහ. අද තත්ත්වය හා ඇති පහසුකම් අනුව එම විධි විධාන ක්‍රියාත්මක නොවුනත් එදා තත්ත්වයට ඒවා අත්‍යවශ්‍ය බව අද ද බොහෝ දෙනෙක් පිළිග නිති. දේව පනත් 10 යට පවුල් පිටින් එයට සහභාගි වී පනතේ ආධ්‍යාත්මික සුවය ලැබූහ.

## බාර නුවාන

දිවයිනේ සෑම දෙව්මැඳුරක්ම කැපකර ඇති තත්ත්වය අනුව වාර්ෂික මංගල්‍යය පැවැත්වීම ආදියේ පටන් පැවැත්වෙන සම්ප්‍රදායකි. එම මංගල්‍යය දෙව්මැඳුර අයත් සෑම



වශයෙන් ගතහොත් ජනවාරි 20 හෝ 27 මංගල්‍යය පවත්වන දෙව්මැඳුරක් නම් මංගල්‍යය දිනට පෙර පොදු නොවාන දින ගණනට සහ අවසාන සන්ධ්‍යා මෙහෙය (වෙස්පස්) සඳහා දින ගණන හැර එයට පෙර බාර නොවාන ආරම්භ කෙරේ. මාසය පුරා පැවැත්වීමට බැරි තරම් බාර නුවාන වැඩිවන අවුරුදුවල මංගල්‍යයෙන් පසුද

අමතරව ශුද්ධවූ සභාවේ පනත් ද විය. ඒ අනුව ඉරුදිනත් ණය මංගල්‍ය දිනවලත් මුළු පූජා ආරාධනා ඇසිය යුතුය යන්න ඉන් එකකි. එම පනත අනුව සෑම බැතිමතෙක්ම එයට අවනත විය යුතුය. එදා තිබුණු ගමනාගමන අපහසුවත් ගරු පියවරුන්ගේ හිඟයත් නිසා සෑම කෙනෙකුටම එය කළ නොහැක්කක් විය. එම අවශ්‍යතාව ආධ්‍යාත්මික හැම කෙනෙකුටම සපුරාලීමට හැකිවන පරිදි දිව්‍ය පූජාව පැවැත්වෙන, ගරු පියතුමකු වැඩ වසන දෙව්මැඳුරක හැතැප්ම තුනක් ඈතින් ඇති සෑම දෙව්මැඳුරකම එදා පූජා ධ්‍යානය පැවැත්වීමට විධි විධාන යෙදිනි. අන්නාවි මහත්වරු මෙහෙය වූහ. යාගත නොහැකි විශ්වාසිකයෝ බැතිමතකුටම ගමේ මෙන්ම පවුල්වල ද විශේෂ උත්සව දිනකි. එම උත්සවයට සූදානම් වීම සඳහා දින 3 ක් 7 - හෝ 5 ක් සන්ධ්‍යා මෙහෙයන් පවත්වති. සන්ධ්‍යා නොවාන පැවැත්වෙන දින ගණන සීමා වන්නේ දෙව්මැඳුරට අයත් ජනගහන පදනම් මතය. එම නුවානය ගමේ පොදු නොවාන වේ. පවුල් ගණන වැඩි දෙව්මැඳුරුවල මංගල්‍යය පවත්වන මාසය පුරාම සන්ධ්‍යා නොවාන පැවැත්විය. ඒවා පවත්වන්නේ ඒ ඒ පවුල් විසිනි. එම නුවාන හැඳින්වූයේ බාර නොවාන නමිනි. පවුල් වලට එම අවුරුද්ද තුළ ලැබුණ දේව වරප්‍රසාද වලට ස්තුති දීමක් හෝ බාරයක් වශයෙන් පැවැත්වේ. උදාහරණයක් එම නොවාන පැවැත්වේ.

## මරිය මව් බැතිය

දශක හත අටකට ඉහත දේවමාතා බැතිය අදට වඩා ගෞරවාන්විත තත්ත්වයක පැවැත්වී යයි කියනවාට වර්තමානිකයෝ උරණ නොවෙත්වා. එදා දේවමාතා ප්‍රතිමා ගෙයින් ගෙට වැඩම කරවීමක් තිබුණේ නැත. ඒ වෙනුවෙන් ගමේ බැතිමතුන් බාර නොවාන ක්‍රමයට දෙව්මැඳුරට එක්ව මාසය පුරා නොවාන පැවැත්වූහ. ජපමාලය උච්චාරණය කර දේව මාතා ප්‍රාර්ථනාව කියා ගීත ගායනා කිරීම ප්‍රධාන කාර්යය විය. ගරු පියතුමෙක් දෙව්මැඳුරේ නේවාසිකව සිටියත් නැතත් අන්නාවි මහත්වරු

# කිතුනු නවෝදයට ධර්

මීසම් ධර්ම සේවා සභාවක් යනු කිතුනු සහෝදර හවුලකි. දේව සේවයට කැපවන පිරිසක් ගන්නා තීරණ ක්‍රියාත්මක කරන සාමුහික බලයකි. ආධ්‍යාත්මික කාර්යයක යෙදෙන සහෝදරත්වයකි.

මීසම් ධර්ම සේවා සභා ස්ථාපනය පිළිබඳ යොමුව ප්‍රකාශය හා උපදේශය නමැති පොතේ මීසම් ධර්ම සේවා සභා පිළිබඳ හඳුන්වා දී ඇත්තේ ඉහත පරිදිය. මීසම් ධර්ම සේවා සභාවක් පිහිටුවීමේ මූලික අරමුණ වනුයේ මීසම තුළ සහභාග ශීලි සභාවක් ගොඩනැංවීමත් සමස්ත කතෝලික සභාවේ ධර්මදූත සේවා අඛණ්ඩව ඉදිරියට ගෙන යාමත් සභාවේ දූත මෙහෙවර සම්බන්ධිකරණය කිරීමත් ක්‍රිස්තු දූත මෙහෙවර ප්‍රකාශ කිරීම මීසමේ කුඩා කිතුනු ඒකක පිහිටුවීම ජනවන්දනා පිළිවෙතේ හා ධර්මෝපදේශය දීම මීසම් ධර්ම සේවා සභාවට පැවරෙන මූලික කාර්යයන් වේ.

එසේ වුවද වර්තමාන මීසම් සභා තුළින් මෙමෙ කාර්යයන් සිදුවෙනවාද කියා සොයා බැලීම අවශ්‍යය. මීසම් සභාවල වැඩි සාමාජිකයින් ප්‍රමාණයක් වයස අවු. 40 - 50 ඉක්මවූවන්ය. ඔවුන් සැමවිටම මීසමේ පියතුමාට පක්ෂපාතිත්වය දක්වමින් සෑම දෙයටම එහෙයි කියන පිරිසක් වීමත් මංගල්‍ය අවස්ථාවලදී මුල් තැන ගැනීමත්, පහන් පත්තු කිරීමත් ඉදිරි පෙළ අසුන් ලබා ගැනීමට හා ප්‍රතිමාව උසුලාගෙන යෑමටත් මීසම තුළ විශේෂ වරප්‍රසාද ලත් කොටසක් ලෙස හැසිරීමට උත්සාහ කිරීමත් ය. (නායකයා සේවකයා විය යුතුය යන්න ඔවුන්ට අමතක වී ඇත.)

මීසම් ධර්ම සේවා සභාව සුපිරි කමිටුවක් නොවේ. ආදි පිතුරු මණ්ඩලයක් නොවේ මීසම් පියතුමාගේ සහෘද එකතුවක් නොවේ හුදෙක් පරිපාලන කමිටුවක් නොවේ පූජක ආධිපත්‍යයට හෝ ගිහි ආධිපත්‍යයට නතුවන්නක් නොවේ

මීසම් ධර්ම සේවා සභාවේ යථාර්ථය මූලික කාර්යය වනුයේ මීසම සාංඝික ඒකත්වයක් බවට පත් කරමින් දේව රාජ්‍යයේ ඉල්ලීම සපුරාලීමය. කුඩා කිතුනු ඒකක පිහිටුවා ගිහියන් සතු විවිධ සම්පත් උපයෝගී කරගනිමින් සභාවේ යහපතට කටයුතු කිරීමත්ය (පිටු අංක 12)

මීසම් ධර්ම සේවා සභාවලට පත්වන සාමාජිකයින්හට එහි මූලික අරමුණු හා කාර්යයන් පිළිබඳව නිසි අවබෝධයක් නැති බව හැඟේ. එමෙන්ම මීසම් සභා තුළ නොකඩවා වසර 20 හෝ 25 වශයෙන

# පැරණි සංවිධාන ක්‍රම

නොවානය මෙහෙයවූහ. මැයි මාසයේ අවසාන ඉරුදින හෝ ගරු පියතුමාට පැමිණීමට පිළිවෙළ කරගත හැකි ඉරුදිනක මංගල්‍යය පැවැත්වූහ. එය දෙව්මැඳුරේ වාර්ෂික මංගල්‍යය තරමටම උත්කර්ෂවත් අන්දමට පැවැත්වීමට කවුරුත් උනන්දු වූහ. එදා දෙව්මැඳුරු බොහොමයක අද මෙන් විදුලි ආලෝකය නොවීය. රාත්‍රි



මෙහෙය වලදී දෙව්මැඳුර ආලෝකවත් කිරීමට හා ගායනා කණ්ඩායම සඳහා බාර නොවාන බාර ගන්නෝ රු. 2.50 - 5 ක් හෝ රු.7.50 ක් වැනි සුළු මුදලක් ගෙවූහ.

## ...ළමා වෙන්දේසි

වාර්ෂික මංගල්‍යයේ පූජා මෙහෙයෙන් පසු දෙව්මැඳුර කැපව ඇති සාන්තුවර ප්‍රතිමාව රැගෙන වීදි සංචාරය කිරීම අද මෙන්ම එදා ද සිරිත විය. මංගල පූජාවට සහභාගි වීම අතපසු වූවත් පෙරහරේ ගමන් කිරීම නම් කළ යුත්තක් ලෙසම සැලකුවෝ ද වූහ. වීදි සංචාරය නිමවා ප්‍රතිමාව දෙව්මැඳුරට සැපත්ව ආශිර්වාද ලැබීමෙන් පසු ලෙඩ රෝග වලින් පෙළෙන කුඩා දරුවන්ට පවා යත් ඉදිරි වර්ෂයේ දරුවන් ලෙඩ රෝග වලින් රැක දෙන ලෙසත් යදිමින් සමහර මව්පියෝ දරුවන් "වෙන්දේසි" කරති.

එය ක්‍රියාත්මක කරන්නේ පවුලේ වැඩිහිටියෙක් හෝ අන්නාවි මහතෙකි. වෙන්දේසි කරන දරුවා අතට ගන්න ඔහු දෙව්මැඳුර කැප කර ඇති සාන්තුවර නම කියා දරුවා වහලෙක් ලෙස වෙන්දේසිය අරඹයි. මව්පියෝ ලංසුව තබති. ලංසුව අරඹන්නේ පනමෙන්. එදා පනමක වටිනාකම සත 6 කි. අවට සිටින පවුලේ හිතවත් වූවන් හා දරුවාගේ නෑයෝ ලංසු තබමින් ඉල්ලති. බොහෝ අවස්ථාවල වෙන්දේසිය පනම් 12 ට නැග්ග පසු (පනම 12. සත 75) වෙන්දේසි කර ඇවරයි ඇවරයි තුන් ඇවරයි කියා වෙන්දේසිය හමාර කරයි. මව්පියෝ එම මුදල සාන්තුවර පාමුල ඇති කැටේට දමා දරුවා ලබා ගනිති. එයට වඩා වැඩි මුදලට වෙන්දේසි වන අවස්ථා ද ඇත.

## දඬුවම් දීම

මීසම් වාසි දෙපළක් තුළ අනාචාරාත්මක සිද්ධියක් එළිදරව් වූ විට එදා අදට වඩා දැඩි පිළිවෙතක් සභාව අනුගමනය කළහ. හැසිරීමට භාජනය වූ දරුවන්ගේ මව්පියෝ ද වරදකරුවන් ලෙස ගණන් ගනු ලැබූහ. නියාමාකාරයෙන් වරදට දඬුවම් විඳ වරද නිවැරදි කරගන්නා තුරු සභාවෙන් ඔවුන්ට නොමිලේ හිමිව ඇති වරප්‍රසාද කිසිවක් දෙනු නොලැබේ. මුල්ම යුගයෙහි අනාචාරාත්මක සිද්ධියට මුහුණ පෑ අය සමාව ලැබීමට ඉරුදින දිව්‍ය පූජාව ආරම්භ වීමට පෙර සෙනඟ රැස්ව බලා සිටියදී සීනුව නාද වෙද්දී කුරුසයක් හෝ ඉටි පහනක් අතින් ගෙන දෙව්මැඳුරට ඇතුළු විය යුතුය. තවත් අවස්ථාවල කුරුසයක් අතේ තබා ගෙන ඉරුදින දිව්‍ය පූජාව නිමවෙන තුරු පූජාසනය ඉදිරිපිට මහ පල්ලියේ දණ ගසාගෙන සිටිය යුතුය.

තවත් යුගයක දී ගරු පියතුමා ඉරුදින පූජාවට පූජාසනයට පැමිණෙන විට වරදට වැටුන දෙදෙනා පූජාසනය ඉදිරිපිට සිටියදී අන්නවි මහතෙක් වරද ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර එම අය සභා නීතිය අනුව සමාව යදින බව පියතුමාට දන්වයි. මෙවැනි අවස්ථාවලින් පසු විවාහයක් ලියාපදිංචි කිරීමේ නීතිගත ලියවිලි සම්පූර්ණ කර ඇත්නම් පූජාවෙන් පසු මහ පල්ලිය තුළ නොව පල්ලිය තුළ පැත්තකදී සභා නීතිය අනුව විවාහය ලියාපදිංචි කර වරද නිවැරදි කෙරේ. සභා ශ්‍රේෂ්ඨයන්ට හිරිහැර කිරීම අවමන් කිරීම වැනි වරද වලදී ගරු පියතුමා පූජා ආයිත්තමෙන් සැරසී පූජාසනයට වඩින විට ඉදිරියට ගොස් දණ නමා සමාව යැදිය හැකිය. දරුවන්ගේ වරදට මව්පියෝ වගකිවයුත්තන් ලෙස ගණන් ගනු ලැබූ වැරදි වලදී ඔවුන්ට තමන්ගේ හැකියාවන් හා තත්ත්වය අනුව සභාවේ පොදු වැඩකට වන්දියක් ගෙවා සමාව ගත යුතු විය. වන්දි ප්‍රමාණය තීරණය කළ යුත්තෝ ද ඔවුන්මය. මොන වරදක් නිසා හෝ සභාවෙන් සමාව ලැබීමෙන් පසු එම පුද්ගලයා කිසිම වරදකට දඬුවම් ලැබූවෙකු ලෙස මොනම අවස්ථාවකදීවත් සලකන්නේ නැත.

## පෙර නම් කීම

විසි වැනි සියවසේ 5 වැනි දශකය වනතුරු කතෝලික දෙව්මැඳුරුවල සිදුකෙරුණ සියලුම විවාහ වලදී ඉරිදා තුනක් පෙර නම කීමේ සිරිත පැවැත්තේ ය. ආදි යුගයේ පටන් කතෝලික සභා විවාහ බන්ධනය ශුද්ධවූ බන්ධනයක් ලෙස පිළිගෙන ඇත. ශු. ස්නාවක ජුවාම් තුමා හිස ගැසුම් කැවෙත් එම ශුද්ධවූ බන්ධනයට ගරු කිරීමේ වැදගත්කම හෙරෝද් රජට වටහා දීමේ ප්‍රතිඵලය නිසා බව ශුද්ධවූ බයිබලයේ දැක්වේ. "දෙවිඳුන් කළ බන්ධනය මිනිසා වෙන් නොකෙරේවා"යි කියා ඇත්තෙත් එම නිසාය. සාර්ථක විවාහ ජීවිතයකට බාධාවක් ලෙස සැලකූ ලේ නෑකම, විවාහ නෑකම, ඥාන නෑකම ආදි විවිධ බාධාවන්ගෙන් කතෝලික විවාහයන් ආරක්ෂා කර ගැනීම සඳහා විවාහයට පළමු පෙර නම් තුන් වරක් කීම සභා ශ්‍රේෂ්ඨයෝ එදා ඇති කළ විධි විධානයකි. පෙර නම් කීම නිසා විවාහ වීමට අදහස් කරන යුවළගේ හතර වරිගය හැඳින්වීමෙන් ශුද්ධවූ සභා නීතිය අනුව පිළිගැනෙන විවාහ බාධා එම අය තුළ ඇති නැති බව පිළිබඳ එදා සේවයේ සිටි විදේශීය ගරු පියතුමන් දැනුම්වත් කිරීමක් එයින් අදහස් කළා විය හැකිය.

**ඇන්ටනි බෙනඩික්**
එඬේරමුල්ල

# ...ම සේවා සභා

...රැඳී සිටින පුද්ගලයින් ද සිටි එසේ වන්නේ මීසම් සේවක පියතුමන් මාරුවීමේ දී පැමිණෙන නවක පියතුමා පවතින මීසම් සභාව එසේම පවත්වාගෙන යෑම නිසාය.

මීසම් ධර්ම සේවා සභාවක සාමාජිකත්වය හා සුදුසුකම් මෙසේ ය.

★ මීසමට අයත් වයස අවු. 18 ට වඩා වැඩි ඇදහිලිවන්ත බැතිමතුන් වීම, ★ වගකීම් භාර ගැනීමට ද නීති රීති වලට යටත් වීමට ද සූදානම් විය යුතුය., ★ මීසමේ පියතුමා හා පැවිදි නියෝජිතයින් හැර සියලු සාමාජිකයින්ගේ සාමාජිකත්වය වසර 05 කට සීමා වේ. ★ සාමාජිකයකු ඉවත් වුවහොත් පත්කර ගන්නා නව සාමාජිකයාගේ සේවය වසර පහෙන් ඉතිරි වන කාලයට සීමා වේ. ★ යම් සාමාජිකයකු දෙවන වරට ද තෝරා පත් කර ගත හැකිය. අඛණ්ඩව තුන් වන වරට තෝරා පත් කර ගත නොහැකිය. ★ පිට පිට රැස්වීම් වාර තුනකට නොපැමිණෙන සාමාජිකයා ධර්ම සේවා සභාවෙන් ඉවත් වූවකු ලෙස සලකනු ලැබේ. (පිටු අංක 20)

එබැවින් මීසම් ධර්ම සේවා සභාව අලුත් විය යුතුය. සේවය සඳහා ඉදිරිපත් වන්නට කැමති කිතුනුවන් සෑම මීසමකම සිටී. ඔවුන් අතරෙන් හැකියාවන් ඇති දක්ෂ, බැතිමත් ඇදහිලිවන්ත අය තෝරා පත් කරගෙන ඔවුන්ව ඥානකාන්ති මඟින් දැනුම්වත් කර නව මීසම් ධර්ම සේවා සභා පිහිටුවා ජනවන්දනා කටයුතු වලට මුල් තැන ලබා දීමට වග බලා ගත යුතුය.

**බී. ඩී. ප්‍රියන්ත මෙන්ඩිස්**
තේවත්ත

# සැබෑ මරියාවන් සොයා



ජීවිත අත්දැකීමක් බෙදා ගනිමින් ම ඉහත මාතෘකාවට පිවිසීමට කැමැත්තෙමි. විශ්ව විද්‍යාලය යනු මාගේ ජීවිතයේ හමුවූ සොඳුරු නවාතැනකි. තමන්ට අදාළ විෂය පථය තුළ පුළුල් දැනුමක් ලබා බුද්ධිමය සමාජයේ කොටස්කාරයකු බවට පත්වී විශ්වීය සමාජය හා එක්ව ඉදිරියට යාම සියලුම විද්‍යාර්ථයින්ගේ අභිලාෂය වේ. දැනුම හා ඥානය සොයා යන ගමනේ දී විවේකයක් ලැබුණු විගස විවිධ වූ මාතෘකා පදනම් කරගනිමින් විචාරශීලි කතිකා ඇරඹීම මාගේ මිතුරන් අතර දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයකි. එවැනි සාකච්ඡා දුරදිග ගිය ද, සියලු දෙනාට තම අභිමතයන් නිදහස්ව, නිරවුල්ව ප්‍රකාශ කිරීමේ ශක්‍යතාවය අවිනාශිව පැවතීම ප්‍රශංසනීය වේ. ක්‍රිස්තියානි ධර්මය මූලික කොට ගත් සාකච්ඡාවන්හිදී නම් මරියාවන් පිළිබඳව පහත දැක්වෙන පරිදි මත භේදාත්මක අදහස් තම තමන්ගේ සිතැඟි පරිදි හැසිරවීමට උත්සාහ කරනු දැකීම හදවත කම්පා කරන සුළුය.

"කතෝලිකයන් අදහන්නේ මරියතුමියව ද? අනෙකුත් සභාවන්හි ජනතාව පිළිගන්නේ ජේසුස් වහන්සේව නේද? එසේ නම් මරියාවන් යනු කවුද?"

ඉහත පරිදි බහුතරය නියම මරියාවන් පිළිබඳ නොදැනීම මෙන්ම දේව වචනය හරහා ලොවට ප්‍රකාශ වන සැබෑ මරියාවන්ව සමාජගත කිරීමට උනන්දුවක් නොදැක්වීමෙන් ඉහත ආකාරයේ අදහස් හා දෘෂ්ටීන් සමාජගත වන බව පිළිගත යුතුව ඇත. එලෙසම මරියාවන් වෙත කතෝලිකයන් වන අප දක්වන්නා වූ අති විශේෂ භක්තිය හා ආදරය පිළිබඳ නොකිතුනු ජනතාව වැරදි අවබෝධයකින් පසුවන බව මා හට පසුගිය වසර කිහිපය තුළම පැහැදිලි විය. කිතුනු සභා ඉතිහාසයේ සිටම අපි මරියාවන්ට ගරු කරන්නෙමු. විශ්වාසයේ සත්‍යතාවන්ට අනුව ඇය වූ කලී නිර්මලව පිළිසිඳ ගනු ලැබූ භාග්‍යවන්තියකි. (ලූක් 1:48) ගැලවීමේ කාර්යයට උර දුන් විපුල ප්‍රසාද ලත් උත්තමාවියකි. (ලූක් 1:28) ක්‍රිස්තුන් වහන්සේගේ පමණක් නොව සියල්ලන්ගේ මාතාව ලෙස ඇය අප වෙනුවෙන් මැදිහත් වන බවද අපි විශ්වාස කරමු. (ජුවාම් 19:26-27) එසේ නම් ගැටලුව කුමක් ද? ගැටලුව ඇත්තේ විශ්වාසය තුළ නොවන අතර භාවිතයන් තුළය. මරියාවන් වෙත පුදනු ලබන භක්ති අභ්‍යාසයන් තුළින් පමණක්ම ක්‍රිස්තුන් වහන්සේව ලොවට ප්‍රකාශ කිරීමට උත්සාහ ගැනීම නිරර්ථක ය. මාගේ අත්දැකීම පරිදි එය අර්ථ විරහිත පිළිවෙතක් බවට පත් වන්නේ නියම මරිය ආධ්‍යාත්මිකත්වයක් තුළ ජීවිත නිදහසක් භුක්ති විඳීමට අපට නොහැකි වන හෙයිනි. එසේ නම් සැබෑ මරියාවන් හඳුනාගෙන ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරීමට මඟක් තිබිය යුතු නොවේ ද?

නව ලෝක පර්යාය තුළ පීඩිතයන් අමතක කොට හතිලා දුවන පාරිභෝජනවාදී ආර්ථික හා සමාජ ක්‍රමය වෙත මරියාවන් දෙනු ලබන පණිවුඩය අති ප්‍රබලය.

"සිය බාහුවෙන් එතුමාණෝ විකුම් පා උඩඟු සිත් ඇත්තන් විසුරුවා හැර මහ නරපතීන් සිහසුන් වලින් පහත හෙළා දීනයන් උසස් කළ සේක. සාගිනි වූවන් යහපත් දෙයින් සතප්වා ධනවතුන් හිස් අතින් හරවා යැවූ සේක." (ලූක් 1:51-53)

මරියාවන් සිය හදපත්ලෙන්ම පැවසූ වදන් හරහා ඇය අසරණ, දිළිඳු, කොන් වූ ජනතාව පිළිබඳ දැඩි සැලකිල්ලක් හා ආදරයක් දක්වන බව මෙන්ම සමාජ සාධාරණත්වය පිහිටුවාලන විමුක්තිදායකයකුගේ ආගමනයේ නැවුම් වූ බලාපොරොත්තුවෙන් පසුවූ බවත් ඉතා පැහැදිලිය. "ගැළවුම්කරුවාණන්ගේ මෑණියෝ" නමැති සසුන් විශ්ව ලේඛනයෙහි භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුළු සුදතුම් පියාද සඳහන් කරන්නේ දිළිඳුන් වෙත සභාව දක්වන ප්‍රේමය ඉහතින් දැක් වූ මරියාවන්ගේ උදාන ගීයෙහි අද්විතීය ආකාරයෙන් ලියවී ඇති බවයි. මරියාවන් සිය අදහස් වචනයට පමණක් සීමා නොකළ අතර එය සිය ජීවිත ගමන තුළ ජීවත් කරවීය. දියණියක, කාන්තාවක හා මවක ලෙස අත්විඳි දුක, වේදනාව තුළ වුවද ඇය දෙවියන් වහන්සේට සමීප දිවියක් ගත කරන ලදී.

එසේ නම් "දිළිඳුන් හට සුභ අස්න දේශනා කරනු වස් ආලේප කළ තැනැන් වහන්සේ වන ක්‍රිස්තුන් වහන්සේව" අනුගාමී වන්නා වූ අපට (ලූක් 4:18) භක්ති අභ්‍යාසයන් තුළින් පමණක්ම මරියාවන් සෙවීමට වඩා නියම මරියාවන් හඳුනාගෙන අරුත්බරව කටයුතු කිරීම කාලෝචිත බව ස්ථිරය. දිනෙන් දින වෙනස් වන්නා වූ ගෝලීය සමාජ, ආර්ථික, දේශපාලන හා ආර්ථික ප්‍රපංචයන්ට කොටු වී සිටින පීඩිත ජනතාව වැඩිවනවා මිස පහළ යාමක් පෙන්නුම් කරන්නේ නැත. සුඛෝපභෝගී ජීවිත ගත කරන්නන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවෙන විට දී දිළිඳු පවුල් හි ජීවන තත්ත්වය ඔබ මොහොතකට සිතා බැලුවා ද?

දුප්පත්කම හා මන්දපෝෂණ තත්ත්වයන්ගෙන් සපිරුණු අප්‍රිකාව එදා සිට අද දක්වාම එලෙසම පවතී. තරුණ අසහනය සමඟ අරාබිය ගිනි ජාලාවක් බවට පත් වීමට ගත වූයේ නිමේෂයකි. (අරාබි වසන්තය) විරැකියාව, ආදායම් බෙදී යාමේ විෂමතා, දෛනිකව ඉහළ යන අපරාධ රැල්ල, පවුල් සංස්ථාව දෙදරා යාම වැනි අභියෝග අප දේශය ඉදිරියේද ඇති බව තේරුම් ගත යුතුය. බලය පසුපස හඹා යාමට මිනිසා උපතින්ම පෙළඹෙන අතර බලවතා ඉදිරියේ දුබලයාට ඉඩක් නොමැති තරම්ය. අප ජීවත් වන සමාජය දෙස යථාර්ථවාදීව බැලුවහොත් එය අපට හොඳින් තේරුම් ගත හැකිය.

මරියාවන්ගේ දැක්ම ඇය ජීවත් වූ ඓතිහාසික ඊශ්‍රායෙල් සමාජ පසුතලයට සීමා නොකොට නූතනයට ද යොදා ගැනීම යෝග්‍ය වේ. දිළිඳුකම, වේදනාව, පලා යාම හා ප්‍රතික්ෂේප කිරීමට ලක්වීම වැනි සියලු දේ අත්විඳි මරියාවන්ව අපගේම සහෝදර ජනතාවට හා පවුල් සංස්ථාවට සමීප කළ යුතුය. තම අයිතීන් නොලැබීම නිසාවෙන් ජීවිතය විඳවන්නන් හට ජීවිතය විඳීමට අවකාශය සලසා දිය යුතුය. අසාධාරණ ආර්ථික ව්‍යුහයන් හා අර්බුදයන්ට මැදි වී කුරුසිය දරාගෙන ඉදිරියට යන මව්වරුන්ව අමතක කිරීම ද අපට කළ නොහැක්කකි. අප දේශයේ වසර 30 කටත් වඩා පැවැති යුධ ගැටුම් නිසා අයිතීන් අහිමි වූ සියලු දෙනාගේ අයිතිවාසිකම් ලබා දීමට පටු වාසි නොතකා එක් අරමුණක රැඳෙමින් පෙරමුණ ගැනීම මරියාවන් අනුගමනය කරන අප සැමගේ වගකීම විය යුතුය.

"ගෙන යනු මැන දෙව් මවේ අප සමිඳාණන් වෙතේ" අප මේ පසු කරන්නා වූ මරියාවන් හට කැප කළ වසර තුළදීවත් අප සැබෑ තත්ත්වය වටහා ගත යුතු නොවේ ද? මරිය බැතිය හා සමගාමීව මරිය තුමිය තුළ වූ ඒ ආධ්‍යාත්මය අප ක්‍රියාවන් හරහා සමාජගත කරන්නේ නම් මරියාවන්ව නිරන්තරයෙන් හෙළා දකින අන්තවාදී මූලධර්මවාදීන් ඇතුළුව සියලු දෙනා හට ප්‍රායෝගික පිළිතුරක් ලබා දිය හැකි බව මාගේ මතයයි. භේදවීමට නොව සමයාන්තර සංවාදය හා එකමුතු වීමට මරියාවන් රුකුලක් කර ගත යුතුය. මෙවැනි තත්ත්වයක් හරහා ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රථම හා අංගසම්පූර්ණ ශ්‍රාවකයා වන මරියාවන්ව (6 වන පාවුළු සුදොතුම් පියා - Marialis Cultus, 1974 ) අනුගමනය කිරීම බොහෝ දෙනකුට පහසු වනු ඇත. මරියාවන්ගේ දැක්ම තුළ පීඩිත ජනතාව නගා සිටුවමින් ක්‍රිස්තු ආදරය ලෝකයට බෙදා දීමට කැපවන ශ්‍රාවකයකු වීමට ඉදිරිපත් වෙමු. එවිට අපට මඩු, වේලන්කන්නි, ලූර්දු, පාතිමා වැනි වන්දනා ස්ථාන කරා ගොස් මරිය තුමියගේ මැදිහත් පිහිට ඉල්ලා සිටින ජනතාවක් ඇති කිරීම පමණක් නොව තම අසල්වැසියාට සංවේදී වන, සමාජ සන්දර්භයන්ට අවදි වන, සහභාගිශීලි සභාවක් කරා පියමං කළ හැකිය. එදා මරියාවන් මුල් කිතුනු සභාව තුළ අත්විඳි බෙදා ගැනීම, පොදු භාවය, අන්‍යෝන්‍ය විශ්වාසය වැනි ගුණාංග නූතන සභාව තුළ ද වැඩි වර්ධනය කිරීමට සැලැස්වීමෙන් කිතු තුමන් හා ඒකාත්මික වූ ජීවිතයක් ජීවත් කළ හැකි බව අප සැමදා සිහි තබා ගනිමු.

**ඩී. අමිල එස්. පෙරේරා**
සිව්වන වසර, කොළඹ විශ්ව විද්‍යාලය

# නදීය

## නිදහස

කුණු බක්කියට වැටෙන
ඉඳුල අහුලා බුදින
බුරුසුවක් නුදුටු
දත් දෙපෙල පෙන්වා
අත පා යදින්නට
වීදි දරුවාට ඇති නිදහස

හිරු ගිලෙන තෙක් අවර
හාල්, පිටි මිටියට දෙන කර
ලැලි බක්කියේ සැතපී
බාලම ලාබ සුරාවෙන්
සව්දිය පුරන්නට
නාටාමිට ඇති නිදහස

පැක්ටරියෙ මැෂින් අතර
හද්‍ර යෞවනය දියකර
බෝඩිමේ ගෙවන මොහොතක
එස්. එම්. එස් ආදරයකට
සන්නාලියට ඇති නිදහස

අඳිරද බැමි අසල
චින්තනය සිරගත කළ
ඊනියා විරුවන්ට
නිදහස ස(මරන්න)
පරවේණි කළ නිදහස

**ඊ. ආනන්ද සිල්වා**
මීගමුව

## තුති මල් මිටක්

උඩුගම්පල ගම මැද
බැබලෙන අසිසි දෙවි මැඳුරක්
කිතු පෙමින් දැල්වූ අප ජීවිතත්
ඇති වේවිද ඔබ තුම කළ
සේවය අගයන්නට
සමුගන්නවාද? වෙන්වනවාද?
"නැත දරුවනි මා මදකට
ඈතට යනවා පමණි
ඔබ හට හිමිකරදී
තවත් අලුත් මාවතක්"
එවන් වදනින් අප දිරිමත් කළ
ගරු සුභාෂ් පියතුමනි ඔබ තුම හට
සමු නොගත්තත් වෙන් නොවුනත්
ඈතට යන නිසා අප අතරින්
වදන් පෙලක් සමගින් තුති මල් මිටක්
ගෙවුන පස් වසර තුළ කළ සේවයට
මෙලෙසින් පිළිගන්වන්නම්
උඩුගම්පල දරු කැළ සමගින්.....

**බියට්‍රිස් පෙරේරා**
උඩුගම්පල

## අභිප්‍රේරණය

කැමැත්තට ඉඩනොතබා
රාගය තෘෂ්ණාව භය
ඇතිකර
ආතතිය අනවබෝධයට
පත් කර
නිදහස් චින්තනය
නැතිකර
හැසිරීමට පෙළඹවීම

**ඒ. ඩී. සුනිල්**
හේකිත්ත

## ජේසුනී, ඔබ මා ළඟ

පැරදුනා මං
එක වරක් නොවෙයි
සිය දහස් වරක්
ඒත් මා නොසැලුනේ
ජේසුනී, ඔබ මා ළඟ නිසා...

ගලා හැලුනා කඳුළු
උල්පතක්සේ නොනැවතී
වියලුනේ නෑ කිසිවිට
ඒත් මා හිනැහුනේ
ජේසුනී, ඔබ මා ලඟ නිසා...

**මැටිල්ඩා වර්ණකුළ**
වයික්කාල

## ඇතුගල් පුර කුමරිය

ඇතුගල්පුර මරිය කුමරිය විලසින්
සියළු බාධක සිඳ බිඳලා
'කන්‍යා මරියාගේ සැටි' අවමානය
නිහඬ සිතින් මිඳිලා
මරිය හමුදාව තුළ
රැජිණිය විලසින් අභිෂෙක් ලබමින්
ජපමාල බැතිය ලොවට පුදලා
ඇතුගල් - පුරයෙන්
මරිය වසර අරඹමින්
මරිය තුමී සමගින් ජේසු වෙතට
පියනගන්නයි අපේ හද පැතුම
සියළු බාධක බිඳලා

**ප්‍රින්සි ජයසූරිය**
විලගෙදර

## අත දෙනු මැන සමිඳුනී

| | |
|---|---|
| සමිඳුනි ඔබේ නෙත් දෙක දෙස | බලාගෙන |
| මගෙ හදවතේ සියළුම දුක් | දරාගෙන |
| ඔබ පසුපසම එන්නට හිත | හදාගෙන |
| කොහොමද එන්නෙ ලොව බැඳි බැමි | කඩාගෙන |

**නිමල් වාස්**
ඇත්ගාල

## හැන්දෑව

| | |
|---|---|
| සෙන්දිරික්ක මල් පිපිලා සුවඳ හමන | හැන්දෑවේ |
| රත්පැහැ ඉර මුහුදෙ ගිලී විඩා නිවන | හැන්දෑවේ |
| වවුල් රැන්. බකමූණන් 'ඔටුනු දරන' | හැන්දෑවේ |
| සඳුයි, තරුයි එකතුවෙලා සිනාසැලුව | හැන්දෑවේ |
| | |
| පුංචි පැටව් වටකරගෙන මිදුලට බැස | හැන්දෑවේ |
| වවුලන් බකමූණන් දැක සතුටු වුණා | හැන්දෑවේ |
| කිරියි පැණියි ඉල්ල ඉල්ල අතදිගුකර | හැන්දෑවේ |
| අහසට තනියකුත් දැනුනෙ නැහැනෙ එදා හැන්දෑවේ | |
| | |
| ඈත් දෙපා වාරු නැතිව 'සඳුයි තරුයි' | හැන්දෑවේ |
| කිරි ඉල්ලා ඇඬුව පැටව් අද කොහෙදෝ | හැන්දෑවේ |
| බස්සන් බකමූණන් 'ඔච්චම් කරනා' | හැන්දෑවේ |
| හිස් අහසට සුසුම් හෙලා දුක නිවන | හැන්දෑවේ |

**වසන්ත මාලා**
කොටරූපේ



## යුද කඳවුරක ආයාචනයකි!

ගරු ටයිටස් බ්‍රැන්ඩ්ස් මා පියතුමා දෙවැනි ලෝක මහා සංග්‍රාම සමයේ ජර්මන් හමුදාව අතට පත්ව නාසි යුද කඳවුරක වධ හිංසාවට ලක්ව මිය ගිය උදාර චරිතයකි. සිරගතව හුන් සමයේ එතුමා තමාගේ අත්දැකීම් දින පොතක සටහන් කළේය. මේ එතුමා තම දිනපොතේ ස්වාමින් වහන්සේට ලියා තිබූ කවියකි.

ඔබවහන්සේගේ දුකින් පිරි දෑස් දකින තුරු
මට දුක දැනෙන්න එපා
මගේ ශක්තිය ඔබතුමන්ය
සමිඳුනි මා ශක්තිමත් කරන්න
ඔබේ නොමියෙන ආදරය
මට මහා ආලෝකයකි
නිවා දමන්න එපා ඒ ආලෝකය
මා සමග ඉන්න ජේසුනි
මට බයක් නැත
අත දිගු කරන විට
දැනෙයි මට ඔබේ සෙනෙහස
ආදරය සමග සුරැකුම

**ක්‍රිස්ටෝපර් රණසිංහ**
පන්නිපිටිය

## තිත්ත ඇත්ත

සිටියත් සිංහයා ජාතික කොඩියෙ නැග
හැමදෙන දනී උන් මේ රට නොමැති වග
දවසම නිදා ගන්නා සිංහයගෙ රඟ
දෙහිවල ගිය විටදි දැක ගත හැකිය ලඟ

සිව් මහ දිය දහර මුහුදට ගලා යතේ
සිව් මහ දහම් රස සිව් දිග පැතිර ඇතේ
රැව් දෙන ලොව පුරා ගුණ දම් කොතැන වෙතේ
පව් කම වලින් නම් සිව් දිග අඩුව නැතේ

රටදැය සමයට ඇති ලෙන්ගතු කම
මිනිසුන් අල්ලා මුල්ලට දැම්මම
ඇතැමුන් හට මෙහි, එය වේ විරුකම
රට ජාතිය පිරිහීමයි නැවතුම

**ඩබ්ලියු. ඩී. මැටිල්ඩා අධිකාරම්**
තලාව

## භාග්‍යවත් ජුසේවාස් මුනිතුමනේ!

භාග්‍යවත් ජුසේවාස් මුනි තුමනේ
අසහාය ධර්මදූත වරයාණනේ
අප ශ්‍රී ලංකාවේ අපෝස්තුලුවරයාණනේ
අපනිසා යාච්ඤා කළ මැනව

බිඳ වැටී තිබූ කිතුදම ගොඩගත්තේ
ඔබයි පියතුමනේ
දැහැමි දිවියක් ගතකරලා
තාඩන පීඩන ඉවසාලා
කිතු දමේ අගේ පෙන්වා දීලා
යාච්ඤා බලයෙන් ලෙඩ සුව කරලා
ඔබ ගියා සුර ලොව ලක් දෙරණ බබලවාලා

**නන්දා මෙන්ඩිස්**
පොලොන්නරුව

## පාමුල සේවන

දේව සම්මුඛයට පිවිසීමක්
දේව ගරුබිය දැක්වීමට මඟක්
දේව හඬ ඇසෙන තැනක්
දේව ආදරය ගලාගෙන එන තැනක්

පාපයට සමාව ලබන තැනක්
අසරණකමට, දිළිඳුකමට පිළිතුරක්
සැබෑ ජීවිත වෙනසකට මඟක්
ඇතුළාන්ත නිදහසට පිවිසුමක්

ජීවිත ප්‍රශ්නවලට සැබෑ උත්තරයක්
දේවකැමැත්තට අවනත වන සිත
පහළවන මොහොතක්
ශුද්ධාත්මාලේපනය ලබන තැනක්
සැබෑ සාමය, සතුට අත්විඳින්නට මාර්ගයක්
පාමුල සේවන නිධානයක් බඳුය

**රිචඩ් වික්‍රමසිංහ**
බටගම

## හේමන්තය ඔබයි!

අභිමන් සිරි ලක ලොවම පසිඳු කර
ඔබෙ ගී තනුවක් රැව් දෙනවා
සැනසුම් ලොවකට පාර තනයි ඔබ
කිතු ගොස එහි රඳවා රඳවා
දෙවි සමිඳුන්ගේ සේවෙට කැප වූ
ගායක වාදක හිමි සමිඳා
රන් රනින් - රන් බසින් ලොවම වෙලා ගත්තා

පිබිදී ගයමින් රස ගී
යා යුතු ගමනක් යමිනේ...
අපගෙ මීසම ඔබට බාරයි....
හේමන්තය වැනි පියතුමනේ...
අපගේ ආයුෂ සමගින් ලැබගෙන
චිරාත් කාලයක් දිවිය ගෙවනු මැන
පියපුත් ශුදතුම වරම පිහිට ලැබ
සමිඳු නිවහනේ ගිමන් හරිනු මැන
වැල්ලවාය මීසම් සේවක ගරු ඇන්තනී හේමන්ත පීරිස් පියතුමන්ගේ පූජක දිවියේ රජත ජයන්තිය වෙනුවෙනි.

**ප්‍රියංගනී පෙරේරා**
ප්‍රධාන ආචාරිණී - ශා. මරියා දහම් පාසල
වැල්ලවාය

## පිය සෙනෙහස

| | |
|---|---|
| සංකල්පනා රසවත් කවි ලෙසට | ලියා |
| කවි ලෝකයේ මම සැහෙන දුරක | ගියා |
| පබැඳුම් කළත් මව් සෙනෙහස ගැනම | ගයා |
| වරදකි මම කළේ අමතක කරල | පියා |
| | |
| අයදින්නෙමි සමා අද ඔබෙ ගුණ | ගයලා |
| මගේ ඇස් ඇරෙන විටදී ඔබෙ නෙත් | වැසිලා |
| ආදර පියාණනි ඔබ සුර ලොව | ඉඳලා |
| පිළිගනු මැනවි කවි මල් සුවඳින් | පිරිලා |
| | |
| සමුගත් විටදි අම්මා අප අතැ'ර | ගොසින් |
| හිස්තැන පිරවුනේ ඔබෙ ආදරය | තුළින් |
| ඔබ දෙදෙනාම අද දෙවිඳුන් සමග | බැවින් |
| මව සහ පියා සමරන්නෙමි දැවෙන | හදින් |
| | |
| රූපය දිරන මුත් නම නොදිරන | දෙයකි |
| අම්මා තාත්තා ඒකට | නිදසුනකි |
| පෙරුම් පිරුවෙ දැකගන්නට | මුනුපුරෙකි |
| ඔබ දෙපොලටම එය බොඳවුන | සිහිනයකි |

**ඇන්ටනි රුදිගු**
යක්කඩුව

## අමිල සිරි ලේ

| | |
|---|---|
| සෝද මින් අමිල වූ සිරි ලෙයින් | මනා |
| පාද මින් මගක් සුර ලොවේ සුව | ගෙනා |
| සාද මින් සුදක් පවේ කිලුට නොම | වනා |
| වීද මින් රැසක් ලොවේ ගැලවුයේ | දනා |
| | |
| කටු කිරුලකින් හිසේ වැගුන ලේ | බිඳයි |
| පටු මගේ වැටී වැටී හෙලුව ලේ | කඳයි |
| කෙටූ කසේ සියොළඟේ ගැලුව ලේ | ගඟයි |
| තුටු හදේ ඇනී ගොසින් වැටුන ලේ | රැසයි |
| | |
| දනන් පවින් මුදා සදා උරුම කර | සැපා |
| ලෙයින් පුදා කුරුසියේ රැඳී බිය | නොපා |
| මෙවන් නිධානයක් දිදී ලොවේ ජය | පපා |
| පුදන් නෙමී සමිඳුනේ වැටී වැඳ | දෙපා |

**ලයනල් වර්ණකුල**
දළුගම




## ශ්‍රී කුරුසිය පාමුල

| | |
|---|---|
| හොරි වසංගතයක් පැතිරී ගම | පුරාම |
| ඔබ පිය සෙවනේ පහනින් තෙල් | ගෑවාම |
| සුව වී පතල විය ගම් දනව් | සිසාරාම |
| අවට ගම්වලින් ආවා පිරිස් | හැමදාම |
| | |
| වෙහෙස නොබලා ඇවිත් ශ්‍රී කුරුසිය | වෙතට |
| සැමදෙනා දුක් සුසුම් තබනව ඔබ | දෝතට |
| මේ පුද බිමෙන් ඒ සැම නික්ම | යනවිට |
| ලැබ සහනය ගෙන යන්නේ සතුට | නිවසට |

**ආතර් හිලරි ප්‍රනාන්දු**
මාරවිල

# කිතුනුවන් වෘකයන් නොව බැටළුවන් විය යුතුය



ක්‍රිස්තුන් වහන්සේගේ ස්වරූපය බැටළුවකු බැව් ප්‍රකාශ කරමින්, පෙබරවාරි මස 14 වැනි දිනැ පැවැති දිව්‍ය යාගය අවස්ථාවේදී, ප්‍රැන්සිස් සුදොතුම් පියාණන් විසින් පෙන්වා දෙනු ලැබුවේ, කොතෙක් දුර්පරීක්ෂා හමුවේ වුව ද, කිතුනුවා බැටළුවකු ලෙසින් සිය අනන්‍යතාවය රැක ගත යුතුය කියාය.

"ක්‍රිස්තුන් වහන්සේ විසින් සිය ශ්‍රාවකයන් ජනතාව වෙත වලට මුහුණ දීමට සිදුවනු ඇත. එහෙත්, මෙහිදි දාවිත් ගත් පියවර ආදර්ශයට ගත යුතු වේ. ඔහු ගොලියත්ට මුහුණ දීමේදී, සාවුල්ගේ රැකවරණය වැළඳ ගත්තේ නැත. එවැනි ආරක්ෂාවක් නොවැළඳ දෙවියන් වහන්සේ කෙරෙහි මුළුමණින්මැ රැඳී සිටිමින් තමා කවුදැයි ප්‍රකාශ කළේය. ඒ අනුව ඔහු ජයග්‍රහණය කළේය. ශුදොතුම් පියා එලෙසින් ද ප්‍රකාශ කළ සේක.

තවද, ශුදොතුම් පියාගේ ඔවදන් මෙසේ ද වී, "ඔබ බැටළුවකු මෙන් සිටිනා තාක් කල්, ස්වාමින් වහන්සේ ඔබට ආරක්ෂා කරණ සේක. ඔබ වෘකයකු ලෙසින් ක්‍රියා කරනා විට, උන්වහන්සේ ඔබ ආරක්ෂා නොකොට පසෙක සිටිනා සේක. කිතුනුවා අකර්මන්‍ය ලෙස ඔහේ බලා සිටින්නෙක් නොවේ. ඔහු නිරන්තරයෙන් පා නඟයි; ප්‍රීතියෙන් පා නඟයි."

[illegible] පැමිණි දකුණු කොරියාන කිතුනු වන්දනා කරුවන් පිරිසක් සිය බසයෙන් ගමන් කරද්දී, ඊශ්‍රායෙල් මායිමේදී බසය ඇතුලේ සඟවා තුබු බෝම්බයක් පුපුරුවා හරිනු ලැබීමෙන්, ඊජිප්තු ජාතික රියදුරා ඇතුළුව සතර දෙනෙකු මරණයට පත්ව, තවත් 21 දෙනෙකු බරපතළ තුවාල ලබා සිටිති.



මෙම සාපරාධය සිදුවන විට, දකුණු කොරියාන කිතුනු වන්දනා කරුවෝ, ලෝක උරුමයක් සේ සළකුනු කැරෙන සීනායි කඳුකරයේ දකුණෙන් පිහිටි ඓතිහාසික ශාන්ත කැතිරිනා ආරාම පෙදෙස පසුකොට ඊශ්‍රායෙල් කරා යමින් සිටියෝය.

ශාන්ත කැතිරින් ආරාමය පිහිටි කඳු වැටි ප්‍රදේශයේදී දෙවි සමිඳාණන්ගෙන් මෝසස් තුමා විසින් දස පණත ලබා ගත් බව විශ්වාස කරනු ලැබේ. එම නිසාවෙන් මෙම කැතිරිනා ආරාමය, සීනයි කන්දේදි දෙවිඳු පා ගැසුණු ස්ථානය වශයෙන් නම් කරැත. ජාත්‍යන්තර මාධ්‍යයන් විසින් ස්ථිර කරනු ලැබ ඇති ප්‍රකාර, මෙම බස් බෝම්බය පුපුරුවා හැරීම, ඊජිප්තු ඉස්ලාම් ත්‍රස්ත කංඩායමක් විසින් දියත් කොට ඇත. මෙම අපරාධයේ නියුතු වූවන් සෙවීම නොනවත්වා කැරෙනා බැව් ප්‍රකාශ කැරුණත්, තවමැ වරද කරුවන් පිළිබඳ තොරතුරු කිසිවක් හෙළි දක්වා නොමැත.

## දේව සේවකයා මරා දෙව් මැඳුර ගිනිබත් කැරේ

උතුරු නයිජීරියාවේ, මුස්ලිම්වරු බහුතරයක් ජීවත් වන කන්කියා නම් නගරයේ තරුණ ත්‍රස්ත කණ්ඩායමක් විසින් පසුගිය සතියේ එක් දේව සේවකයකු ඝාතනය කොට, ඔහුගේ දෙව්මැඳුර ද ගේ දොර ද ගිනිබත් කොට තිබිණි. කවුරුන් හෝ විසින් සය හැවිරිදි දැරියක් මරා දමා තිබීම, මෙම දේව සේවකයා මත පටවා, ඔහු මරා දමා ඇති බැව් පොලිසිය විසින් ද පිළිගෙන ඇති බැව් ජාත්‍යන්තර පුවත් විසින් ද වාර්තා කොට ඇත.

අදාළ ත්‍රස්ත කල්ලිය, එම දේව සේවකයාට පහර දෙද්දී, තවත් පිරිසක් ඔවුන් මැදට පැන, දේව සේවකයා ගළවා ගෙන රෝහල කරා ගෙනයනු ලැබීය. එහෙත්, ඔවුන් පසු පස ලුහු බැඳ ගිය ත්‍රස්තයන් විසින් එම දේව සේවකයා රෝහල තුළදීමැ ඝාතනය කරනු ලැබ ඇත. පසුගිය සතියේ, පොලිස් කොමසාරිස් වරයා විසින් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ, දැරියගේ මරණයට දේව සේවකයා කොහෙත්මැ සම්බන්ධ නැති අතර, ඔහුගේ කිතුනු උගැන්වීම කෙරෙහි කෝපාවිෂ්ටව සිටි පිරිසකගේ මෙහෙය වීමෙන් එම ඝාතනය සිදු කොට ඇති බවයි.

## කතෝලික නීතිඥයාට නිදහස ඉල්ලා පෙළපාළි යති

දෙසතියකට වැඩි කාලයක්, උපවාසයෙහි යෙදී සිටිනා සිරගත කතෝලික නීතිඥ ලේකුවොක් කුආන් නිදහස් කරන්නැයි ඉල්ලා වියට්නාම් කිතුනුවෝ හා ඇතැම් අන්‍යාග මිකයෝ. පෙබරවාරි මස 18 වැනිදා, ඇල්වූ ඉටි පහන් අතැතිව පෙළපාළි ඇක්වූහ. ගැලවුම් නිකායේ පූජකවරුන් විසින් සංවිධානය කරනු ලැබූ, එම යැදුම් පෙළපාළියේ 3000 කට අධික පිරිසක් ගමන් කළහ. ආගමික නිදහස ඉල්ලා ක්‍රියා කිරීමේ හේතුවෙන් සිරබත් වළඳිනා අනෙකුත් ක්‍රියාකරුවන්ගේ නිදහස පතා ධජයන් ද ඔසවාගෙන යන අයුරු ද දක්නට ලැබිණි.

මෙම කතෝලික නීතිඥවරයා සිර භාරයේ සිටිනුයේ අති දුර්වල ශාරීරික තත්ත්වයකය, තවදුරටත් නීතිමය උපදෙස් ලබාගන්නා පිණිස නීතිඥ සහාය ලබා ගැන්මට අවසර පැතුවත් එයද වියට්නාම් බලධාරීන් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත.

තවද ශුද්ධ වූ බයිබලය පවා ළඟ තබා ගැන්මට අවසර දී නොමැත.

කාලාන්තරයක් මුළුල්ලේ ලී කුවොක් කුආං නම් කතෝලික නීතිඥයා කොමියුනිස්ට් බලධාරීන් විසින් දිගු කලක සිට සිරගත කරනු ලැබ ඇති අතර 2012, දෙසැම්බර් මස 27 වැනිදා සිට මාස 30 කට අධික කාලයක් දිගටම සිරගත කොට ඇත. ඊට අමතරව ඩොලර් පනස් හයදහක දඩයක් ද පනවා තිබිණි.

චෝදනාව වී තිබුණේ, ඔහු විසින් රජයට ගෙවිය යුතුව තුබූ බදු මුදල් නොගෙවා තිබීම යන බොරු චෝදනාවකි.

එම තීන්දුවට එරෙහිව ඔහු විසින් අභියාචනයක් ඉදිරිපත් කරන ලද අතර, එම අභියාචනය පැය දෙකකට අඩු කාලයකදී පවත්වා, ඔහුට විරුද්ධ තීරණය ද නිකුත් කරනු ලැබීය; මෙම නීතිඥයාට එරෙහිව පමණක් නොව, තවත් ආගමික හා මිනිස් අයිතිවාසිකම් ඉල්ලා සිටින ක්‍රියාකරුවන් විශාල සංඛ්‍යාවකට එරෙහිව බොරු වැරදි පටවා නීතියේ රැහැනට හසුකර ගෙන ඇතැයි ද වාර්තා වේ.

## වෙනිසියුලාවේ සැලේසියන් පැවැදි වරු දෙදෙනෙක් ඝාතනය කැරේ

වෙනිසියුලාවේ පවත්නා සමාජ අනාරක්ෂිත වාතාවරණය ඔස්සේ, දොන් බොස්කෝ ආගමික ආයතනයට අයත් 80 හැවිරිදි, ජීසස් ප්ලාෂා පියතුමා ද පැවිදි සොහොයුරු 84 හැවිරිදි ලුවී ෂන්වේස් තුමා ද, සොරකමකට පැමිණි 13 හා 15 හැවිරිදි ගැටවරයන් දෙදෙනෙකු විසින් පෙබරවාරි මස 15 වැනිදා සන්ධ්‍යා භාගයේ ඝාතනය කර තිබිණි.

තවත් පූජක වරයෙක් සහ පැවිදි සහෝදරයෙක් ගැටවරයන් දෙදෙනාගේ පහරදීම්වලට ලක්ව, රෝහල් ගතව සිටිති, ඔවුන් විසින් මෙම සාපරාධය කරනු ලැබූ ඇත්තේ, මුදල් ද අනෙකුත් වටිනා බඩු බාහිරාදිය ද සොරා ගැන්මට යත්න දරද්දී යයි පොලිස් වාර්තා විසින් ප්‍රකාශ කරනු ලැබූ ඇත.

මෙම සිද්ධීන් පිළිබඳ සිය අදහස් දක්වමින් එරටේ සැලේසියන් නිකායේ අධ්‍යක්ෂ තුමා ප්‍රකාශ කරනු ලැබුවේ, "පාසල් නොයන ගැටවර සංඛ්‍යාවන්ට අයත් මෙවන් දරුවන්, රටේ පවත්නා ආනාරක්ෂිත තත්ත්වයන් ඔස්සේ නපුරට පෙළැඹී ඇතැයි කියාය. මේ නිසාවෙන් රට තුළ සාමයත් සංහිඳියාවත් සඳහා අපි නිරන්තරයෙන් යාච්ඤාවේ යෙදෙමු" යි එතුමා සැමගෙන් ඉල්ලා සිටියේය.

## පසුගිය වසරේ ඝාතනය වූ පූජක සංඛ්‍යාව එකකින් වැඩිවේ

පසුගිය සතියේ වතිකාන පුවත් විසින් හෙළි දැක්වූ පරිදි සංශෝධිත පූජක ඝාතනයන් 2013 වර්ෂයේදී, 19 දෙනෙක් නොව 20 දෙනෙක් වෙති. වර්ෂ 2013 දී ඝාතනය කරනු ලැබූ පූජක සංඛ්‍යාව එක් වනු ලබන්නේ, හන්ගේරියානු ජාතික අන්ද්‍යාස් ෂර්වාස් පියතුමාය. එතුමා වර්ෂ 1940 දී, උතුරු හංගේරියාවේ නෝග්‍රාඩ් නම් ප්‍රදේශයේ උපත ලබා ඇත. දිළිඳු භාවය තුරන් කිරීම සඳහා තමා සේවය කරනු ලැබූ ඇදැහිලි වන්තයන් සමඟ සක්‍රීයව කටයුතු කළ "දිළින්දන්ගේ පූජකවරයෙකු" ලෙස නම් දරා සිටී බැව් කතෝලික පුවත් විසින් වාර්තා කරැත.

එතුමා වාසය කළ ස්ථානයේදී පියතුමා මරා දමා තුබූ ආකාරය දින කීපයකට පසුව සොයා ගනු ලැබීය. එතුමා මරා දැමූ තරුණයා විසින් පසුව පාපොච්චාරණය කරනු ලැබූ කරුණු අනුව, සොරකම් කිරීමේ පරමාර්ථයෙන් සඳහා එලෙස එතුමා ඝාතනය කර ඇතැයි පොලිසිය විසින් ද සනාථ කරනු ලැබ තිබේ.

## කතෝලික නායකයා විරෝධතා කරුවන්ට ජාත්‍යන්තර සහාය ඉල්ලයි

යුක්‍රේනියාවේ ග්‍රීක කතෝලික සභා නායක සව්යා මොස්ලාම් අගරදගුරු තුමා, එරටේ ඒකාධිපති පාලක වික්තෝර් යනු කොවිච් හට එරෙහිව ප්‍රජාතන්ත්‍ර වාදය ඉල්ලා සිටින විරෝධතා කරුවන්ට සහාය ලබාදෙන්නැයි, ඇමෙරිකා එක්සත් ජනපදයෙන් හා යුරෝපා රටවලින් ඉල්ලා සිටී.

එතුමා එම ඉල්ලීම තහවුරු කරමින් මෙලෙස පවසා සිටී; "යුක්‍රේනියාවේ පවත්නා තත්ත්වය අනෙක් රටවල් කෙරෙහි ද අගතිතාවයෙන් බලපානු ඇත. එම ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහි, ඒකාධිපති ක්‍රියාදාමය යුරෝපය හා රුසියාව කෙරෙහි ද බලපානා බැව් වටහා ගත යුතු කාලය එළඹ ඇත. වර්තමානයේ යුක්‍රේනියාවෙ පවත්නා ගැටුම්කාරි තත්ත්වය විසැඳීම සඳහා ඇමෙරිකා එක්සත් ජනපදය හා යුරෝපාකරය ඉදිරිපත් නොවුහොත් එරට දරුණු සිවිල් යුද්ධයක් කරා ඇදී යාම ද වැලැකිය හැකි නොවේ."

අගරදගුරු හිමිපාණන් විසින් තවදුරටත් පවසනු ලැබුවෙ, ඒකාධිපති බලධාරීන් විසින් ජනතාව යුධ තත්ත්වයක් කරා ඇදගෙන යන බවය. එහෙත් ජනතාව අපේක්ෂා කරන්නේ සාමයයි; එබැවින් පවත්නා ආණ්ඩු ක්‍රමය හට බළපෑම් කරමින් අදාළ පාර්ශවයන් අතර සාම සාකච්ඡා සඳහා එකඟත්වය වහා උදා කරුමට බලපෑම් කළ යුතු වේ.

## ඉන්දීය සමාජ දූෂණයන් හමුවේ කතෝලික සභාව දුක් වේ

ලෝකයේ වැඩිම පූජක පුහුණු වන්නන් හා පැවිදි සොහොයුරියන් ජීවත් වන රට ඉන්දියාව වශයෙන් පිළිග ැනෙන අතර, ඔවුන්ගේ හමුවක් පසුගිය සතියේ පැවැතිණි. එහිදී සාකච්ඡාවට භාජනය වූ කරුණු අතර, ඉන්දීය සමාජය තුළ පැතිර පවත්නා සමාජ දූෂණයන් පිළිබඳ රැල්ල වී, ජනතාව අතර කටයුතු කරන අවස්ථාවන්හිදී අන්දැක ඇති වේදනාකාරී දූෂණයන් නවතාලීමේ කාර්යයේදී කතෝලික සභා දායකත්වය ද අවැසි බැව් අවධානය කරනු ලැබීය.

"ඉන්දීය සමාජයේ සියළු අංශයන් හී දූෂණය හා දුරාචාරය මුල් බැස ඇත. "මෙලෙසින් ශෝකාකුලව ප්‍රකාශ කරනු ලැබුවේ, අදාළ හමුවට සහභාගි වූ රදගුරු හිමිවරුන්ය. පවත්නා එම සමාජ බිඳ වැටීම හමුවේ, කතෝලික සභා ක්‍රියාකාරකම් හා ආයතනයන් වැඩි වැඩියෙන් ආදර්ශමත් විය යුතු යයි ද සහභාගි වූ රදගුරු හිමිවරු සනිටුහන් කළෝය. තවද ඉන්දීය ජනතාවගේ අභ්‍යන්තර සංක්‍රමණයන් හේතුකොට ගෙන සංස්කෘතික හා ආගමික සම්ප්‍රදායන් හා මිනිස්කම් සෝදා පාළුවට පත්ව තිබෙන අයුරු ද හුවා දක්වනු ලැබීය. තවද හින්දු ආගමිකයන්ගේ මූලධර්මවාදී හැසිරීම නිසා දේශයේ ඒකත්වයට හානි පමුණුවනු ලැබීම ද පෙන්වා දෙනු ලදී. මෙවන් අභියෝගයන් හමුවේ දෙවැනි වතිකාන දර්ශනයට අනුව, කතෝලික ජීවිත හැඩ ගැස්වීමට ඉන්දීය කතෝලික සභාව නොතිත් උත්සහයක නිරතව සිටිනා බැව් ද දක්වනු ලැබීය. එම දර්ශනය ඔස්සේ යුක්තිය හා සාධාරණය හුවා ඇක්වීම ද, ගිහි අයිතිවාසිකම් සනාථ කැරුම ද, වනිතාවන්ට එරෙහි ක්‍රියාකාරකම් හරණය ද, පරිසරය සුරැකීම ද, විවිධ සමාජ කොටස් අතර සංහිඳියා දියත් කැරුම ද දේශපාලන හා සමාජ ව්‍යුහය තුළ කිතුනු සහභාගිත්වය වර්ධනය ද කිරීම පවත්වා ගෙන යාමට ප්‍රතිඥා දීම ද සිදු කරනු ලැබීය.

## වැඩිහිටි හා ආබාධිත ජීවිත අගනේය



පසුගිය සතියේ "වැඩිහිටි හා අංග විකල භාවය" පිළිබඳ වැඩමුළුවක්, ජීවිතය පිළිබඳ ශුද්ධාසන අභ්‍යාස ආයතනය විසින් රෝමයේදී පවත්වන ලැබීය. මෙම වැඩමුළුව වෙත පණිවුඩයක් ප්‍රැන්සිස් සුදොතුම් පියා විසින් යවා තිබිණි. වැඩිහිටියන් හා ආබාධිතයන්, බිහි වී ඇති කුණු කසළ සංස්කෘතියක සිර කොට ඇති බැව් දැසට පෙනීම. වේදනාත්මක යයි ද එතුමා තවදුරටත් ප්‍රකාශ කළ සේක.

එතුමා තවදුරටත් මෙලෙස ප්‍රකාශ කළ සේක. "වැඩිහිටියන් හා ආබාධිතයන් බහාලනු ලබන කුණු කසළ ව්‍යාපාරය ලෝ පුරා පැතිර යමින් පවතී අපි ජීවත් වන මොනයම් හෝ ජීවිත පරිසරයක් තුළ, ආබාධිතයන් හා වැඩිහිටියන් කොටස් කරුවන් මෙන් නොපිළි ගැන්ම පැතිර යමින් පවතී. එම ක්‍රියා පටිපාටිය, ඔවුන්ට වදගාවිනා දීම හා කොන් කිරීම අභිබවා යන්නකි. ඇතැම්විට, වැඩිහිටියන් හා ආබාධිතයන් පීඩාකාරී බලවත් ආර්ථික ක්‍රියාදාමය විසින් ගොදුරු බවට පත් කැරුමෙන් ජීවිත හානියට යොමු කරනු ලබයි."

"සෞඛ්‍යය විසින් මිනිසාගේ වටිනාකම නිශ්චය කරනු නොලබයි" යනුවෙන් එතුමා අවධාරණය කළසේක. ජීවිත පූර්ණත්වය කරා යන ගමනේදී, වැඩිහිටි හා ආබාධිත භාවය බාධාවක් නොවි යුතු බැව් ද එතුමෝ පැවැසූ සේක. "පවුල තුළ වැඩිහිටියන් හා ආබාධිතයන් එකමුතුවෙන් හා පිළිගැන්මෙන් ජීවිත ගෙවිය යුතු වේ. අසරණ තත්ත්වයේ සිටිනා වැඩිහිටියන් හා ආබාධිතයන් වූවත්, සමාජය විසින් පිළිගැනුම කළ යුතු වේ." "මෙයයි ජීවිත දෙව් වදන" යනුවෙන් සුදොතුම් පියා එලෙසින් ද ප්‍රකාශ කළ සේක.

බැසිල් ෆොන්සේකා විසිනි

සංවාද මණ්ඩපය

# පරිසර සංවර්ධනය ද? භෞතික සංවර්ධනය ද?

**මුතුරාජවෙල - මීගමු කළපු පාරිසරික පද්ධතියට අනාගතයේ දී ඇතිවිය හැකි තීරණාත්මක අවදානම මතු කරමින් වූ ප්‍රදීප කතුවැකිය අපේ අවධානය යොමු කරනුයේ පරිසර "සංරක්ෂණය ද, සංවර්ධනය ද?" යන පුළුල් තේමාවට ය. මෙලෙස කාලයේ සළකුණු වලට සංවේදී වීමේ දිවැසි මෙහෙවර ඉටු කිරීමට ප්‍රදීපය ගෙන ඇති "පෙරමග" සැළසීමේ ගමන් මගට, සොබාදහමේ දෙවිඳුන්ගේ ආශිර්වාදයත්, පරිසර හිතකාමී ජනතාවගේ ප්‍රසාදයත් ප්‍රදීපයට නොඅඩුව ලැබෙන බව සහතිකය.**



සොබාදහමට ආදරය කළ අසීසියේ ප්‍රැන්සිස් මුනිවරයාණන්ගේ නූතන ප්‍රතිමූර්තිය වන අපේ ප්‍රැන්සිස් පොදු පියා නිකුත් කිරීමට නියමිත "පරිසරය" තේමා කරගත් විශ්ව සංදේශය, "පරිසරය ද, සංවර්ධනය ද" යන පුළුල් තේමාව ඔස්සේ සංවාදයකට පිවිසීමකට "මුතුරාජවෙල - මීගමු කළපු පරිසර පද්ධතිය සහ යෝජිත නාගරික සංවර්ධනය" පාදක කරගත හැකි වනු ඇත.

**මහා සැලැස්ම**

අපේ රට තුළ වෙරළාසන්න තෙත්බිම් අතරෙන් ප්‍රමුඛ ස්ථානයක් හිමිවනුයේ මුතුරාජවෙල - මීගමු කළපු පාරිසරික පද්ධතියටයි. නමුත් මිනිස් අත පෙවීම් නිසා මෙම තෙත් බිම අනතුරට පත් වෙමින් තිබුණ අවස්ථාවක මෙම පාරිසරික පද්ධතියේ පවතින තත්ත්වය පිළිබඳ අධ්‍යයනය කර "පාරිසරික පැතිකඩය" තෙත්බිම් ව්‍යාපෘතිය යටතේ සම්පාදනය කිරීමට හැකි විය. මෙම "පාරිසරික පැතිකඩයෙන්" මෙම තෙත්බිමේ පවතින ජෛව විවිධත්වය සහ මිනිස් පැවැත්මට මෙයින් සැපයෙන දායකත්වය මැනවින් ප්‍රකාශයට පත් කරන ලදි. වෙරළාසන්න තෙත් බිමේ සම්පත් තිරසාරව යොදා ගැනීමට, භූමි පරිහරණය සඳහා වූ උපාය මාර්ගයක් ලෙස සම්පාදනය කරන ලද මහ සැලැස්මට පාදක කරගනු ලැබුවේ ඉහත සඳහන් විද්‍යාත්මක අධ්‍යයනය පදනම් කරගෙනය. මෙම මහා සැලැස්මෙන් අපේක්ෂා කරන ලද්දේ මුතුරාජවෙල මීගමු කලපු තෙත්බිමේ ජෛව විවිධත්වය සංරක්ෂණය කරගන්නා අතර සංවර්ධන අවශ්‍යතාවයන්ට ද ඉඩකඩ සලසා ගැනීමය.

මුතුරාජවෙල වපසරිය අක්කර 7660 ක් වන අතර මීගමු කලපු වපසරිය අක්කර 7907 ක් වේ. මහා සැලැස්මට අනුව භූමි පරිහරණය සඳහා මුතුරාජවෙල භූමිය වෙන් කර ඇත්තේ මෙසේ ය.

මුතුරාජවෙල භූමිය ප්‍රධාන කලාප තුනකට වෙන්කර ඇත. මෙම වෙන් කිරීමේ වැඩිම භූමි ප්‍රමාණයක් වෙන් කර ඇත්තේ "පරිසර සංරක්ෂණ" කලාපයටය.

නාගරික, කාර්මික කලාපය සඳහා අක්කර 400 ක් මුහුදු වැලි වලින් ගොඩකර ඇති අතර, සංරක්ෂණ කලාපය සහ නාගරික කාර්මික සංවර්ධන කලාපය අතර ස්වාරක්ෂක සඳහා අක්කර 700 ක භූමි ප්‍රමාණයක් වෙන් කරන ලදි. මෙම ස්වාරක්ෂක කලාපයෙන් කරනු ලැබෙන ප්‍රධාන කාරණය වනුයේ නාගරික සහ කාර්මික කලාපයෙන් සංරක්ෂණ කලාපයට ඇතිවිය හැකි හානි, එනම් පරිසර දූෂණය අවම කිරීමය. එමෙන්ම මෙම භූමි ප්‍රමාණය පරිසර හිතකාමී විනෝදාශ්‍රිත පහසුකම්, එනම් ක්‍රීඩා පහසුකම් වැනි කරුණු සඳහා වෙන්කර ඇත. ඉතිරි විශාල භූමි ප්‍රමාණය වෙන්කර ඇත්තේ නිවාස සඳහා මුතුරාජවෙල - මීගමු කලපු ආශ්‍රිතව 28% ක භූමි ප්‍රමාණයක් වෙන් කර ඇත. (තෙත් බිමෙන්, කළපු මායිමෙන් පිටත)

☛ ලබන සතියට

✍ වි.ලෙ. පීරිස්

# තවමත් ප්‍රමාද නැත

**පසුගිය සතියෙන්....**

**මෙරට දේශපාලනයේ සිටින අතලොස්සක් වූ බුද්ධිමත් හා යථාර්තවාදී දේශපාලනඥයකු හා මාධ්‍යවේදියකු වන ඩලස් අලහප්පෙරුම අමාත්‍යවරයා මෑතකදී කළ ප්‍රකාශයක් වූ "මෙම අර්බුදයේ එකම චූදිතයා විමුක්ති කොටි සංවිධානයේ වේලුපිල්ලේ ප්‍රභාකරන් පමණක් නොව සමස්ත අර්බුදය නිර්මාණය කර පවත්වාගෙන ගිය සෑම අයකුම චිත්ති කූඩුවට නැංවිය යුතුය" යන කියමන තුළ සත්‍ය කොපමණ තිත්ත වුවද මහා ජාතියේ අප එය පිළිගත යුතුව ඇත.**

ඒ තාක් මෙරට සුළු ජන කොටස් තුළ ඇති අවිශ්වාසය, සැකය හා බිය පහකර ජාතියේ උන්නතිය වෙනුවෙන් ඔවුන් අප හා බද්ධ කරගත හැකි මං පෙත් සොයාගත යුත්තේ ද අප විසින්ම ය. එවිට සමස්ත සීලාචාර මිනිස් සමාජය අප දේශයත් මෙරට රාජ්‍ය නායකයාත් ගෞරව ආචාරයට පාත්‍ර කරනු ඇත. මේ සියල්ල ඉටු වන්නේ යුක්තිය, සත්‍යය හා සමාදානය ඉෂ්ට වීම තුළ හෙයින් සමිඳාණන්ගේ හඬ මෙසේ අප අතර දෝංකාර දෙනු ඇත. (සෙකරියා 8:14-17)

## ධෛර්යවත් ජනපතිවරයා

මෙම ජාතික අර්බුදය නිර්මාණය වූවායින් පසුව විශාල ජනබලයක් සහිතව බලයට පත් වූ ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා මෙන්ම මානව වාදී සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ලිබරල් නායිකාවක ලෙස පෙරට පැමිණි හා මෙරට දෙමළ ජනතාව විසින් මහත් බලාපොරොත්තු තැබූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිවරිය පවා මෙම අර්බුදයට පූර්ණ කාලීන විසඳුමක් දීමට තමන්ට ලැබී තිබූ සියළු අවස්ථාවන් මගහැර ගිය අතර පසුව බලයට පත් වූ වත්මන් ජනාධිපතිවරයා ප්‍රමාද වී හෝ යම් ආකාරයක අවතීර්ණය වීමක සාධනීය ලක්ෂණ පසුගිය කාලය තුළ පෙන්වා ඇත.

විමුක්ති කොටි සංවිධානය අනුගමනය කළ අඥාන හා මුග්ධ ක්‍රියා කලාපය තුළ රාජ්‍ය පාලකයාට යුද්ධමය වශයෙන් විමුක්ති කොටි සංවිධානය විනාශ කර දමනවා හැර වෙනත් විකල්පයක් නොවූ බව ඒ වන විට ඉන්දියාව පමණක් නොව ඇ. එ. ජනපදය පවා වටහාගෙන තිබුනු බව ඒ අවස්ථාවේ ඔවුන්ගේ හැසිරීම හා ක්‍රියා කලාප තුළින් විද්‍යමාන විය. ඒ අවස්ථාවේ දී ලංකා රාජ්‍යය ඒ ඒ පාර්ශ්ව හා ඇති වූ අවබෝධතා යුද්ධයෙන් පසුව ක්‍රියාවට නැංවීමේ දී දක්වන ලද ඇල්මැරුණ ගතිකත්වයක් හා ඉදිරිපත් කළ යුතු විසඳුම් අත හැර දැමීම තුළ මෙන්ම අප විසින්ම පත් කරන ලද බුද්ධිමතුන් පිරිසක් විසින් හඳුනාගෙන ඉදිරිපත් කළ වඩාත් පිළිගත හැකි වාර්තාව යෝජනා කරන ලද දෑ පවා ක්‍රියාවට නැංවීමේ ප්‍රමාදයන් තුළ ඇති වූ හිඩැස තුළ නිර්මාණය වූ අර්බුදය මේ වන විට අප පසුපස එලවා පහර දෙන ප්‍රතිපත්තියකට ගමන් කර ඇති බවක් පෙනේ.

2009 මැයි 17 වන දින විමුක්ති කොටි පරාජය කළ අවස්ථාවේ මෙරට රාජ්‍ය නායකයා විසින් මාතෘ භූමිය සිප ගනිමින් පළමුව කළ යුතුව තිබුණේ ඉතිහාසයේ අපගේ පියවරුන්ගේ අනවබෝධය හා අතපසු කිරීම් තුළ ඇති වූ අභාග්‍යසම්පන්න ක්‍රියාදාමයේ ප්‍රතිඵලය වූ යුද්ධය හා එයින් අහිමි වූ පරම්පරාව පිළිබඳ ජාතියේ කණගාටුව ප්‍රකාශ කර අදාළ පාර්ශ්ව වෙත යුක්තිය ඉටු කරමු යන විවෘත හා අවංක ප්‍රතිඥාව දෙමින් විගසින් ඒ ඒ ජන කොට්ඨාශ වල දේශපාලන අභිලාෂයන් මුදුන් පත්වන ආකාරයේ ක්‍රියාදාමයකට අවතීර්ණ වීමය. එසේ වී නම් අද කටු ඔටුනු ගෙන අප පසුපස හමා එන ඒ ජාත්‍යන්තර බලවේග විසින්ම අප රාජ්‍ය පාලකයාව මෑත ඉතිහාසයේ දකුණු ආසියාව බිහි කළ අපේ කාලේ තවත් මහත්මා ගාන්ධි කෙනකු ලෙස බෞතිස්ම කරනු ලබනවා නිසැකය. එය කුමක් වුවද කිනම් බාධක පැමිණිය ද ජාතියක් ලෙස ඒ සියළු බාධක හා එම අභියෝග ජයගෙන පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුළුව අප රට තුළ පැවැත්වීමට හැකි වීමත් ඒ සමඟම පාණ්ඩුව තුළම සිටිමින් දේශපාලනිකව දැක්වූ සියළු විරෝධතා මෙන්ම මෙරට ජනවිඥානය හැසිරවීමේ ප්‍රධාන සාධකය වන බෞද්ධ පැවිදි විරෝධය පවා ජය ගනිමින් ජපානයේ හොඳ හිත තුළින් දීර්ඝ කාලීන අවශ්‍යතාවක්ව පැවති උතුරු පළාත් සභා ඡන්දය ප්‍රජාතන්ත්‍රවාදීව හා අවංකව පවත්වමින් උතුරු පළාත් සභාව ස්ථාපිත කිරීමට තරම් ධෛර්යයක් රාජ්‍ය නායකයා ලෙස ජනපති රාජපක්ෂ මහතාට තිබුණි. කුමන ආකාරයේ විවේචන එල්ල වුවද ජනාධිපතිවරයා හා උතුරු පළාත් ප්‍රධාන අමාත්‍යවරයා අතර ගොඩනැගෙමින් පවතින සංහිඳියාව මැදහත් පිරිස්වල නොමඳ සතුටට කරුණක් වන්නා සේම බාධක ජයගැනීමේ හැකියාවක් ගොඩනැගෙමින් පවතින්නේය යන විශ්වාසයක් මෙරට ජන සමාජය තුළ ප්‍රතිස්ථාපනය වෙමින් පවතින බවක් පෙනේ.

☛ ලබන සතියට

✍ සුසිල් හෙට්ටිආරච්චි
උස්වැටකෙයියාව



## පැඟල් කවිය

*මැතිවරණයේ උණුසුම ඇති — පළාතේ*
*සාමය කිය කියා ගැටුමකි — ප්‍රපාතේ*
*සල්ලි හැලේ පාවේ යන යන — පැත්තේ*
*නීතිය එල්ලලා බලු නකුටක් — මත්තේ*

*යුක්තිය රකින්නට එන්නෝ එය — කනවෝ*
*සාධාරණය හප කර කරමින් — කනවෝ*
*කෝ හැදියාව එය පෙරළාගෙන — කනවෝ*
*පන්සල් - පල්ලි - කෝවිල් - රට දැය — කනවෝ*

රාළ මීගමුවේ

## කඳුළ...



පිරුණු ගඟුලක්
ලෙසට මාගේ
නෙතේ කඳුළැල්
ගලා යන්නේ

සමිඳු කොතැනද
සොයමි දස අත
නැති ද මගෙ දුක
වටහාගත්තේ

නෙතේ කඳුළැල්
අතර විශ්වයේ
නියම අර්ථය
මට දැනෙන්නේ

කඳුළු දුන්නේ මට
ලෝකය දකින්න
ජේසුනි මම එය
පහදා ගත්තේ

✍ යෝශිනී මාසකෝරාළ
මීගමුව

# ධර්මදානීය සභා විරසකය

පසුගිය සතියෙන්

**ධර්මදානීය සභාවන්ගේ ඉගැන්වීම්**

1. දේව ධර්මයේ මැවීම් වාදය සම්බන්ධව සාකච්ඡා කෙරේ. නමුත් 19 වන සියවසේ දී පමණ ඩාවින් වාදින් ප්‍රකාශ කරනුයේ ලොව මැවීමේ ක්‍රියාවලියක පදනමක් නොමැති අතර පෘථිවිය හා ජීවයේ සම්භවය පරිණාමය වී ඇති බවය. මෙම මතයට පිළිතුරු සැපයීමට තත්කාලීන ඇතැම් ප්‍රොතෙස්තන්ත වාදී සභාවන්ට වූ නොහැකියාව හේතුවෙන් මූලධර්මවාදය සඳහා සියුම් තල්ලුවක් ලැබුණා පමණක් නොව ඔවුන් ඒ සඳහා පිළිතුරු දීමට ද ඉදිරිපත් විය. මූලධර්මවාදයට අනුව මැවීම් වාදය හෝ ඩාවින් වාදය යන දෙනෙක් එකක් සත්‍ය විය යුතුය. එම නිසා ඔවුන් විද්‍යාව ප්‍රතික්ෂේප කොට මූල ධර්ම වාදයට පැමිණියහ.
2. යුරෝපයේ වූ ප්‍රොතෙස්තන්ත ක්‍රිස්තියානිය ශුද්ධ ලියවිල්ල සම්බන්ධව විමර්ශනයක යෙදෙන්නට විය. එය ඓතිහාසික විමර්ශනයකි. ඉන් ඔවුන් අභියෝග යක් ද එල්ල කරන ලදි. එනම් පැරණි සම්ප්‍රදායික මත සමග විමර්ශනය වූ ශුද්ධ ලියවිල්ලේ ඇති පංච පුස්තකයේ මති මතාන්තර ගැලපීම කරන ලදි. මෙහි මූලිකයන් ලෙස ජර්මන් ජාතික ශුද්ධ ලියවිලි විශාරදයන් වන ජුලියස් වෙල් හවුසන් හා ග්‍රාන්ට් වැන්නන් විය. මොවුන් පෙන්වා දුන්නේ පංච පුස්තකය යාවේ, එලොයිම, ද්වීතිය හා පූජක යන සම්ප්‍රදායන් ඔස්සේ සම්පාදනය වී ඇති බවකි. ඒ සඳහා ඔවුන් තර්ක ඉදිරිපත් කරන ලදි. මෙහිදී සිදු වූයේ යුරෝපයේ වූ ධර්මදානීය පිරිස් මොවුන්ට ප්‍රතිචාර දැක්වීමට තම මත ප්‍රකාශ කරන්නට විය. පසුව මොවුන් ධර්මදානීය හා කල්විවරුන් ලෙස ප්‍රොතෙස්තන්ත සභාවන්ගෙන් ඉවත් විය. කල්විවරු ධර්මදානීය පිරිස් මෙන් නොව ඔවුන් දැඩි මතධාරින් ය. ඔවුන් රළු බවෙන් ද යුක්තය.
3. යුරෝපයේ සිදුවූ මෙම ධර්මදානීය ප්‍රගමනයේ අංකුර මහ පොළොව මත රෝපණය වීම සිදුවූයේ 19 වන සියවස අග භාගයේ දීය. මෙම බෙදී වෙන් වූ පිරිස් යුරෝපයේ සිට ඇමරිකා එක්සත් ජනපදයට සංක්‍රමණය වී එහි නැගෙනහිර හා බටහිර ප්‍රදේශයන්හි පදිංචි විය. එහි ඵලයක් ලෙස ඇමරිකාවේ ඇතැම් ප්‍රදේශයන් තුළ බහු ජාතික, බහු ආගමික සමාජයක් බිහි වී විවිධ සමාජ ලක්ෂණ ඇමරිකාව පුරා රෝපණය වන්නට විය. එහි වූ ප්‍රජාතන්ත්‍රවාදය හා නිදහස රිසි සේ භුක්ති විඳි සංක්‍රමණිකයෝ තම මූලධර්මවාදී මත හා කල්වි වාදී මත මුදාහැරීමට ඇමරිකානු රාජ්‍යය තෝතැන්නක් කරගන්නා ලදි. මෙහිදී තෘණ මූල මට්ටමින් ඇමරිකාව පුරා මෙම සභා ව්‍යාප්ත විය. මොවුන් සියළු සම්ප්‍රදායික සභා බැහැර කරයි. මෙම සභාවන් වේගයෙන් ගොඩනැගෙනවා මෙන්ම එම සභාවන්ගේ අභ්‍යන්තරයේ වූ නොයෙකුත් විෂමාචාරී ක්‍රියාවන් හා මත ගැටීම් හේතුවෙන් සභා සාමාජිකත්වය සභාවෙන් බැහැර වී වෙනත් කුඩා සභා පිහිටුවා ගැනීම දැකිය හැකිය.
4. දේව වන්දනාවේදී යොහෝවා යන නාමය භාවිත කිරීම සම්ප්‍රදායික සභාවන් වල දැකිය නොහැකිය. මන්ද YHWH යන වදන භාවිත වූයේ විශේෂ ගෞරවයක් සහිතවය. එසේම හෙබ්‍රෙව් ශුද්ධ ලියවිලි පිටපත්හි මෙම අකුරු 4 විශේෂ තීන්ත වර්ගයක් භාවිත කර සුවිශේෂී පන්හිඳකින් ලියා ඇත. මෙම පන්හිඳ වෙනත් කිසිදු ලියවිල්ලක් සඳහා භාවිත නොකරයි. මුල් දේව ජනතාව "යාවේ" යන නාමය භාවිත නොකොට" "අදෝනායි" යන නාමය දේව වන්දනාව සඳහා භාවිතයට ගන්නා ලදි. එහි අර්ථය මාගේ උතුම් වූ පුද්ගලයා යන්නයි. අදෝනායි යන නාමය නිවැරදි නොවන බවත්, දේව වන්දනාවේ දී යාවේ යන නාමය භාවිත කළ යුතු බව ධර්මදානීය සභාවන්ගේ ස්ථාවරය විය.
5. මෙම සභාවන් ගෙන හැර දක්වන තවත් මතයක් වූයේ දේව නමස්කාරය කිරීම සඳහා වූ දවස ඉරුදින නොව, සෙනසුරාදා දිනය බවයි. එය සබත් දවස බව ඔවුන්ගේ ඉගැන්වීම විය. මන්ද නික්මයාම 20:8-10 ට අනුව සබත පැවැත්වීම දේව නියෝගයකි. මෙම චෝදනාව ගෙන එන සභා පවසන්නේ ජුදා සබතේ නිවැරදි දවස සෙනසුරාදා බවත් සබත් දවස ආරම්භ වන්නේ සෑම සිකුරාදා සවසකම 6.00 සිට සෙනසුරාදා සවස 6.00 දක්වා බවත් ය. කතෝලික සභාව එය ඉරුදින බවට වෙනස් කර ඇතැයි ඔවුන් චෝදනා කරයි.
6. 144000 ක ඇදහිලිවතුන් පමණක් ලෝකය අවසාන දිනයේ දී ගැලවෙන බවට තවත් ඉගැන්වීමක් ඇතැම් සභාවන් ප්‍රකාශ කරයි. එලෙස ගැළවීම ලබන්නේ විශ්වාසිකයන් පමණකි.

☛ 15 පිටුවට

✍ එස්. හේමාල් පෙරේරා
කළුතර

# සමිඳු සවියෙන් ගොඩනැගෙන දෙව්මැඳුර

දියලගොඩ ග්‍රාමයට උතුරින් පිහිටි පයාගල පැලපොල්වත්ත නම් ගම්මානයේ සිට නැගෙනහිර දෙසට කිලෝමීටර් 7 ක් පමණ දුර යන විට හමුවන්නේ, හල්කඳවිල නම්වූ සොඳුරු ගම්මානයයි. මීට වසර කීපයකට පමණ පෙර, එක් කිතුනු දානපතියකු විසින් සාදා ශුද්ධ වූ ජූඩ් මුනිඳුන්ට කැපකරන ලද කුඩා දෙව්මැඳුර, එවකට අයත් වූයේ මතුගම මීසමටය. ආරම්භයේදී කිතුනු පවුල් 8 කට පමණ හිමිකම් කියන ලද මෙම ගම්මානයේ ජීවත්වූ වැඩි සංඛ්‍යාවක් බෞද්ධ සැදැහැවතුන්ය.

වර්ෂ 2000 දී, සාන්ත සභාව විසින් මීසම් ප්‍රතිසංවිධානය කිරීමට ගන්නා ලද තීරණය අනුව, එතෙක් මතුගම මීසමට අයත්ව තිබුණ හල්කඳවිල දෙව්මැඳුර, නව මීසමක් ලෙස ස්ථාපිත කරන ලදුව දියලගොඩ මීසමට අනුයුක්ත කරන ලදී. දියලගොඩ මීසමේ පළමු මීසම් සේවක ලෙස. ගරු වික්‍රම ෆොන්සේකා පියතුමා පත්විම් ලැබීය. එතැන් සිට වසර කීපයක් ගතවෙත්ම, මෙම දෙව්මැඳුරට අයත් කිතුනු පවුල් සංඛ්‍යාව දිනෙන් දින වැඩිවන්නට හේතුවක් වූයේ කළුතර දිසානායක, ගරු ජූලියන් තිසේරා පියතුමන්ගේ මූලිකත්වයෙන් ආරම්භ කළ 'ජූඩ් පියගම' නිවාස ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් පසුවය.

දිනෙන් දින වැඩි වන ජනගහනය නිසා දෙව්මැඳුරේ ඉඩකඩ මදි බවක්ද පෙනෙන්නට විය. වත්මන් මීසම් සේවක, ගරු තුසිත් ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමන්ගේ පාලනය යටතේ දැනට සිටින කිතුනු පවුල් සංඛ්‍යාව 180 කි. සැදැහැවතුන් සඳහා දෙව්මැඳුරේ ඉඩකඩ මදි බැවින්, මෙම දෙව්මැඳුර නවතාවයකට පත්කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව හල්කඳවිල කිතුනු ජනතාව තීරණය කර තිබුනේ, මීට වසර දෙකකට පමණ පෙර පැවති ධර්මවිවේකයකදීය. එම ධර්මවිවේකය පැවති කාලයද, අධික වැසි සහිත කාලගුණයක් වූ බැවින්, එයට සහභාගිවූ සියළු දෙනා මෙම කුඩා දෙව්මැඳුර විශාල කළයුතු බවත්, එය තමන් විසින්ම කළ යුතු දෙයක් බවත්, වටහා ගෙන තීරණයකට එළඹුනහ.

කෙසේ හෝ මෙම තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා, දැරිය යුතු වියදම් පිළිබඳව සලකා බැලීමේදී, මෙම දෙව්මැඳුර ඉදිකිරීම සඳහා ලක්ෂ 250 ක පමණ මුදලක් ඇස්තමේන්තු කර තිබුණි. ගරු පියතුමා සමග ජනතාව එක්රැස්වී කරුනු කාරනා සාකච්ඡා කොට, මූල්‍යමය කටයුතු සඳහා ක්‍රීඩා තරගයක් පැවැත්වීමට තීරණය කිරීමෙන් අනතුරුව, එය දියලගොඩ පිහිටි 'සරේ' ක්‍රීඩාංගනයේදී පැවැත්වීමෙන්, ලක්ෂ 9 ක මුදලක් උපයා ගැනීමට හැකිවිය. එම මුදලින් දෙව්මැඳුරේ මූලික කටයුතු ආරම්භ කිරීමට හැකිවිය. අප්‍රේල් මාසයේ පාස්කු ඉරුදිනක මෙම වැඩකටයුතු ආරම්භ කෙරුනි. එදින පැවති කාලගුණය අයහපත් වූයෙන්, වැඩට පැමිණි මේසන් බාස්වරු මෙහි වැඩ කටයුතු අතර මග නතර කොට යන්නට ගිය නමුත්, මීසම් ජනතාව එම කාර්යයට උරදී සාර්ථක අන්දමින් එම වැඩකටයුතු කරගෙන යෑම විශේෂත්වයකි.





එතැන් පටන් හල්කඳවිල කිතුනු ජනතාව, තම කාලය, ශ්‍රමය, කැපකරමින් මෙම උදාර කර්තව්‍යයට උර දුන්නේ දෙවිඳුන් කෙරෙහි අචල විශ්වාසය තබමින්ය. මේ සෑම වැඩකටයුත්තකදීම ජනතාව නොබියව නොසැලී ඉදිරිපත්වීම මෙහිදී කැපී පෙනෙ විශේෂත්වයකි. ලොකු කුඩා තරුණ, බාල, වැඩිහිටි, සෑම දෙනාම තමන්ගේ දෙව්මැඳුර යන හැඟීමෙන් ක්‍රියාගිලිවීම මෙම කාර්යයේ සාර්ථකත්වයට හේතුවූ බව කිවයුතු කරුණකි. දෙව්මැඳුරක් සෑදීමට ප්‍රථම, එක් එක් අංශයන් සඳහා කොන්ත්‍රාත් දීම සාමාන්‍යයෙන් සිදුවෙන දෙයකි. නමුත් මෙම දෙව්මැඳුර ගොඩනැගීමේ ක්‍රියාවලියේදී එම කොන්ත්‍රාත් පදනම් ක්‍රියා විරහිත කරමින්, වැඩි ප්‍රමාණයක් ශ්‍රමදාන මගින් ඉටුකර ගැනීමට හැකිවීම ජනතාවගේ උනන්දුවත් ඔවුන් තුළ පවතින දේව විශ්වාසයත්. පැහැදිලිව කියා පාන්නකි.

පාසල්වියේ පසුවන දරුවන්ගේ පවා, ඇඩි උනන්දුව වූයේ කෙසේ හෝ අපේ පල්ලිය අප සාදාගත යුතුය යන්නයි. රාත්‍රි 8 සිට අළුයම 5 දක්වා මෙම දරුවන් කොන්ක්‍රීට් ඇනීමේ, වැලි ඇදීමේ, ගල් ඇදීමේ කටයුතුවල දිනපතාම සහභාගි වී අළුයම 5 ට වැඩ අවසන් කොට, උදේ 7 ට පාසලටද පිය නැගූ බව අසන්නට ලැබුණි. වැඩිහිටියන්ද රාත්‍රි 8 සිට 12 දක්වා සියළු වැඩකටයුතු වලට සහය වී පසුදින තම සුපුරුදු රැකියාවට පිය නැගූ බව, ඔව්හු සතුටින් ප්‍රකාශ කළහ. මෙම දෙව්මැඳුරට අවශ්‍ය සියළුම සිමෙන්ති ගල්, කොන්ක්‍රීට් කුඩා ගල්, වැලි ආදිය සැදැහැවත් ජනතාවගේ දෙඅතින් ශ්‍රමයෙන් ඇද්දා මිස, මුදල් ගෙවා කිසි දිනක එය කර නොමැත. එපමණක්ද නොව, දෙව්මැඳුරට ආධාර පතා ජනතාව විසින් පාස්කු ඉටිපන්දම්, නත්තල් ආගමන මල්කළඹ, බයිබල් ස්ටෑන්ඩ්, නිවෙස්වල ඉදිරියෙන් සවි කිරීම සඳහා ලීයෙන් තැනූ බයිබල් පාඨද, ලී ප්‍රතිමා, ආදිය ඔවුන් නිෂ්පාදනය කර අලෙවි කරනු ලබන්නේද දෙව්මැඳුරට අවශ්‍ය වියදම් පියවා ගැනීමේ අරමුණෙන්ය. එපමණක්ද නොව, මුහුදේ දැල් ඇදීමෙන්ද, කොළ කැඳ සාදා විකිණීමෙන්ද අමතර ආදායමක් ලබාගැනීමට ඔවුන්ට හැකිවිය.

මේ දෙව්මැඳුරේ වැඩකටයුතු සිදුකරන ආකාරය පිළිබඳව විමතියට හා සතුටට පත් ඇතැම් පරිත්‍යාගශීලීන්, තමන්ට හැකි අයුරින් ආධාර උපකාර කිරීමට ඉදිරිපත් වීමත්, ඒ නිසාම කිසිදු අග හිඟගයක් නොමැතිව එදිනෙදා වැඩකටයුතු කර ගැනීමට හැකිවීම දෙවි සමිඳුන් ඔවුන් සෑම මෙහෙයවන බවට සාක්ෂියක් නොවන්නේද?

එමෙන්ම අප මීසම් සේවක ගරු පියතුමන් තුළ තිබෙන අචල භක්තිය හා විශ්වාසය මීසම් ජනතාවටද මහත් ධෛර්යයක් බව නොකියාම බැරිය. එතුමන්ගේ මඟපෙන්වීම තුළ හල්කඳවිල ජනතාව තව තවත් දිරිගැන්වෙන බව පැහැදිලිවම දක්නට ලැබෙන සුවිශේෂවූ කරුණකි. මෙම කර්තව්‍යයේදී දේව ආදරය නොඅඩුව ලැබුණ බවත්, පුදුම ප්‍රාතිහාර්යයන් සිදුවූ බවත්, පැවසූ එතුමෝ, එක් දිනක් දෙව්මැඳුරේ වැඩකටයුතු සඳහා සිමෙන්ති ගන්නට මුදල් නොමැතිව සිටි අවස්ථාවක, හදිසියෙන්ම පියතුමා හමුවීමට පැමිණි තරුණයෙක් එතුමා අමතා, පියතුමෙනි, හල්කඳවිල පල්ලියේ වැඩකටයුතු සඳහා සිමෙන්ති කොට්ට 20 ක් දෙන්න මම අදහස් කළා ඒ බව කියන්නයි මම පැමිණියේ යයි ඔහු පැවසූ සැටිත්, එමෙන්ම මතුගම පරිත්‍යාගශීලි මහත්මයකු විසින් ලබාදුන් ගසක් කපා ගැනීමට රජයේ අවසරය ලබාගැනීමට කීප වතාවක් ගිය නමුත්, එය නොලැබුණ නිසා, එම අදහස අත්හැර දමා තිබුණි. පසුව හදිසියෙන්ම එම අවසරය ලැබුණ පසු එම ගස කපා ගැනීමට හැකිවිය. මෙවැනි සිදුවීම් තුලින් දේව ආදරය කොතෙක්ද යන්න අත්දකිමින් ජනතාව ඉටුකරන සේවය ගැන මුළු හදින් සතුටුවන බවද ගරු පියතුමා පැවසීය.

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**

# අනේ දුවේ, පුතේ අපව තනිකරන්න එපා!

“ෆාදර්........ අපෙ අම්ම ඊයෙ රාත්‍රියෙ අන්ත්‍රාවෙලා මට Funeral එකට එන්නට ලැබෙන්නෙ නෑ..... Father ට පුළුවන්නම් මං වෙනුවෙන් අපේ ගෙදරට ගිහිල්ල පුළුවන් උදව්වක් කරන්ඩකො.....” මේ එක්තරා පියතුමකුට විදේශගතව සිටින එක්තරා පුද්ගලයකු විසින් හිමිදිරි පාන්දරින්ම ලබාදුන් දුරකථන පණිවුඩයකි. එම පණිවුඩය මගින් අපට කියාපාන්නේ ඩොලර් ඩිනාර් හමුවේ අද ලාංකික දෙමාපියන් අත්විඳින තවත් ශෝචනීය පැතිකඩකි.

දස පණතේ හතරවැනි වගන්තිය අපට පහදා දෙන්නේ “දෙමාපියන්ට සංග්‍රහ කරන්න” යන්නය. මෙයින් අදහස් කරන්නේ දස මසක් කුස දරා රෑ නිදි වරමින්, සිය ලේ කිරට හරවා, දරුවකු රෝගී වූ විට දුක් කඳුළු හෙලමින් සිය දරුවාට සුවය ලබාදෙන්නට වෙහෙසෙන අම්මලාවද. දරුවකු මව්කුසට ඇතුළුවූ දින සිට උපත, ළදරු විය, ළමා විය, තරුණවිය සහ විවාහය දක්වාද විවාහයෙන් පසුව දරුවන්ගේ දරුවන් වෙනුවෙන්ද කැපවෙමින්, ඔවුන් වෙනුවෙන් වෙහෙසෙමින් දහඩිය හෙලන පියවරුන්වද ඔවුන්ගේ ජීවිතයේ අවසාන කාලයේදී / ජීවිතයේ සැඳෑ සමයේදී ආදරයෙන් රැකබලා ගත යුතු බවය. ඒ දෙවියන් වහන්සේ අපට දස පණත තුළින් දුන් ලස්සනම නියෝගයකි. එහෙත් වර්තමානයේ දරුවන් වෙනුවෙන් වැයවී, දරුවන් වෙනුවෙන් සිය ධනය, ගෙවල් දොරවල්, ඉඩ කඩම් පවා පරිත්‍යාග කරන සමහර දෙමාපියනට සිදුව ඇත්තේ ඉහත නීති උඩු යටිකුරු වී ජීවිතයේ සැඳෑ සමයේදි දරුවන්ගෙන් වෙන්වී වැඩිහිටි නිවාස / මහළු නිවාස වලට කොටුවීමටය.

2012.10.21 වන දින ප්‍රදීපය / Messanger පුවත් පත්වලට ප්‍රසිද්ධ කිතුනු කාටූන් ශිල්පී කැමිලස් පෙරේරාගේ තිත්ත ඇත්ත කාටූනය මේ සබැඳිව වටිනා උපහාසයක් සමාජයට පෙන්වා දෙයි. සිය පියාගේ හෝ මවගේ අවමඟුලකදී විදේස්ගතව සිටින සිය දරුවන් විසින් ලාංකික මල්ශාලා වෙතින් එවන ලදුව දේහය බහා ඇති පෙට්ටිය වටේ මල්වඩම් තබා ඇති අයුරුත් එම මල් වඩම් වල ප්‍රංශයේ සිටින පුතා, ඇමරිකාවේ සිටින දුව, ඕස්ට්‍රේලියාවේ පුතා යනුවෙන් සටහන් වී ඇති අයුරුත්, යදම් කඩාගත් කෙලෙහිගුණ දන්නා බල්ලා පමණක් කඳුළු වගුරුවමින් දේහය අසල වැතිර සිටින අයුරුත්ය.

මමද සාමාජිකත්වය දරණ එක්තරා ස්වෙච්ඡා සංවිධානයක් විසින් තවත් ස්වෙච්ඡා සංවිධානයක් විසින් සාර්ථකව පවත්වාගෙන යන පිරිමින් පමණක් නේවාසිකව සිටින එක්තරා වැඩිහිටි නිවාසයක් සඳහා වාර්ෂිකව සිදුකෙරෙන දානමය පුන්‍යකර්මයක් සඳහා සහභාගීවීමට පසුගියදා මටද අවස්ථාවක් ලැබිනි. දිවා ආහාරයට පෙර පැවැති සුහද හමුවේදී එහි නේවාසිකව සිටි පිරිසගෙන් සියයට අනූ දෙනෙක් පමණ ඉකි ගසමින්, කඳුළු වගුරුවමින් අප වෙත දන්වා සිටියේ ඔවුන්ගේ දරුවන් සියල්ලන්ම ඩොලර්, ඩිනාර් වලට වහල්වී පවුල් පිටින්ම විදෙස් ගතවී සිටින බවත්, සිය භාර්යාවන්ගේ වියෝවෙන් පසුව ඔවුන්ගේ මාසික විශ්‍රාම වැටුප මෙම ආයතනයට හරවා ඔවුන් මෙහි නේවාසිකව ජීවිතයේ සැඳෑ සමය ගෙවන බවය.

තමාට සිටියේ එකම දියණියක් පමණක් බවත්. අ.පො.ස (උ/පෙළ) විභාගයේදී ලංකාවේ සරසවියකට ඇතුළුවීමට තරම් ලකුණු ප්‍රමාණය මදිවූ හෙයින් සිය බිරියට අයත්ව තිබූ අක්කර දෙකක පමණ පොල් ඉඩමක් විකුණා එම මුදල වැය කොට දියණියව විදේශ සරසවියකට ඇතුල්කළ බවත්, සරසවි අධ්‍යාපනය අවසන් වීමෙන් පසුව එම සරසවියේම සිටි තවත් විදේශ තරුණයකු හා ඇය විවාහ වූ බවත් දැන් ඔවුන් ලංකාවට නොඑන බවත්, මේ පිළිබඳව කලකිරුණ සිය බිරියි පසුගියදා අකාලයේ මියගිය බවත් අඩුතරමින් මවගේ දේහයට අවසන් ගෞරවය දැක්වීම සඳහාවත් දියණිය ලංකාවට නොපැමිණි බවත්. තනිකමක්, කාන්සියක් දරා ගැන්මට නොහැකිවූ තැන සිය, නිවස පර්චස් 10 ක ඉඩම විකුණා දමා තමා මෙම ආයතනයට නේවාසිකයකු ලෙස පැමිණියේ ජීවිතය පිළිබඳව විශාල කලකිරීමකින් බවත්ය.

යසවර්ධන+ස්වර්ණා යුවලට දරු තිදෙනෙකි. ඒ පුතකු හා දියණියන් දෙදෙනකු වශයෙන්ය. යසවර්ධන රජයේ උසස් නිලධාරියකු ලෙස අගනුවර පිහිටි නිල නිවාසයක පදිංචි වී දරු තිදෙනාම අගනුවර සුපිරි පාසල් දෙකකට ඇතුලත් කරන ලදි. වැඩිමහල් පුතා උසස් අධ්‍යාපනයෙන් පසුව විදෙස් සරසවියකට ඇතුලත් කරන ලද්දේ යසවර්ධන සතුව තිබූ ඉඩමක් විකුණා එම මුදලිනි. දියණියන් දෙදෙනාද තාක්ෂණය පිළිබඳව උපාධිය ලැබගෙන විවාහයෙන් පසු විදෙස් ගත වූයේ සිය සැමියන් සමගමය. යසවර්ධන යුවලගේ පුතාද විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙන් පසුව එම රටේම තරුණියක සමග යුගදිවියට එක්විය. යසවර්ධන රැකියාවෙන් විශ්‍රාම ලබා කොළඹට ආසන්නයේම නව නිවසක් මිළදීගෙන ස්වර්ණ සමග එහි පදිංචි විය. පසුගිය වසර අවසානයේ හදිසි හෘදයාබාධයකින් යසවර්ධන දෙනෙක් පියාගන්නා ලදි. දරු තිදෙනාම එකට ලංකාවට එනතුරු ස්වර්ණාට සිය සැමියාගේ දේහය අගනුවර මල්ශාලාවක අධිශීතකරණයක බහාලන්නට සිදුවිය. දින ගණනාවකට පසු දරු තිදෙනාම ලංකාවට පැමිණෙන දිනයේ උදයේම යසවර්ධනගේ දේහය නිවෙස වෙත ගෙන යන ලදින් එදිනම මිහිදන් කරන ලදි. සිය මවගේ අනාගතය පිළිබඳව වැඩිහිටියන් දරුවන් තිදෙනා විමසූ විට වැඩිමහල් පුතාගේ නිගමනය වූයේ සිය බිරිය විදෙස් කතක් නිසා මැණියන්ව බලාගැනීම අපහසු බවය.

දියණියන් දෙදෙනාගේ මතය වූයේ අම්මා ඔවුන් සමග ඕස්ට්‍රේලියාවට පැමිණිය යුතු බවත් දරුවන්ගේ අධ්‍යාපනය ඔවුන්ගේ රැකියා නිසා නැවත ලංකාවට පැමිණීමට අපහසු බවය. කෙසේ වුවද පසුදිනම දරුවන් නැවත විදෙස් ගතවූයේ සිය මැණියන්ට ගෘහ සේවිකාවකගේ ආරක්ෂාව ලබාදීමෙන් අනතුරුවය. අද වන විට ලංකාව පුරා බොහෝ දෙමාපියන් මෙම තත්ත්වයනට මුහුණ දී සිටින අතර එවන් බොහෝ දෙමාපියන්ගේ අදහස වන්නේ දරුවන්ට විදෙස් අධ්‍යාපනය ලබාදීමේ වරද නිසා ඔවුන් අද තනිවී සිටින බවත්, එක් දරුවෙකුව හෝ සාමාන්‍ය අධ්‍යාපනයට යොමුකළේ නම් ඔවුන් අද දරු මුණුපුරන් සමග සතුටින් දිවිගෙවන බවත්ය.

අදවන විට සමස්ත ශ්‍රී ලංකාව පුරාම මෙවන් සිද්ධි සාමාන්‍ය සිද්ධි බවට පත්ව ඇති අතර සමහර දෙමාපියන් සිය දරුවන්ගේ නිවෙස්වල අඳුරු කුටිවල සිරවී සිටින අයුරුද වරින්වර ජනමාධ්‍ය ඔස්සේ අපට අසන්නට, දකින්නට ලැබෙන අතර අනේක වෙහෙස විඳ සිය දරුවන් කවා පොවා හරි හම්බ කරන සියළු චංචල, නිශ්චල දේපොල සිය දරුවන් වෙනුවෙන් වැය කළද, වත්මන් සමාජ රටාව, ආර්ථික රටාව හමුවේ දරුවන් සිය දෙමාපියන්ගේ සැඳෑ කාලයේදී ඔවුන් තනිකිරීම, ඔවුන් කොන්කිරීම, ඔවුන්ට නොසලකා හැරීම කිසිසේත්ම අනුමත කළ නොහැකි වරදකි. එහෙත් සියළුම දරුවන් වෙත මෙම චෝදනාව එල්ලකළ නොහැකි අතර යුතුකම් දන්නා දරුවන්ද අප අතර එමටය. ඔවුන් කෙතරම් අගහිඟකම් මත්තේ වුවද සිය දෙමාපියන් වෙනුවෙන් සියළුම යුතුකම් ඉටුකරන්නේ සිය දෙමාපියන් වෙනුවෙන් ඔවුනට හැකි අයුරින් සිය දෙමාපියන්ගේ අවසන් කාලය, නැතහොත් ඔවුන්ගේ ජීවිතයේ සැඳෑ සමය සතුටින් තබනු පිණිසය.

දේව නියමය අනුව දස පණතේ හතරවැනි පනතින්ද, රටක සාමාන්‍ය නීතිය ඔස්සේද සිය දෙමාපියන් රැකබලා ගැන්ම මෙන්ම ඔවුන්ව පෝෂණය කිරීමද අත්‍යාවශ්‍ය කරුණක් වන අතර සිය දෙමාපියනට නොසලකන දරුවන්ගේ, දරුවන් වෙතින්ද එම ආදර්ශය ගන්නා බැව්ද නොරහසකි. රජය මෙන්ම ආගමික නායකයන්ද මෙලෙස අසරණවන දෙමාපියන් වෙනුවෙන් වැඩ සටහන් දියත් කොට, ඔවුන්ගේ ජීවිත සතුටින් තබනට හැකි ක්‍රමවේදයන් සකස් කරන්නේ නම් එය දරුවන් වෙතින් ගිලිහෙන ආදරය, කරුණාව ඔවුන් වෙත ලැබ දෙන්නට මාර්ගයක් වනු නොඅනුමානය.

**වැලිවිට එම්. ජෝ. පාරිස්**

පහන්

## ශ්‍රී ලාංකික මරියතුමියගේ හමුදා භටයනට පහන් ටැඹක් වූ

# ගොඩ්වින් මෙන්ඩිස් සහෝදරයා

**ශ්‍රීට වසර 15 කට පෙර මරියතුමියගේ හමුදාවේ සුවිශේෂ සාමාජිකයෙක් - උද්යෝගිමත් සමාජ සේවකයෙක් - මෙලොවින් සමුගත්තේ ය. හේ නමින් ගොඩ්වින් මෙන්ඩිස් විය.**

මේ වන විට ලෝකයේ රටවල් 180 ක් පුරා පැතිරී ඇති, කතෝලික සභාවේ ඇවැන්ත ගිහි අපෝස්තලික සංවිධානය වන මරියතුමියගේ හමුදාව මෙම දිවයිනේ ඇරඹුණු මුල් අවධියේ ම ගොඩ්වින් මෙන්ඩිස් තරුණයා ද එහි ක්‍රියාකාරි සාමාජිකයකු වී, මරියතුමියගේ හමුදා සේවාව කෙරෙහි ඔහු තුළ වූ දැඩි කැප වීමත්, එම අපෝස්තලික සංවිධානය පිළිබඳව ඔහු ලබා ගත් දැනුම් සම්භාරයත් හේතු කොට ගෙන වැඩි කල් ගත වන්නට පෙර හේ, එම හමුදාවේ මූලික ඒකකය වන ප්‍රිසීඩියමේ පමණක් නොව ක්‍යුරියා සභාව සහ කොමිට්සියම් සභාව වැනි පාලක සභාවල ද, ශ්‍රී ලංකාව තුළ ඇති ශ්‍රේෂ්ඨතම පාලක සභාව වන සෙනාටස් සභාවේ ද නිලධරයකු විය. ඔහු පිළිබඳව දන්නා මරියතුමියගේ හමුදා භටයන්. නායකත්වය හා උපදෙස් පතා හැරුනේ ඔහු දෙසට ය. ඔහුගෙන් ලැබුණු නායකත්වය නිවැරැදි සහ ආදර්ශවත් නායකත්වයක් විය. එසේ ම ඔහුගෙන් ලැබුණු උපදෙස් අංගසම්පූර්ණ උපදෙස් විය. මරියතුමියගේ හමුදාවේ ලීලාවෙන් පූර්ණ ව සිටි ඔහු තුළින් එම ලීලාව උතුරා ගියේ ය.

මරියතුමියගේ හමුදාවේ නිර්මාතෘ වන අයර්ලන්තයේ ඩබ්ලින් නුවර විසූ ෆ්‍රැන්ක් ඩෆ් සහෝදරයා හමු වී පැමිණ, මෙම දිවයිනේ හැම මීසමක ම මරියතුමියගේ හමුදා ශාඛාවක් ඇති කිරීමේ අරමුණින් ප්‍රචාරක කටයුතුවල යෙදුණු මෙන්ඩිස් සහෝදරයා "ශ්‍රී ලංකාවේ ෆ්‍රැන්ක් ඩෆ්" යනුවෙන් හැඳින්විනි. අනාගත දරුවන් රැක බලා ගැනීම, ඔවුනට අධ්‍යාපනය සහ ක්‍රිස්තියානි හැඩගැස්මක් පමණක් නොව වෘත්තීය පුහුණුවක් ද ලබා දීම අරමුණු කර ගෙන වසර 1974 දී ගොඩ්වින් මෙන්ඩිස් සහෝදරයාගේ මූලිකත්වයෙන් කොළඹ මට්ටක්කුලියේ ඇරඹුණු 'මව් සෙවන' ආයතනය එම සහෝදරයාගේ සේවාවේ විශේෂ සිහිවටනයක් වශයෙන් අදත් සාර්ථක ව පැවැත්වෙයි. දැනට එම ආයතනයේ රැකවරණය ලබන දරුවන්ගේ සංඛ්‍යාව 30 ක් පමණ වෙයි. කැපී පෙනෙන, වීරෝදාර සේවාවක් කළ මරියතුමියගේ හමුදා භටයන් වශයෙන් සැලකෙන දකුණු අප්‍රිකාවේ එඩ්ල් ක්වීන් සහ ලතින් අමෙරිකාවේ අල්පෝන්සෝ ලැම්බ් වැන්නවුන්ගේ නාමාවලියට ශ්‍රී ලංකාවේ ගොඩ්වින් මෙන්ඩිස් සහෝදරයාගේ නාමය ද එක් විය යුතු යැයි කිවහොත්, එය ඔහු පිළිබඳ අධි තක්සේරුවක් යැයි මම මොහොතකටවත් නො සිතමි. සිය ගිහි අපෝස්තලික සේවාව අරඹා විසි වසරක් පමණ ගත වන විට, මෙම දිවයිනේ ගිහි අපෝස්තලික සේවාවේ යෙදෙන්නන් අතර මුල් පෙළේ මුල් අසුනක් ඔහුට හිමි වී තිබූ බවට සාක්ෂ්‍යයක් වශයෙන්, 1967 දී පැවැත්වුණු දෙවැනි වතිකාන සම්මේලනයට සහභාගි වීම සඳහා තෝරා ගැනුණු ශ්‍රී ලාංකික ගිහි කතෝලිකයන් දෙදෙනාගෙන් එක් කෙනෙක් ඔහු විය.

### පවුල් අධ්‍යයන සහ සේවා ආයතනය

වසර 1972 දී පවුල් සංස්ථාව නගා සිටුවීම සඳහා පවුල් අධ්‍යයන සහ සේවා ආයතනය ආරම්භක ගරු ආචාර්ය මර්වින් ප්‍රනාන්දු පියතුමා එහි වැඩ කටයුතු සඳහා ගොඩ්වින් මෙන්ඩිස් සහෝදරයා ද සහභාගි කර ගත්තේ ය. එම ආයතනයේ වැඩ කටයුතු සාර්ථක ව කර ගෙන යැමට මෙන්ඩිස් සහෝදරයා තුළ තිබූ දක්ෂතාවත්, ඒ සඳහා ඔහුගේ පූර්ණ කැප වීමත් මැනැවින් අවබෝධ කර ගත් එම පියතුමා, එය පිහිටුවා වසර 7 කට පසු එහි විධායක අධ්‍යක්ෂ ධූරය ඔහුට පවරා, කොළඹ පිට කොටුවේ සවැනි පාවුළු මධ්‍යස්ථානයේ පිහිටි එම සංවිධානයේ මූලස්ථානය ඔහුට බාර දී, එම සංවිධානයේ සභාපති තනතුර පමණක් තමා වෙත තබා ගත්තේ ය. පූර්ණ කාලීන ව ආගමික සහ සමාජ සේවාවට කැප වීමට අදිටන් කර ගත් මෙන්ඩිස් සහෝදරයා සිය 49 වැනි වියේ දී රජයේ සේවාවෙන් සමු ගත්තේ ය.

### මනෝ විද්‍යාත්මක උපදේශනය

පවුල් අධ්‍යයන සහ සේවා ආයතනයෙන් සැලැසෙන සේවාවන් අතර ප්‍රමුඛස්ථානයෙහි ලා ගැනෙනුයේ උපදේශන සේවාවයි. කිසි ම භේදයක් නොතකා හැමටම සේවාව සලසන මෙම ආයතනයෙන් මෙන්ඩිස් මහතාගේ සේවා කාලය තුළ දී වසරකට උපදේශන සේවාව ලැබූවන්ගේ සංඛ්‍යාව 500 කට අධික විය. ඉංග්‍රීසි, සිංහල භාෂා දෙකෙන්ම උපදේශකයන් පුහුණු කැරෙන මෙම ආයතනය මඟින්, ගොඩ්වින් මෙන්ඩිස් සහෝදරයා මිය යන විට පුහුණු කර තිබූ සංඛ්‍යාව 1200 කට අධික ය. මෙම ආයතනයෙන් කැරෙන උපදේශනයේ සහ උපදේශක පුහුණුවේ සාර්ථකත්වය සහ අංගසම්පූර්ණත්වය පිළිග ැනීමක් වශයෙන් විවිධ රාජ්‍ය ආයතන සඳහා ද මෙම ආයතනයේ සේවාව ලබා ගන්නා ලදී. ඒ අනුව පොලිස් දෙපාර්තමේන්තුව යටතේ ඇති කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ නිලධරයනට ද, අධිකරණ අමාත්‍යංශය යටතේ උසාවිවල සේවාවේ යෙදෙන පවුල් උසාවි උපදේශකයනට ද, ළමා රක්ෂණ දෙපර්තමේන්තුව යටතේ සේවාවේ යෙදෙන පරිවාස නිලධරයනට ද, සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ සේවාවේ යෙදෙන සමාජ සේවා නිලධරයනට ද උපදේශන පුහුණුව සපයන ලද්දේ මෙම ආයතනය විසිනි. මීට අමතර ව රාජ්‍ය නොවන විවිධ ආයතන සඳහා ද, පාසල් සඳහා ද උපදේශකයන් පුහුණු කිරීම මෙම ආයතනය විසින් සිදු කැරිණි.

### විවාහ අපේක්ෂක සමුළු

විවාහය සාර්ථක කර ගැනීම සඳහා පුහුණුවක් අවශ්‍ය ය යන පදනම යටතේ මෙම ආයතනය විසින් විවාහ අපේක්ෂක සමුළු රාශියක් පවත්වන ලදී. එවැනි ඉංග්‍රීසි මාධ්‍ය සමුළුවක් කොළඹ පිට කොටුවේ සවැනි පාවුළු මධ්‍යස්ථානයේ පැවැත්වුණු අතර සිංහල මාධ්‍ය සමුළු තම්මිට, කඩවත, රාවතාවත්ත, අවිස්සාවේල්ල ආදි විවිධ ස්ථානවල පැවැත්වුණි. මෙන්ඩිස් සහෝදරයාගේ සේවා කාලය අවසන් වන විට, එම ආයතනය විසින් පැවැත්වුණු සමුළුවලට සහභාගි වී සිටියවුන්ගේ සංඛ්‍යාව 8000 ඉක්මවා තිබිණි.



ඔහුගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු එවැනි වැඩ සටහන්වලට සහභාගි වූවන්ගේ සංඛ්‍යාව 50000 ඉක්මවා ඇත. තරුණ තරුණියනට ජීවිත අධ්‍යයනය ලබා දීම අරමුණු කර ගෙන ද්විතීය පාසල් දරුවන් සහ පාසල් හැර ගිය තරුණ තරුණියන් සඳහා වැඩ සටහන් විශාල සංඛ්‍යාවක් මෙම ආයතනය විසින් මෙහෙයවා ඇත. මෙන්ඩිස් සහෝදරයාගේ සේවා කාලය තුළ දී කොළඹ දිස්ත්‍රික්කය තුළ පමණක් නොව කැකිරාව, මාදම්පේ, ඇල්පිටිය, නවගමුව, ගාල්ල, දෙහිඔවිට, හිඟුරක්ගො ඩ, පොලොන්නරුව, රත්නපුර, කුරුණෑගල, අනුරාධපුර, මතුගම. කැගල්ල ආදි ප්‍රදේශවල ද මෙවැනි වැඩ සටහන් රාශියක් පවත්වා ඇති අතර ඒවාට සහභාගි වූවන්ගේ සංඛ්‍යාව 30000 ඉක්මවා ඇත.

### ප්‍රාදේශීය සමුළු, ජාතික සමුළු සහ ජාත්‍යන්තර සමුළු

මෙම ආයතනය මඟින් විවිධ අරමුණු මුල්කර ගෙන, දිවයිනේ විවිධ ප්‍රදේශවල සමුළු රාශියක් පවත්වා ඇත. ජාත්‍යන්තර පවුල් වර්ෂය වෙනුවෙන්, "ශ්‍රී ලංකාවේ පවුල කොයිබට ද" යන මැයෙන් 1994 දී පැවැත්වුණු ජාතික සමුළුව ඉන් ප්‍රධාන තැනක් ගනියි. 1976 වසරේ දී පවුල් ජීවිතය පෝෂණය සඳහා වන ජාත්‍යන්තර සම්මේලනයේ සාමාජිකත්වය ලැබීම නිසා එම සංවිධානය මඟින් විවිධ රටවල පැවැත්වුණු සම්මේලනවලට සහභාගි වීමේ අවස්ථාව ද ගොඩ්වින් මෙන්ඩිස් සහෝදරයාට ලැබිණි.

පවුල් අධ්‍යයන සහ සේවා ආයතනයේ සේවාවන් සිදුවනුයේ ගිහි පැවිදි කීප දෙනකුගේ ම සහභාගිත්වය සහ කැපවීම මතය. ගොඩ්වින් මෙන්ඩිස් මහතාගේ දකුණු අත මෙන් ක්‍රියා කළ මරියතුමියගේ හමුදාවේ උද්යෝගිමත් භටයකු වූ මයිකල් ලියනගේ සහෝදරයා ඔවුන් අතර විශේෂ තැනක් ගත් බව ද සඳහන් කළ යුතුය. එම ආයතනය ඇරඹූ මුල් කාලයේ සිට ම එහි විධායක අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කළ ගොඩ්වින් මෙන්ඩිස් සහෝදරයාට උපහාර පිණිස, එම ආයතනයෙන් සිදු වූ සේවාවෙන් බිඳක් මෙසේ සඳහන් කිරීම උචිතය යැයි සිතමි.

### ආදර්ශවත් ක්‍රිස්තු ශ්‍රාවකයා

"මා නුඹලාට ප්‍රේම කළාක් මෙන් නුඹලාත් එකිනෙකාට ප්‍රේම කරපල්ලා, මේ ලකුණින්, එනම් ප්‍රේමයේ ලකුණින්, නුඹලා මාගේ ශ්‍රාවකයන් බව ලෝකයා දැන ගන්නහු ය" යනුවෙන් කිතු සමිඳාණන් වහන්සේ ම සඳහන් කළ ඒ මිණුම් දණ්ඩ අනුව, තමා ඇසුරු කළ සියල්ලනට ම ප්‍රේම කරමින් තම උපරිම ශක්තියෙන් ඔවුන් උදෙසා සේවාවේ යෙදුණු ගොඩ්වින් සහෝදරයා වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම ක්‍රිස්තු ශ්‍රාවකයෙක් විය.

### සේවාව අගැයීම

ගොඩ්වින් මෙන්ඩිස් සහෝදරයාගේ අවමංගල්‍ය අවස්ථාවේ දී, ඔහුගේ සේවාව අගයමින් කතා කළ, දිගු කලක් ඔහු හා සමග එකට සේවාවේ යෙදුණු, ගරු ආචාර්ය මර්වින් ප්‍රනාන්දු පියතුමා ප්‍රකාශ කළේ ගොඩ්වින් මෙන්ඩිස් සහෝදරයා වැන්නවුන් බිහි වනුයේ දස ලක්ෂයකට එක් කෙනකු පමණක් බව ය. එය ඉතා නිවැරැදි තක්සේරුවක් යැයි හඟිමි.

ගොඩ්වින් මෙන්ඩිස් සහෝදරයා කෙතරම් සුවිසල් ආගමික සහ සමාජ මෙහෙවරක යෙදුණ ද, පෙම්බර ස්වාමිපුරුෂයකු සහ ආදරවන්ත පියකු වශයෙන් තමාගෙන් සිදු විය යුතු යුතුකම් හේ නොපිරිහෙලා ඉටු කළේ ය. ඔහුගේ මූලිකත්වයෙන් ඇරඹුණු 'මව් සෙවන' ආයතනය නොකඩවා සාර්ථක ව පවත්වා ගෙන යැමට ඔහුගේ පවුලේ සාමාජිකයන්ගෙන් ලැබෙන මහඟු දායකත්වයත්. ඔහුගේ අභාවයෙන් වසර 15 කට පසු ඔහුගේ ඒ සුවිශේෂ ආගමික සහ සමාජ මෙහෙවර අළලා සමරුග්‍රන්ථයක් පළ කිරීමත්, ඔහු කෙරෙහි ඔවුන් තුළ නොඅඩු ව පවත්නා, ආදරයේ සහ ගෞරවයේ සංකේත වශයෙන් සලකමි.

**ඩබ්ලිව් එම්. ප්‍රනාන්දු**
**මරියතුමියගේ හමුදාවේ තුඩැල්ල ප්‍රිසීඩියමේ සභාපති**

---

# වෛද්‍යාචාරිණී ජුලියට් ප්‍රනාන්දු

කොළඹ මෝදර පදිංචිව සිටි වින්සන්ට් සහ ගර්ට්රූඩ් ඩයස්ගේ වැඩිමහල් දියණිය වන්නේ වෛද්‍යාචාරිණී ජුලියට් ප්‍රනාන්දු (විවාහයට පෙර ඩයස්) යන අයයි. කොටහේනේ යහපත් එඬේරා කන්‍යාරාමයෙන් සහ බම්බලපිටිය යහපත් එඬේරා කන්‍යාරාමයෙන් විශිෂ්ට ලෙස අධ්‍යාපනය හමාර කොට, කොළඹ වෛද්‍ය විද්‍යාලයෙන් උපාධිය ලබා ගත්තේ 1960 වසරේදීය. කටුනේරියේ පදිංචි (මියගිය) එම්මානුවෙල් ප්‍රනාන්දුගේ භාර්යාවද, ඩිප් ප්‍රොඩක්ට්හි අධ්‍යක්ෂ සුපාල ප්‍රනාන්දුගේ මාතාවද, මෙලනිගේ නැන්දම්මා වූද ඇයට මුණුබුරු මිණිපිරියන් සතර දෙනෙකි (ප්‍රිමාල්, ෂෙහානි, මලිත් සහ වෙව්දු).



ලොකු අක්කා යන සුරතල් නාමයෙන් ඇමතූ ඇයට බාල සහෝදර සහෝදරියන් සත්දෙනෙකුද විය. අවුරුදු 81 ක් ආයු වළඳා 2014 පෙබරවාරි 14 දින සග සැපත් වූවාය. ඇයගේ ස්වාමිපුරුෂයා ස්වර්ගස්ථ වී අවුරුදු තුනක් පිරුණු දිනය එය විය. අවුරුදු තුනක් තිස්සේ ඔත්පලව සිටින විටදී සත්ප්‍රසාදීය ජේසුව ලබාගැනීමට ඈ බලාසිටියෙ ඉමහත් බලාපොරොත්තුවකිනි.

මාරාවිල දිස්ත්‍රික් වෛද්‍ය සහයිකාව වශයෙන් සේවය කළ ඉක්බිති, කටුනේරිය පුද්ගලික වෛද්‍ය සේවයේ ඈ යෙදුනාය.1967 දී මනෝචිකිත්සව පිළිබඳ උසස්ම පශ්චාත් උපාධිය ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් (M'R'C' Royche-Lond) ලබාගත් ඈ ලන්ඩන් නුවරම විවිධ ආරෝග්‍ය ශාලාවල සේවය කළාය.

1998 දී ශ්‍රී ලංකාවට පැමිණ කටුනේරියෙ මනෝචිකිත්සා සේවයෙහි යෙදුණාය. ඒ වන විට පුත්තලම, හලාවත සහ මීගමු යන ආරෝග්‍යශාලාවල ස්ථාවර මනෝචිකිත්සක වෛද්‍යවරයෙක් (resident psychiatrist) නොසිටියේය. ඒ හෙයින් ඇගේ කාරුණික මෙන්ම ප්‍රබුද්ධ සේවය ලබා සුව වූවන් අනන්තය.

කලක් කටුනේරිය මීසම පාලකව සිටි හයසින්ත් තිසේරා පියතුමා ලොකු අක්කාගේ අවසාන කටයුතු වලදි කෙරුණ කෙටි දේශනයේදී සඳහන් කළේ කටුනේරියේ ඇගේ නිවස හා වෛද්‍ය කාර්යාලය 400 කට ආසන්න මත්ලෝලයින් හට සුව සහනය දුන් තෝතැන්නක් බවයි. ශුද්ධවූ අන්තෝනි මුනිතුමන් වෙත ඈ තුළ වූයේ අචල භක්තියකි. කටුනේරිය වැල්ලේ පිහිටි ශාන්ත අන්තෝනි මුනිතුමන්ගේ දේවස්ථානයේ සති පතා පැවැත්වූ මත්ලෝලයින්ගේ සංසද රැස්වීම මගින් විශාල ගණනකට සුවය ලැබී ඇත. එම සංසදයේ පුනර්ජීවනයට ලොකු අක්කාගෙන් ලැබුනු සහය විශිෂ්ටය. ඇයට සගසුව පතමු.


**ගරු නොයෙල් ඩයස් පියතුමා**

---

# අනූ විය සමරන සාම විනිසුරු කතෝලික විදුහල්පතිවරයා

ජාඇල නිවන්දම අංක 126A නිවසේ පදිංචි ඩී. පී. වීරසිංහ ගුරුපියා මග්ගොන ගුරු ඇබෑසි විදුහලට ඇතුල්වී 1943 සිට 1945 දක්වා පුහුණුව ලබා 1946 දී මී/කටුවාපිටිය රෝ.ක. පිරිමි විදුහලේ සේවයට පත්වී ඉන්පසු වැවල රෝ. ක. පිරිමි, ජාඇල සා. මරියා යන විදුහල්වල සේවයකර 1949 දී ගාලු පදවියේ ර/ සා. ඇලෝසියස් විදුහලේ හා බලංගොඩ රෝ. ක. විදුහලේ සේවයට පත්වී බලංගොඩ විදුහලේ වසර දහයක්ම කතෝලික දරු දැරියන්ගේ විෂය දැනුම මෙන්ම දහම් දැනුමද නගාසිටුවීමට ඇප කැපවූ බව නොරහසකි.

එතුමා ගුරු පුහුණුව ලැබීමෙන් පසු ශාරීරිකාභ්‍යාස හා මළල ක්‍රීඩා පිළිබඳ සහතිකය - චිත්‍ර කලා සහතිකය හා පාසල් පරිපාලන සහතිකය අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ලබා ඇත.



බලංගොඩ රෝ. ක. විදුහලේ එතුමාගේ විශිෂ්ට සේවය අගය කොට එම විදුහලේ විදුහල්පති තනතුරට පත් කරන ලදි. ආධාර ලබන පාසල් රජයට පවරා ගැනීම සමග නැවත ගම් ප්‍රදේශයට එනම් ගම්පහ දිස්ත්‍රික්කයේ සේවයට පත්වීමට අවකාශ ලැබිණ. මී/ සිදුව බණ්ඩාරවත්ත කනිෂ්ඨ විදුහල - රාගම මහ විදුහල් - ඇලතුර කනිෂ්ඨ විදුහල අවසාන කාලය ගම්/ තිබ්බොටුගොඩ ගාමිණී විදුහලේ සේවය කොට විශ්‍රාම ගත්තේය. එතුමාගේ සේවා කාලයේදී රාගම මහා විද්‍යාලයක් බවට පත්කිරිමත් එම විදුහල සමස්ත ලංකා එල්ලේ සූරතාව දිනාගැනීමත් ඇලතුර කනිෂ්ඨ විද්‍යාලයේ සේවා කාලයේ දෙමහල් ගොඩනැගිලි තැනීමත් විශේෂ සිදුවීම් ලෙස සැලකිය හැකිය.

2014 පෙබරවාරි 17 දින අනූවියට පා තැබූ එතුමා දැනට තරමක අසනීප ගතියෙන් ප්‍රතිකාර ලබමින් සිටින අතර සේවා කාලය තුළදී ලබාදුන් දීමනා වලට දෙව් තුති පුදමින් පසුවේ.

**කේ. ජෝසප් පෙරේරා**
**නිවන්දම**

**ඔබ දැන් ...** 1 පිටුවෙන්

සා. පීතර බැසිලිකාවේ ඉදිරිපෙළ කාදිනල් හිම්පාණන් සමඟ සුදුවතින් සැරසී විශ්‍රාමික සසුන් පියා අසුන් ගෙන සිටියේ ය. නව කාදිනල් හිම්පාණන්ට "බිරෙට්ටා" නම් වන හිස් වැසුම දානය කරන අවස්ථාවේ දී අයිවරි කෝස්ට් රාජ්‍යයේ අබිජාන් අගරදගුරු අති උතුම් ජීන් පියරේ කට්වා හිම්පාණන් සිටි රෝද පුටුව කරා පැමිණ අදාළ ආයිත්තම් ප්‍රදානය කිරීමට අති උතුම් ප්‍රැන්සිස් සසුන් පියා යුහුසුළු විය.

මෙවර කාදිනල්වර ප්‍රදානයේ දී ලොව දිළිඳුම රාජ්‍යයන් වන හයිටි, අයිවරි කෝස්ට් හා බුකිනාෆාසෝ වලින් නව කාදිනල් හිම්පාණන් තෝරා ගැනීම දිළිඳු හඬ වතිකානයට කැඳවා ගැනීමක් ලෙස විචාරකයෝ හඳුන්වා දුන්හ.

**පාසල් නොමැතිව ...** 1 පිටුවෙන්

තම දූ දරුවන්ට පාසලක් අහිමි වී ඇතැයි දෙමාපියෝ චෝදනා කරති.

මේ තත්ත්වය සඳහා පාසල් ගුරු දෙගුරු සමිති, සංවර්ධන සමිති ආදියේ හිතුවක්කාර හා අමනෝඥ ක්‍රියා පිළිවෙත් ද හේතුකාරක වී ඇති බව දැනගන්නට තිබේ. ආර්ථික වශයෙන් ඇති හැකි අයට ජාත්‍යන්තර පාසල් හෝ ඇතත් මධ්‍යම පාංතික හා දිළිඳු පවුල්වල දූ දරුවන්ට මේ තත්ත්වයට මුහුණ පාන්නට සිදුවී ඇති බව කියැවේ.

## පමුණුගම විද්වතුන්ගේ සංගමයෙන්

# වෘත්තීය උපදේශන වැඩමුළුවක්



පමුණුගම විද්වතුන්ගේ සංගමය මඟින් අ.පො.ස. සාමාන්‍ය පෙළ හා උසස් පෙළ නිම කළ දරු දැරියන්ගේ ඉදිරි දිවි මඟ සඳහා වෘත්තීය උපදේශන වැඩමුළුවක් පසුගියදා පමුණුගම ගොන්සාල්වෙස් මහා විද්‍යාලීය ශ්‍රවනාගාරයේ දී පැවැත්විය.

එහිදී සංගමයේ සභාපති දිවයිනටම සාම විනිසුරු දේශමාන්‍ය දොස්තර විරාජ් පෙරමුණ මහතා සභාව ඇමතීය. මෙම වැඩමුළුව සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ භෞතික විද්‍යා අංශයේ මහාචාර්ය බාලෝ දයා, කැළණිය විශ්ව විද්‍යාලයේ ආචාර්ය ජුලියන් නානායක්කාර, මහාචාර්ය ජේ. ඒ. කරුණාරත්න, නාවික ප්‍රධාන ඉංජිනේරු මාස්ටර් ක්‍රිස්ටි ජයමාන්න, වෛද්‍ය රෝෂිනි පෙරේරා මහත්මිය, වරලත් ගණකාධිකාරි ලීල් කරුණාරත්න හා ජ්‍යෙෂ්ඨ නීතිඥ හිටපු විදුහල්පති බී. කේ. එම්. එස්. රුද්‍රිගු මහතා ද සහභාගි විය. **(සටහන - ජෝ. සංගපාලආරච්චි, සේයා - බෙන්ජමින් කිරිහෙට්ටි)**

# දහම් සේවියකුගේ නික්මයාම



වෙන්නප්පුව ශු. පවුලේ කන්‍යාරාමය, හලාවත කන්‍යාරාමය ඇතුළු විදුහල් ගණනාවක විදුහල්පති පැවිදි සොයුරිය ලෙස නොමැකෙන සේවාවක් කළ ගරු විජිතා පැවිදි සොයුරියගේ දයාබර පියාණන් වූ කේ. ඩී. ඇල්බට් (කටානෙ) මහතා පසුගියදා දිවියෙන් සමුගත්තේ ය.

ඒ මහතා හලාවත ක්‍රිස්තු සේවා මධ්‍යස්ථානය ඇතුළු ගරු පියවරුන් රැසකගේ සේවා සැපයුම සඳහා දායක වූ අඟුණවිල වන්නිමඩු දෙව්මැඳුරේ ප්‍රගතියට විශාල සේවාවක් කළ අයෙකි. ඔහුගේ අවසන් කටයුතු හලාවත රදගුරු හිම්පාණන්, ගරු පියවරුන්, පැවිදි සොයුරියන්, පාසල් දූ දරුවන් ඇතුළු විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් සිදුකෙරිණි. ඒ මහතාගේ ආත්මයට සදා මොක් සුව පතමු. **(පීටර් කැමිලස් සුබසිංහ)**

**මාවත් දරුවාවත් ...** 6 පිටුවෙන්

දරු පැටියකුට හරි ආසයි. පළමු හේතුව මත බයකුත් තිබුණා නිරෝගී දරුවකු නොලැබෙන බව වෛද්‍ය මතය වූ නිසා. එහෙත් සියල්ල කළ හැක්කේ දෙවියන් වහන්සේට පමණයි යන්න සිතේ තබාගෙන මාබෝලේ සුව මෙහෙයට සහභාගි වුණා. අපි පදිංචි එඬේරමුල්ලේ සා. සෙබස්තියන් මුනිඳුගේ දෙව්මැඳුරට අයත් ප්‍රදේශයෙයි. අප සුව මෙහෙයට සහභාගි වෙද්දී ඒ අවස්ථාවේ දරුවන් නැති අම්මලා 5 දෙනකුට දරුවන් ලැබෙන බව කිව්වා. මාත් එය අයිති කරගත්තා. එලෙසම මගේ කුසෙහි දරුවකු පිළිසිඳ ගත්තා. දෙවියන් වහන්සේ තමයි මේ දරුවා දෙන්නේ කියා බලයක් සිතට ගත්තා.

අධික රුධිර පීඩනයත්, වෛද්‍ය මතයත් නිතරම බයත්, දුකත් ඇති කළා. ද සොයිසා කාන්තා රෝහලේ තමයි මාස 9 න් වැඩි හරියක් සිටියේ. ගමේ සායනයටත් සොයිසා කාන්තා රෝහලේ සායනයටත් මා සහභාගි වුණා. මා නිතරම අසනීපයෙන් අධික රුධිර පීඩනයෙන් බැවින් නිතරම දෙවියන් වහන්සේට යාච්ඤා කළා නිරෝගී දරුවකු ලබා දෙන්න කියා. දෙව්මවිටත් නිතරම ජපමාලය භාවනා කළා. ජේසුත් එක්ක මා ළඟ ඉන්න මගේ ඇඳ ළඟම ඉන්න මාවත් දරුවත් බේරගන්න කියලා.

2010 අවුරුද්දෙ ජනවාරි 30 දා නිරෝගී දරු සම්පතක්, නිරෝගී දියණියක් මට ලැබුණා. මෙය ඉතා බලසම්පන්න ප්‍රාතිහාර්යයක්. දෙවි මව්ගෙන් මම ඉල්ලූ ආකාරයට මට ලැබුණා. දොස්තර මහත්මයා ලක්ෂණ බබෙක් කියලා ගෙදර ගෙනියන්න කිව්වා. ජේසු සමිඳුනි ඔබවහන්සේට ස්තූති වේවා. ප්‍රශංසා වේවා. මහිමය වේවා. සදාසරණ දේව මෑණියනි අප වෙනුවෙන් දෙවිඳුන් ඉදිරියෙහි මැදහත්වූවාට ස්තූතියි. මගේ දියණිය දැන් පෙරපාසල් යනවා. ලස්සන හුරුබුහුටි චූටි දියණියක් දුන් දෙවි පියාණන්ට ස්තූති වේවා!

**ධර්මදානීය සභා ...** 12 පිටුවෙන්

මෙම සංඛ්‍යාව සංකේතාත්මක අංකයකි. එනම් ජුදා ගෝත්‍ර 12 සහ ක්‍රිස්තුන් වහන්සේගේ අපෝස්තුළුවරුන් 12 සහ දේව ජනතාව වේ. මෙම දේව ජනතාව ලෙස ගණනය කර ඇත්තේ එළිදරව් ග්‍රන්ථයේ 7 -9, 12 යන වගන්ති හි ඇති ජගත් මහා පිරිස යන වගන්ති තුළිනි. එහි ඇති පූර්ණත්වය සංකේතවත් කරන අංක 10 x 3 යන්න ගණනය කොට ලෝකාවසානයේ ගැළවීම ලබන ප්‍රමාණය ප්‍රකාශ කොට ඇත. එනම් 12 x 12 x 10 x 10 x 10 = 144000 ලෙස පෙන්වා දේ.

7. මරිය තුමිය සදාතනික කන්‍යාවක් නොවේ.
8. කතෝලිකයන් රූප වන්දනාව පවත්වති.
9. ක්‍රිස්තුන් වහන්සේට සහෝදර සහෝදරියන් සිටී.
10. මරිය මවුන්ගේ පරලොවට වැඩම කිරීම මිත්‍යාවක්.
11. ජේදුරු තුමා සභා නායකයා නොවේ. එම නිසා ඔහුගේ අනුප්‍රාප්තිකයන් ද නායකයන් නොවේ.
12. 666 අංකයෙන් පෙන්වා දෙන්නේ ශුද්ධෝත්තම පියතුමා ය. එළිදරව් ග්‍රන්ථයේ 13 - 11, 18 හි මෙම අංකය සඳහන් එහි අර්ථයෙන් මෙම දුර්මතය ගොඩනැගී ඇත. **(තවත් කොටසක් ලබන සතියේ)**

## සියැළි හඬ වෙබ් රේඩියෝවේ තාරුණ්‍යයේ හඬ වැඩසටහන ඉතා අගෙයි!

අගරදගුරු පදවි ජනසන්නිවේදන කේන්ද්‍රය මඟින් ප්‍රචාරය කරන "සියැළි හඬ" වෙබ් රේඩියෝව ඔස්සේ විකාශය වූ "තාරුණ්‍යයේ හඬ" වැඩසටහන පසුගියදා ශ්‍රවණය කිරීමේ අවස්ථාව මට ද උදාවිය.

යොවුන් වියේ සිතුම් පැතුම්, දෙමාපිය, වැඩිහිටි, ගුරුවර වගකීම්, යොවුන් වියේ යුතුකම් හා වගකීම්, වත්මන් තාක්ෂණික මෙවලම් භාවිතය, විශේෂයෙන් ෆේස් බුක්, ජංගම දුරකථන, අන්තර්ජාලය භාවිතයන් පිළිබඳව, සිය අත්දැකීම් තුළින් ඉතා හරවත් ලෙස යොවුන් සිතුම් පැතුම් හඳුනා ගනිමින් මෙම වැඩසටහන ඉදිරිපත් කරනු ලැබුවේ ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා ය. මෙම වැඩසටහන මෙහෙය වූ නිවේදක මාලන් ඩේවිඩ් මහතා ඉතා මැනවින් තම නිවේදන කටයුතු සිදු කිරීම මෙම වැඩසටහන සාර්ථක වීමට මහත් රුකුලක් වූ අතර "සියැළි හඬ" වෙබ් රේඩියෝව ඔස්සේ සෑම සතියකම විකාශය වන මෙම "තාරුණ්‍යයේ හඬ" වැඩසටහන ඉතා වැදගත් කාලෝචිත වැඩසටහනකි.


**(ශානක මුහන්දිරම්)**

## මූලධර්මවාදීන්ගේ රැස්වීම්වලට එරෙහිවන්න

මූලධර්මවාදින් ශුද්ධවූ සභාව භේද බින්න කිරීමේ කූට ක්‍රම උපයෝගී කරගනිමින් ව්‍යාජ දේශන මාලාවක් මීගමුවේ ක්‍රියාත්මක කිරීමට එරෙහිව ගත යුතු ක්‍රියා මාර්ගය පිළිබඳව මීසමේ දේවස්ථානවල සභා නියෝජිතයන් සමඟ පල්ලන්සේන මීසම් සේවක ගරු ජයන්ත නිමල් පියතුමා සාකච්ඡාවක් පැවැත්විය.

සැබෑ විශ්වාසය, කිතුනුවන් තුළ පළුදු නොවී පවත්වා ගැනීම පිණිස පල්ලන්සේන, දළුවකොටුව, පළඟතුරය සහ තෝප්පුව යන මීසම්වල ඒකාබද්ධ ක්‍රියා මාර්ග ඒ ඒ මීසම් සේවක පියතුමන්ගේ මූලිකත්වයෙන් සමිති සමාගම්, තරුණ සමිති මඟින් ආරම්භ කැරේ. මූලධර්මවාදීන්ගේ වැඩපිළිවෙලට විරෝධය දක්වමින් අත්සන් සහිත සන්දේශයක් පොලිස් දෙපාර්තමේන්තුවට හා රාජ්‍ය ආරක්ෂක අංශයන් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමටත් පෝස්ටර් ව්‍යාපාරයක් දියත් කිරීමටත් කටයුතු කැරේ. **(මෙල්වින් ද කොස්තා)**

## මීසම් සේවයට අපේ උපහාර



**ගරු ජස්ටින් වර්ණකුල පියතුමෙනි,**

| | |
|---|---|
| පියෙනි ඔබ පියෙක් විය අපේ මුළු | මීසමට |
| පියෙනි ඔබ පියෙක් විය අපේ ජීවිත | වලට |
| තුති කුසුම් පුද කරමු මෙතෙක් කළ | මෙහෙවරට |
| ඔබ අපේ හදවතේ නතර විය | සත්තකට |

**දුම්මලදෙණිය මීසම් ජනතාව**

### Mother ශ්‍රී ලංකා ව්‍යාපෘතියෙන්

## සා. ලෝරන්ස් විදුහලට රන් සම්මානයක්



ජනාධිපති ලේකම් කාර්යාලයේ "Mother ශ්‍රී ලංකා භාරය" මඟින් සංවිධානය කරන ලද Project Run ව්‍යාපෘතියේ හොඳම ව්‍යාපෘති අතර රැඳෙමින් පසුගියදා ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා අතින් සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගනයේ දී රන් සම්මානයෙන් පිදුම් ලැබූහ.

දිනෙන් දින දියුණු වන කොළඹ නගරයේ අලංකාරවන වෙරළ පරිසරය සුරැකි බව ප්‍රදේශවාසින් දැනුම්වත් කිරීම, පෝස්ටර් පත්‍රිකා බෙදා හැරීම, එම ප්‍රදේශයට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් සඳහා නිදහස් සුව විඳීමට සුදුසු ලෙස අලංකාර කිරීම පාසල් සිසු දැතින්ම සිදුවේ. ගරු විදුහල්පතිනි චන්ද්‍රිකා පෙරේරා පැවිදි සොයුරියගේ මූලිකත්වයෙන් ගුරු සිසු දෙමාපිය ප්‍රජා දායකත්වයෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර "අපෙන් රට නැගුමට" අපේ දායකත්වය ලබා දීම මෙහි ප්‍රධාන පරමාර්ථය විය. **(ජසින්තා වික්‍රමසිංහ)**

## මෙරිල් විජේසිංහ පිය අනුස්මරණ ක්‍රිකට් තරගාවලිය

ස්වර්ගස්ථ වූ ගරු මෙරිල් විජේසිංහ පිය අනුස්මරණ වාර්ෂික ක්‍රිකට් තරගාවලිය පසුගියදා කළුතර නාගොඩ ලුවිස් සිල්වා ක්‍රීඩාංගනයේ දී පැවැත්විණ.

ගරු නිර්මාල් මාලක සිල්වා පියතුමාගේ අදහසක් වූ මෙය මීසම තුළ එකමුතුකම හා සුහදතාවය නංවාලීමේ අරමුණින් සංවිධානය කරන ලදි.

**(රංජිත් නෝනිස්)**



කඳාන ද මැසිනොද් විදුහලේ ප්‍රාථමික අංශයේ 2014 වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උත්සවය විදුහලේ ආදි ශිෂ්‍ය මාරවිල මූලික රෝහලේ වෛද්‍ය අධිකාරි දිමුත් පමින්ත පොන්වීර මහතාගේ ප්‍රධානත්වයෙන් ඉකුත් දා විදුහල් ක්‍රීඩාංගනයේ දී පැවැත්විය. විදුහල්පති ගරු බර්ට්‍රම් පෙරේරා සහෝදරතුමන් විසින් වෛද්‍ය අධිකාරිතුමන් පිළිගෙන කැඳවාගෙන පැමිණි අයුරු සේයාරුවෙන් දැක්වේ. **(ඇන්ටන් ජයසූරිය)**

## මරිය වසර වෙනුවෙන් බඩල්ගම මීසමේ වැඩසටහන් රැසක්

බඩල්ගම මීසමට අයත් වරාදල, මැල්ලවගෙදර, මෙස්ලන්ඩ්, බඩල්ගම, කෙහෙල් ඇල්ල, ගොඩිගමුව යන සභාවන් හයේම කතෝලික පවුල් 700 ක් පමණ සිටිති.

මරිය වසර වෙනුවෙන් පියතුමන් නිවෙස්වලට ගොස් මරිය තුමියට නිවෙස් කැප කරනු ලබන අතර අර්ධ රාත්‍රික මෙහෙයන් ද පවත්වනු ලබයි. ඒ සඳහා ජපමාල පන්ති 15 උච්චාරණය කිරීම, ආගමික චිත්‍රපට පෙන්වීම හා මධ්‍යම රාත්‍රියේ දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය සමඟ දිව්‍ය පූජාව ඇතුළත් වේ. මෙය මීසම් සේවක ගරු ඇන්ටන් රංජිත් පියතුමා විසින් මෙහෙයවන අතර මෙම වැඩසටහන සඳහා දොන් බොස්කෝ දෙව්සත්හලේ උප අදියුරු ගරු රොෂාන් මිරැන්ඩා පියතුමා සහ බඩල්ගම නේවාසික ගරු ජූඩ් ටෙනිසන් පියතුමන්ගේ සහයෝගයද උපරිමයෙන් ලැබේ. මෙවන් වැඩසටහනකට දායකත්වය දෙනු ලබන ගරු පියතුමන්ට මීසම් ජනතාවගේ හෘදයාංගම ස්තුතිය පුද කැරේ. **(කේ. අබේසේකර)**

කාරුණික දැනුම් දීමයි

**pradeepaya @yahoo.com සහ pradeepaya @sltnet.lk ඊ මේල් ලිපිනයන් ප්‍රදීපය පුවත්පත් ලිපි එවීම සඳහා පමණක් භාවිත කරන්න.**

## 23 වන ජන්ම දිනය සිහිකිරීම

ආදරණීය අයියේ,

ඔබ දිවියේ 23 වන වසර
ගත කරන්නට
අප සමඟ ඔබ නොසිටියත්
දුක් නොවන්නෙමු ඔබ
දෙවිඳුන්ගේ ආදරය
අත්දකින නිසා
හදිසියේ ඔබ අප අතරින්
වෙන් වුවත් ඔබ මතකයන් අප
හදවත් තුළ සදා ජීවමානයි.



මත්තුමගල
**කනුෂ්ක රකේෂ් ජයසූරිය**

උපත - 1991. 03. 05
සග සැපත - 2013. 10. 28

**ආදරයෙන් සිහිපත් කරන්නේ අම්මා, අක්කා, මල්ලී ඇතුළු පවුලේ සැම.**



# ප්‍රදීපය

## මංගල යෝජනා

### මනාලයෝ

වයඹ, කතෝලික, අවු. 33, උස 5' 10", දේපල හිමි ව්‍යාපාරික පුතුට දියණියක දෙමව්පියෝ සොයති. දු.අ. 071-4416764. සවස 7.00 න් පසු අමතන්න. අංක **N6437**, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

### මනාලියෝ

මීගමුවට නුදුරු, 76 උපන්, උස 5', **BSC** හා **IT** සමත්, පරිගණක ඉංජිනේරු, කොළඹ සේවය කරන දියණියට සුදුසු සහකරුවකු දෙමව්පියෝ සොයති. අංග සම්පූර්ණ නිවසක් සහ ඉඩමක් ඇතුළු තවත් වත්කම් හිමිය. **e-mail: jadmdon1946@gmail.com** අංක **NG6459**, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

## මංගල යෝජනාත් වෙබ් අඩවියේ...

**"ඥානාර්ථ ප්‍රදීපය" හා "Messenger" පුවත්පත් වල පළවන මංගල යෝජනා ඔබගේ කැමැත්ත පරිදි www.colombocatholicpress.com වෙබ් අඩවියේ ද පල කළ හැකිය.**

**වැඩි විස්තර සඳහා දැන්වීම් අංශය විමසන්න.**

